කම්කරු අමාත්‍යාංශය



# 2020

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2020

වැය ශීර්ෂ අංක 193

**කම්කරු අමාත්‍යාංශය**

# අන්තර්ගතය

**පළමු පරිච්ඡේදය**
ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය **1**
- 1.1 හැඳින්වීම 2
- 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 2
- 1.3 ප්‍රධාන කාර්යයන් 3
- 1.4 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අංශ 3
- 1.5 සංවිධාන සටහන 4

**දෙවන පරිච්ඡේදය**
ප්‍රගතිය හා ඉදිරි දැක්ම **5**
- 2.1 අමාත්‍යාංශයේ ප්‍රගතිය 6
- 2.2 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ප්‍රගතිය 13
  - 2.2.1 කම්කරු දෙපාර්තමේන්තුව 13
  - 2.2.2 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 36
  - 2.2.3 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය 39
  - 2.2.4 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය 42
  - 2.2.5 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය 45
- 2.3 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 50

**තුන්වන පරිච්ඡේදය**
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය **59**
- 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 60
- 3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 61
- 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 62
- 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 63
- 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 63
- 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 63
- 3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 64
- 3.8 මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 64
- 3.9 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව 65

**සිව්වන පරිච්ඡේදය**
කාර්යසාධන දර්ශක **79**
- 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 80

**පස්වන පරිච්ඡේදය**
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **81**
- 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 82
- 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 84

**සයවන පරිච්ඡේදය**
මානව සම්පත් පැතිකඩ **85**
- 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 86
- 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 87
- 6.3 මානව සම්පත් සංවර්ධනය 87

**සත්වන පරිච්ඡේදය**
අනුකූලතා වාර්තාව 93
- 7.1 අනුකූලතා වාර්තාව 94

# වගු නාමාවලිය


| | | |
|---|---|---|
| වගුව 2-1 | සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය | 8 |
| වගුව 2-2 | අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය | 11 |
| වගුව 2-3 | මානව සම්පත් සංවර්ධන අංශය විසින් සිදු කරනු ලැබූ කාර්යයන් - 2020 | 15 |
| වගුව 2-4 | 2020 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි | 16 |
| වගුව 2-5 | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත 2019 වසරට සාපේක්ෂව 2020 වර්ෂය | 17 |
| වගුව 2-6 | ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2020 | 19 |
| වගුව 2-7 | සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් - 2020 | 19 |
| වගුව 2-8 | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩමුළු | 21 |
| වගුව 2-9 | රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2020 | 22 |
| වගුව 2-10 | ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2020 | 25 |
| වගුව 2-11 | අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණ ප්‍රගතිය - 2020 | 26 |
| වගුව 2-12 | අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2020 | 27 |
| වගුව 2-13 | සියලුම දිස්ත්‍රික් කාර්යාල මඟින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2020 | 27 |
| වගුව 2-14 | ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය | 28 |
| වගුව 2-15 | 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය | 29 |
| වගුව 2-16 | දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් | 32 |
| වගුව 2-17 | බාහිර පුහුණු ආයතනයන්හි පුහුණු සඳහා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත ප්‍රතිපාදන ලබාදීම - 2020 | 32 |
| වගුව 2-18 | ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2020.12.31 දිනට සමස්ත වියදම | 32 |
| වගුව 2-19 | වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2020 | 33 |
| වගුව 2-20 | ජා. වෘ. සු. හා සෞ. ආයතනයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය -2020 | 39 |
| වගුව 2-21 | ජා. වෘ. සු. හා සෞ. ආයතනය විසින් සිදු කරන ලද පාරිසරික සමීක්ෂණ ප්‍රමාණය | 40 |
| වගුව 2-22 | කම්කරු වන්දි ගෙවීමේ ප්‍රගතිය | 43 |
| වගුව 2-23 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය ප්‍රගතිය | 44 |
| වගුව 2-24 | පිරිවෙන් කළමනාකරණ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය | 47 |
| වගුව 2-25 | ප්‍රාදේශීය මට්ටමින් ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා ලබා දී ඇති ඉලක්ක | 49 |
| වගුව 2-26 | පැවති සහ යෝජිත උපරිම වන්දි සීමාවන් | 53 |
| වගුව 3-1 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 63 |
| වගුව 3-2 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 63 |
| වගුව 3-3 | වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 64 |
| වගුව 3-4 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 64 |
| වගුව 4-1 | අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක | 80 |
| වගුව 5-1 | අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු | 82 |
| වගුව 6-1 | අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය | 86 |
| වගුව 6-2 | දේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වය | 87 |
| වගුව 6-3 | විදේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වය | 90 |
| වගුව 7-1 | අනුකූලතා වාර්තාව | 94 |

# ප්‍රස්තාර


ප්‍රස්තාරය 2-1 අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය 12

ප්‍රස්තාරය 2-2 කාලීන පරීක්ෂණ - 2019 වර්ෂයේ ප්‍රගතියට සාපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රගතිය 15

ප්‍රස්තාරය 2-3 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් 16

ප්‍රස්තාරය 2-4 සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම - 2020 17

ප්‍රස්තාරය 2-5 පසුගිය වර්ෂ පහ තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 30

ප්‍රස්තාරය 2-6 කම්කරු පරීක්ෂණයන්හි ගුණාත්මකභාවය - 2018, 2019 සහ 2020 වර්ෂ 30

ප්‍රස්තාරය 2-7 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගත වූ කාලය - 2017 සිට 2020 වර්ෂය දක්වා 31

ප්‍රස්තාරය 2-8 ජා. ශ්‍ර .අ. ආයතනයේ පුහුණු කටයුතුවල දළ ආදායම 36

ප්‍රස්තාරය 2-9 ජා. ශ්‍ර. අ. ආයතනය විසින් සිදු කරන ලද වැඩසටහන් අනුව පුහුණු වැඩසටහන්වල දළ ආදායම 37

ප්‍රස්තාරය 2-10 ජා. ශ්‍ර .අ. ආයතනයේ විභාග කටයුතුවල දළ ආදායම 37

ප්‍රස්තාරය 2-11 වාර්තා වූ මාරක අනතුරු ප්‍රමාණය 43

ප්‍රස්තාරය 2-12 වාර්තා වූ මාරක නොවන අනතුරු ප්‍රමාණය 43

ප්‍රස්තාරය 2-13 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වියදම් ප්‍රගතිය 45

ප්‍රස්තාරය 2-14 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රාග්ධන වියදම් ප්‍රගතිය 45


# රූපසටහන්


රූපසටහන් 1-1 අමාත්‍යාංශයේ සංවිධාන සටහන 4

# ඡායාරූප


ඡායාරූපය 2-1 ජාතික කම්කරු උපදේශක සභා රැස්වීම් අවස්ථාවක් 13

ඡායාරූපය 2-2 බේරුම්කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා නවක බේරුම්කරුවන් පත් කිරීම 18

ඡායාරූපය 2-3 සුරක්ෂිතතා අත් පොත් ගරු අමාත්‍යතුමා වෙත ලබා දීම 20

ඡායාරූපය 2-4 ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධව ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම 23

ඡායාරූපය 2-5 ළමා ශ්‍රමය පිටු දැකීමට බාලදක්ෂිකාවන්ගේ සහාය ලබා ගැනීම 35

ඡායාරූපය 2-6 පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීමේ කටයුතු සංවිධානය 38

ඡායාරූපය 2-7 හෝමාගම මූලික රෝහල සඳහා පෞද්ගලික ආරක්ෂණ උපාංග පරිත්‍යාග කිරීම 41

ඡායාරූපය 2-8 අනුබද්ධිත ආයතනවල නිලධාරීන් සමඟ සාකච්ඡාව 42

ඡායාරූපය 2-9 අනතුරට පත් කම්කරුවන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම 44

ඡායාරූපය 2-10 පිරිවෙන් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන 46

ඡායාරූපය 2-11 අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා වැඩසටහන් පැවැත්වීම 49

ඡායාරූපය 3-1 නිපුණ විදේශ රැකියා බලකායක් ඇතිකිරීම සඳහා මූලික සාකච්ඡා 64

ඡායාරූපය 5-1 ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිත හමුව 84

*"සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහාත් යම් සේවකයෙකු සේවයට බඳවාගෙන දින 30ක් ඇතුලත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අනිවාර්ය කෙරෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ. එසේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ නිරතුරුව සාකච්ඡා කරමින් ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්ට හා ප්‍රමිතීන්ට අනුව කම්කරු අයිතිවාසිකම් අරක්ෂා කර වැඩබිම්වල සේවක සුරක්ෂිතතාව ඇති කිරීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන දැනටමත් ඉදිරිපත් කොට ඇත."*

රටේ ජීවනාලිය බඳු වූ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සේවා සුරක්ෂිතතාව තහවුරු කිරීම කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයකි. තවද, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් සිය "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම හා නිපුණ විදේශ ශ්‍රමික බලකායක් ඇති කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ වූ කාර්යයන් සුවිශේෂි ප්‍රමුඛතා ලෙස හඳුනා ගනිමින් වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ඵලදායිතාවය හා සුභසාධනය ඉහළ නැංවීමටත් වැඩ කරන ජනතාවගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීමටත් කටයුතු කිරීමේ වගකීම කම්කරු අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය යන ආයතන වෙත පවරා ඇත. ඒ අනුව, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය පදනම් කර ගනිමින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් රාශියකි.

ඒ යටතේ කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කෙරෙන සේ අනාගත අභියෝග යන්ට සාර්ථකව මුහුණදීමට හැකි වන ලෙස වර්තමානයට ගැලපෙන පරිදි යල්පැන ගිය කම්කරු අණ පනත් සංශෝධනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. තවද, රට තුළට ආයෝජන ගලා ඒමට හිතකර පරිසරයක් ඇති කිරීමට යෝග්‍ය වන පරිදි කම්කරු නීති හා අණපනත් හි පවත්නා සංකීර්ණතා ඉවත් කරමින් සංගතභාවය ආරක්ෂා වන පරිදි සරල කිරීම තුළින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බවත්, මෙහිදී කම්කරු ජනතාවට ලැබෙන ප්‍රතිලාභ කිසිසේත් කප්පාදු නොකොට වඩාත් ශක්තිමත් කිරීමට කටයුතු කර අති බවත් සතුටින් ප්‍රකාශ කරමි.

තවද, කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ පෞද්ගලික අංශයේ ව්‍යාපාර ප්‍රජාව හා කර්මාන්තකරුවන් වෙත සිය ව්‍යාපාර හා කර්මාන්ත බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ අතර විශේෂයෙන් සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාවය තහවුරු කරලීම සඳහා සුවිශේෂි වූ ගිවිසුම් හා ක්‍රියාවලියන් රාශියක් ඉදිරිපත් කොට සහන යෝජනා ක්‍රියාත්මක කර ඒ තුළින් කාර්මික සාමය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

පසු ගිය අයවැය ලේඛනය තුළින් තේ හා රබර් කර්මාන්තයන්හි යෙදෙන කම්කරු ජනතාවට ලබා දීමට පොරොන්දු වූ රුපියල් 1,000/- අවම දෛනික වැටුප අභියෝග රාශියකට මුහුණ දෙමින් පඩිපාලක සභා තීරණ තුළින් ලබා දීමට හැකි වීම සුවිශේෂී ජයග්‍රහණයකි. ජාතික අවම

# ගරු කම්කරු අමාත්‍යතුමාගේ පණිවුඩය

**නිමල් සිරිපාල ද සිල්වා (පා.ම)**
කම්කරු අමාත්‍ය



වැටුප රුපියල් 12,500/- දක්වා ඉහළ නැංවීමට කටයුතු කර ඇති අතර සියලුම පඩිපාලක සභාවන් කැඳවා ඉදිරි මාස 03 තුළ සෑම පඩිපාලක සභාවකම අවම වැටුප ඉහළ දැමීම සඳහා පියවර ගැනීමට සැලසුම් කර ඇත.

සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ දී ලබා දෙන වන්දිය ගණනය කරනු ලබන වන්දි සූත්‍රයේ උපරිම සීමාව රුපියල් ලක්ෂ 12.5 සිට රුපියල් ලක්ෂ 25 දක්වා වැඩි කිරීමත්, රැකියාවක දී සිදුවන අනතුරක් හේතුවෙන් ශාරීරික හානි හෝ බෙලහීනතාවයට පත්වන හෝ ජීවිතක්ෂයට පත්වන පුද්ගලයන්ට ලබාදෙන වන්දි මුදල රුපියල් ලක්ෂ 5.5 සිට රුපියල් ලක්ෂ 20 දක්වා ඉහළ නැංවීමත් නව රජය බලයට පත්වීමෙන් පසු සිදුකර ඇත.

සේවක අර්ථසාධක අරමුදල් නොගෙවා පැහැර හරින හාම්පුතුන්ට පවරන ලද නඩු සඳහා කඩිනම් තීන්දු තීරණ ලබා ගැනීම සඳහා ඒවා විසඳීමේ බලය කම්කරු විනිශ්චය සභා වෙත ලබාදීම සඳහාත් කම්කරු වන්දි පිළිබඳ ආරවුල් නිරාකරණය කර ගැනීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් හා කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීම සඳහා වූ විශේෂ විධිවිධාන පනත් දෙකක් පාර්ලිමේන්තුව මඟින් සම්මත කිරීමට කටයුතු යොදා ඇත. කම්කරු විනිශ්චය සභාවල පවරන ලද නඩු සඳහා නීතිඥයන් නොවන කම්කරු නියෝජිතයන් හට පෙනී සිටීමට හැකි වන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමටත් විනය පරීක්ෂණ මාස 06කේ ඇතුලත පවත්වා විනය නියෝග ලබා දීම කඩිනම් කර දීමටත් අවශ්‍ය නීති සම්පාදනය කොට ඇත. එසේම, පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අවම විශ්‍රාම වයස අවුරුදු 60ක් ලෙස නීතිගත කිරීමට දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබේ.

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම සඳහාත් යම් සේවකයෙකු සේවයට බඳවාගෙන දින 30ක් ඇතුලත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අනිවාර්ය කෙරෙන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමට පියවර ගනු ලැබේ. එසේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ නිරතුරුව සාකච්ඡා කරමින් ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්ට හා ප්‍රමිතීන්ට අනුව කම්කරු අයිතිවාසිකම් අරක්ෂා කර වැඩබිම්වල සේවක සුරක්ෂිතතාව ඇති කිරීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන දැනටමත් ඉදිරිපත් කොට ඇත. වයස අවුරුදු 16ට අඩු ළමයින් සේවයේ යොදවා ගැනීමට නොහැකි වන ලෙස නෛතික ප්‍රතිපාදන දැනටමත් සම්මත කර ඇති අතර වයස අවුරුදු 18ට අඩු ළමුන් අන්තරාදායක රැකියාවන්හි සේවයේ යෙදවිය නොහැකි බවට නියෝග පැනවීමට කටයුතු කර ඇත.

විදේශ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම පහසු වන පරිදි සේවක

අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා ද සෞඛ්‍ය සුරක්ෂිතතාවය හා සේවක සුභසාධනය පිළිබඳ නව පනතක් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට ඉතා ඉක්මනින් සම්මත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

වැඩබිම්වල විශේෂයෙන් කාන්තාවන්ගේ සුරක්ෂිතතාවය හා ඔවුනගේ ගෞරවය සුරැකෙන පරිදි රැකියාවන්හි යෙදීමේ පසුබිමක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය මඟින් සම්මත කර ගන්නා ලද අංක 190 - වැඩ ලොව තුළ ප්‍රචණ්ඩත්වය සහ හිංසනය තුරන් කිරීම සම්බන්ධයෙන් වූ සම්මුතිය පිළිගනිමින් ඒ අනුව අවශ්‍ය නීති සම්පාදනය දැනටමත් කරගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට මෙන්ම විදේශ විනිමය සංචිතය ශක්තිමත් කිරීම සඳහා කැපවන මිලියනයක් (මිලියන 01ක්) පමණ වූ විගමනික ශ්‍රමිකයන් වෙත අපගේ කෘතවේදීත්වය පළ කිරීම මෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ අනාගතය ශක්තිමත් කිරීම සඳහා සාධනීය පියවර ගත යුතුව ඇත. තැරැව්කරුවන්ගේ හා ඇතැම් ඒජන්සිකරුවන්ගේ නොයෙකුත් අක්‍රමිකතාවයන්ට ගොදුරු වීමට විගමනික ශ්‍රමිකයන්ට ඉඩ නොතබන අයුරින් අවශ්‍ය නීති රීති පද්ධතීන් ක්‍රියාත්මක කිරීමත් ඔවුන් වෙනුවෙන් ශක්තිමත් රක්ෂණ ක්‍රමයක් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කර දීම සඳහා අප අමාත්‍යාංශය දැනටමත් මූලික පියවර ගෙන ඇත.



තවද, ලංකා ට්‍රැක්ටර් (ලිමිටඩ්) සමාගම වසා දැමීම හේතුවෙන් එහි සේවය කළ සේවකයින් 122 දෙනෙකුගේ රැකියා අහිමි වී ඇති අතර ඔවුනට හිමි වන්දි මුදල වසර 18කට අධික කාලයක් තිස්සේ නොලැබීම මඟින් ඔවුන් දැඩි ආර්ථික හා සාමාජීය වශයෙන් ගැටළු රාශියකට මුහුණ පා තිබූ වාතාවරණයක සිය රැකියා අහිමි වීම් මත ලබා දිය යුතුව තිබූ රුපියල් මිලියන 22කට ආසන්න වන්දි මුදල් අදාළ ආයතන සම්බන්ධීකරණය කරගනිමින් ගෙවීමට හැකිවීම අප අමාත්‍යාංශය ලත් භාග්‍යයකි.

මෙම අරමුණු හා ඉලක්ක අත්පත් කර ගැනීම සහ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීමට උරදෙන කම්කරු අමාත්‍යාංශ ලේකම් එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**නීතීඥ නිමල් සිරිපාල ද සිල්වා (පා.ම.)**
කම්කරු අමාත්‍ය



*"කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ප්‍රජාව හා කර්මාන්තකරුවන් හට සිය ව්‍යාපාර හා කර්මාන්ත බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එමඟින් සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාවට ඇතිවූ ගැටළු නිරාකරණය කිරීමේ අරමුණින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩ නැවැත්වූ ආයතනයන්හි සේවකයින්ගේ රැකියා අහිමි නොකර තබා ගැනීම, සෑම සේවකයෙකුටම වැඩ මුර ක්‍රමයක් මත හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතා කරමින් සමානුපාතික ලෙස වැඩ ලැබෙන ආකාරයට මාසිකව සේවයේ යෙදවීම, වැඩ නොමැතිකම හේතුවෙන් සේවකයින් නිවසේ රැඳවීමේදී එම සේවකයින් අවසානයට ලද සම්පූර්ණ වැටුපෙන් 50%ක් හෝ රු. 14,500/-ක මුදල යන දෙකෙන් වඩා වාසිදායක මුදල සේවකයාට වැටුප් වශයෙන් ගෙවීම."*

තාක්ෂණික දැනුමකින් හෙබි ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් බිහි කිරීමේ අරමුණින් කම්කරු අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2020 වර්ෂය තුළ අත්පත් කරගත් කාර්යසාධනය සහ ඉදිරි කාල පරිච්ඡේදයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් පිළිබඳව ඉදිරිපත් කරන මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

ඒ අනුව, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව "පෞද්ගලික අංශයේ සේවක ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ විදේශ රැකියා බලකායක් බිහිකිරීම" යන ක්ෂේත්‍රයන් යටතේ වූ කාර්යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා, තිරසර සංවර්ධන ඉලක්ක සහ ශ්‍රී ලංකාව එකඟත්වය පළ කර ඇති ජාත්‍යන්තර කම්කරු සම්මුතීන්ට අනුකූලව අප අමාත්‍යාංශයේ ඉදිරි වැඩසටහන් සකස් කර ඇත.

වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම මෙන්ම ඔවුන්ගේ සේවා සුරක්ෂිතභාවය සලසා දීම අප අමාත්‍යාංශය සතු ප්‍රධාන වගකීමකි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා වර්තමාන හා අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට හැකිවන පරිදි කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් වර්තමානයට ගැලපෙන පරිදි අදාළ අණ පනත් සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. තවද, රට තුළට ආයෝජන ගලා ඒමට හිතකර පරිසරයක් ඇති කිරීමට යෝග්‍ය වන පරිදි කම්කරු නීති, අණපනත්හි පවත්නා සංකීර්ණතා ඉවත් කරමින් සහ සංගතභාවය ආරක්ෂා වන පරිදි සරල කිරීම තුළින් සියලු පාර්ශවයනට ප්‍රතිලාභ ලැබෙන පරිදි නීති, අණපනත් සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

ඒ අනුව, වැඩ කරන ජනතාවගේ සේවා සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා ගෙන ඇති පියවරයන් අතර;

- රැකියාවන්හි යොදවා ගැනීමේ අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම තුළින් ළමුන් සඳහා අනිවාර්ය අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකම සුරක්ෂිත කිරීම. ඒ අනුව, වයස අවුරුදු 16ට අඩු ළමයින් සේවයේ යොදවා ගැනීමට නොහැකි වන ලෙස නෛතික ප්‍රතිපාදන සංශෝධනය කිරීම

- කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේදී සහන සැලසීම සඳහා ලබා දෙන වන්දි මුදල ගණනය කිරීමේදී පනවා තිබූ උපරිම වන්දි මුදල් සීමාව ලක්ෂ 12.5 සිට ලක්ෂ 25 දක්වා වැඩි කිරීම

- ජාතික අවම වේතනය රු. 10,000/- සිට රු. 12,500/- දක්වා ඉහළ නැංවීම

- විනය පරීක්ෂණ හෝ වැඩ තහනමට ලක් වන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ විනය පරීක්ෂණ මාස 06ක් ඇතුළත පවත්වා විනය නියෝග ලබා දීම කඩිනම්

# අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය

**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**
ලේකම්



කිරීමට හැකි වන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම

- කාර්මික ආරවුල් පනත සහ කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත යටතේ ලබා දෙන තීන්දුවලට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් අයදුම්පත් ගොනු කිරීමේදී ඇප මුදල් තැන්පත් කළ යුතු බවට නීති ප්‍රතිපාදනයන් හඳුන්වා දීම

- සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන යටතේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු රුපියල් බිලියන 12ක් පමණ වන හිඟ අර්ථසාධක දායක මුදල් අයකර ගැනීම හා කම්කරු නඩු විමසීම කඩිනම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ හා කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීමට නව විශේෂ විධිවිධාන පනතක් ගෙන ඒම

- රැකියාවේදී සිදුවන අනතුරක් හේතුවෙන් ශාරීරික හානි හෝ බෙලහීනතාවයට පත්වන හෝ ජීවිතක්ෂයට පත්වන පුද්ගලයන්ට ලබා දෙන වන්දි මුදල රුපියල් ලක්ෂ 5.5 සිට රුපියල් ලක්ෂ 20 දක්වා වැඩි කිරීම

- පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා අවම විශ්‍රාම වයස අවුරුදු 60 ලෙස නීතිගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

- වතු කම්කරුවන් සඳහා රු. 1,000/-ක අවම දෛනික වැටුපක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

- කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ප්‍රජාව හා කර්මාන්තකරුවන් හට සිය ව්‍යාපාර හා කර්මාන්ත බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එමඟින් සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාවට ඇතිවූ ගැටළු නිරාකරණය කිරීමේ අරමුණින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වැඩ නැවැත්වූ ආයතනයන්හි සේවකයින්ගේ රැකියා අහිමි නොකර තබා ගැනීම, සෑම සේවකයෙකුටම වැඩ මුර ක්‍රමයක් මත හෝ වෙනත් සුදුසු ක්‍රමයක් භාවිතා කරමින් සමානුපාතික ලෙස වැඩ ලැබෙන ආකාරයට මාසිකව සේවයේ යෙදවීම, වැඩ නොමැතිකම හේතුවෙන් සේවකයින් නිවසේ රැඳවීමේදී එම සේවකයින් අවසානයට ලද සම්පූර්ණ වැටුපෙන් 50%ක් හෝ රු. 14,500/-ක මුදල යන දෙකෙන් වඩා වාසිදායක මුදල සේවකයාට වැටුප් වශයෙන් ගෙවීම සහ එම ගෙවන වැටුප සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම යන සහන යෝජනා ඉදිරිපත් කර ඒවා ක්‍රියාත්මක කර කාර්මික සාමය පවත්වා ගෙන යාමට කටයුතු කිරීම

- ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් සැකසීම උනන්දු කිරීම උදෙසා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් නියම කරමින් වෘත්තීය සුරක්ෂිතතාව, සේවක සෞඛ්‍ය හා සුභසාධනය පිළිබඳ නව පනතක් හඳුන්වා දීම

- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට මාසිකව දායක මුදල් තම ගිණුමෙහි තැන්පත් වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම

- වයස අවුරුදු 18ට අඩු තැනැත්තන් සේවයේ යෙදවීය නොහැකි වන සේ අන්තරාදායක රැකියා නියෝග පැනවීම

- විදේශ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම පහසු කරවන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම

- කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු විනිශ්චය සභාවල පවරන නඩු සඳහා නීතිඥ නොවන කම්කරු නියෝජිතයන්ට පෙනී සිටීමට හැකි වන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම

- යම් සේවකයෙකු සේවයට බඳවාගෙන දින 30ක් ඇතුලත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු බවට වූ නීති ප්‍රතිපාදන ගෙන ඒම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම

- කම්කරු වන්දි පිළිබඳ ආරවුල් නිරාකරණ කටයුතු කඩිනම් කිරීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීම

- ලංකා ට්‍රැක්ටර් ලිමිටඩ් සමාගමේ සේවකයින් 122 දෙනෙකු හට වසර 18ක් තිස්සේ නොගෙවා තිබූ රුපියල් මිලියන 22කට ආසන්න වන්දි මුදලක් ගෙවීමට කටයුතු කිරීම

මීට අමතරව ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්වලට ගරු කරමින් සුනිසි මෙහෙවර සංකල්පය මඟින් යහපත් වැඩ පරිසරයක් සහ යහපත් සේව්‍ය හා සේවක සම්බන්ධතාවයක් ගොඩනැගීමේ අරමුණින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවයේම සහභාගිත්වය ඇතිව කම්කරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම හා කාර්මික සාමය පවත්වා ගෙන යාම සඳහා ජාතික කම්කරු උපදේශක සභාව නියමිත පරිදි පැවැත්වීම හා සියලු පාර්ශවයන් සමඟ නිරන්තර සංවාදයන්ට එළඹීම, ළමා ශ්‍රමය පිටු දැකීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වැඩ කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. තවද, සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබාදීම ඇතුළු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සේවා සැපයීමේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමේ හා සියලුම සේවාවන් එකම ස්ථානයකින් ලබා දීම සඳහා මූලික වැඩ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. එසේම, මෙම අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් කම්කරු ප්‍රජාවගේ අයිතීන්, සුභසාධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය නඟා සිටුවීමේ වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඵලදායිතා සංකල්පය තුළින් පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ ආයතනයන් බල ගැන්වීම ද සිදු කරනු ලබයි.

ඉහත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නායකත්වය, මඟපෙන්වීම හා අනුශාසකත්වය ලබා දුන් කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිඳුන් වෙත අප අමාත්‍යාංශයේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනු ලබන අතර කම්කරු අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ටත්, අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවල ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**
ලේකම්







# පළමු පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# කම්කරු අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

කම්කරු නීති ප්‍රඥප්ති ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සමඟ සබඳතා පවත්වා ගනිමින්, කම්කරු ප්‍රජා ආරක්ෂණය, සුබසාධනය සිදුකිරීම හා කාර්මික සාමය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම කම්කරු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. 2020.10.06 දිනැති අංක 2196/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වෘත්තීමය ආරක්ෂාව ඇති කිරීම සහ නිපුණ ශ්‍රම බලකායක් විදේශ රැකියා වෙළඳපොළ සඳහා බිහිකිරීම පිණිස රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම සිදුකිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව කම්කරු විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කාර්යය වන අතර අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි විෂයන්, කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මඟින් අමාත්‍යාංශයේ දැක්ම සාක්ෂාත් කරගැනීමට කටයුතු කරනු ලැබිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි වේ.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අමාත්‍යාංශයේ අරමුණු**

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීමය ආරක්ෂාව ශක්තිමත් කිරීම හා වෘත්තීමය නීති, අයිතිවාසිකම් තහවුරු කිරීම
- කම්කරු නීති රීති හා පටිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම
- වැඩ කරන ජනතාවගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම

යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් (Thrust Areas) ඔස්සේ කටයුතු කරනු ලබයි.

- කාර්මික සාමය හා සංහිඳියාව
- කම්කරු ප්‍රමිතීන් සහ නිති රීති ක්‍රියාත්මක කිරීම
- කාන්තා ශ්‍රමිකයින් සුරැකීම හා ළමා ශ්‍රමය පිටුදැකීම
- වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය
- සමාජ ආරක්ෂණය
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධාන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම පිණිස ක්‍රමවේද සකසා එහි කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය නියාමනය කිරීම
6. කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු
7. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම
8. කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ආයතනයන් අධීක්ෂණය

### ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණපනත්

1. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත
2. 1935 අංක 14 දරණ වෘත්තීය සමිති ආඥා පනත
3. 1939 අංක 32 දරණ ප්‍රසූතිකාධාර ආඥා පනත
4. 1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥා පනත
5. 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත
6. 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත
7. 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලීය සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
8. 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත
9. 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත
10. 1971 අංක 45 දරණ කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීම (විශේෂ විධිවිධාන) පනත
11. 1979 අංක 32 දරණ සේවක මණ්ඩල පනත
12. 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත
13. 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත
14. 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත
15. 2016 අංක 03 දරණ සේවකයින්ගේ ජාතික අවම වේතන පනත
16. 2016 අංක 04 දරණ අයවැය සහන දීමනා පනත

## 1.4 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අංශ


### 1.4.1 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

i. පාලන හා ආයතන අංශය
ii. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
iii. කම්කරු හා විදේශ සබඳතා අංශය
iv. මුදල් අංශය
v. අභ්‍යන්තර විගණන අංශය

### 1.4.2 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i. කම්කරු දෙපාර්තමේන්තුව
ii. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
iii. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය
iv. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය
v. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

## 1.5 සංවිධාන සටහන




**රූප සටහන 1-1 අමාත්‍යාංශයේ සංවිධාන සටහන**



# දෙවන පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 අමාත්‍යාංශයේ ප්‍රගතිය

### 2.1.1 පාලන සහ ආයතන කටයුතු

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මේ යටතේ සිදු වේ. ඒ අනුව,

අ. අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම

ආ. කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් සිදු කළ යුතු ආයතන කටයුතු

ඇ. විදේශ දූත මණ්ඩල රාජකාරි සඳහා කම්කරු නිලධාරින් යෙදවීම ආශ්‍රිත රාජකාරි

ඈ. අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම මෙම ඒකකය මඟින් සිදු කරනු ලබන අතර ඒ යටතේ, පවතින කම්කරු නීතිය යාවත්කාලීන කිරීම හා නව නීති පැනවීම තුළින් කාර්මික සහයෝගිතාව ඇති කිරීමට ප්‍රතිපත්තිමය දායකත්වය සපයයි

ඉ. උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම ද සිදු කරනු ලබයි. ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුවම ලැබෙන මහජන ගැටළු අදාළ අංශ වෙත යොමු කිරීම ද සිදු කරනු ලබයි.

**ඉටු කරන ලද කාර්යභාරය**

අ. 2020 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 32ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 19ක් සඳහා අනුමැතිය ලැබී ඇත

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 205, 206 වැනි නිර්දේශ හා 190 වැනි සම්මුතිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීමේ ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම
- ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් සමාගම වසා දැමීම හේතුවෙන් සේවකයින්ට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා ප්‍රතිපාදන ලබාදීම

- විදේශගතව සේවය කරන ශ්‍රී ලාංකිකයින් සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම

- කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන අර්බුදය හමුවේ පුද්ගලික අංශයේ සේවකයින්ට වැටුප් ගෙවීම

- සේවකයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 16 වන පරිදි අදාළ කම්කරු නීති සංශෝධනය කිරීම ආදිය වේ

ආ. ජූලි වර්ජකයින්ට සහන සැලසීම යටතේ වයස අවු. 65 සම්පූර්ණ වන ජූලි වර්ජකයින් 31ක් වෙනුවෙන් එක් වරක් පමණක් ගෙවන සහන දීමනාව, ගෙවීම් කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත

ඇ. විවිධ ආයතන මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 32ක් සමාලෝචිත කාලය තුළ සහභාගී කරවා ඇත. ලිපි ගොනු කළමණාකරණය, ඵලදායිතා ප්‍රවර්ධනය, තොරතුරු තාක්ෂණය, ආයතන සංග්‍රහය සහ රියදුරු හා කාර්යාල කාර්ය සහයකයින් සඳහා ආකල්ප සංවර්ධනය යන පාඨමාලාවන් සඳහා නිලධාරීන් යොමු කරවා ඇත

ඈ. මහජන පැමිණිලි 321ක් පහත පරිදි සමාලෝචිත කාලය තුළ ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කර ඇත

- ජනාධිපති කාර්යාලය - 67
- අග්‍රාමාත්‍ය කාර්යාලය - 68
- වෙනත් - 186

**එකතුව - 321**

ඉ. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම් 13ක් ලැබී ඇති අතර ඉල්ලීම් 12ක් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත. ඉල්ලීම් එකක් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත

ඊ. අමාත්‍යාංශය මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 6 සහ 7 මහල්වල ස්ථාපිත කිරීමෙන් අනතුරුව, සේවා ඵලදායිතාව හා කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට මෙන්ම, ආයතන පරිසරය වඩාත් ආකර්ෂණීය අයුරින් සකස් කර ගැනීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී

### 2.1.2 සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන කටයුතු

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම ප්‍රධාන කාර්යභාරය වේ.

### ඉටු කරන ලද කාර්යභාරය

අ. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම. ශූන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟාවීම අධීක්ෂණය හා දිරිගැන්වීම

ආ. ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම

ඇ. අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම

ඈ. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම. වර්තමානයේ දී අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා සේවක සඟරාවේ සමාලෝචිත කාලයට අදාළව කාණ්ඩ අංක 71හි පළමු කලාපය නිකුත්

කරන ලද අතර කාණ්ඩ අංක 71හි දෙවන කලාපය සංස්කරණය කෙරෙමින් පවතී

ඉ. මෙම අමාත්‍යාංශය විසින් වාර්ෂිකව කම්කරු ක්ෂේත්‍රයේ විවිධ කාලෝචිත තේමාවන් පාදක කර ගනිමින් විද්වත් කතිකාවතක් සංවිධානය කරන අතර එහි පර්යේෂණාත්මක ලිපි අඩංගු කරමින් ජර්නලයක් ප්‍රකාශයට පත් කරයි. ඒ අනුව, 2020 වර්ෂයේ "කොවිඩ් 19: සේවක ගැටළු සහ ප්‍රතිචාර" යන තේමාව පදනම් කර ගනිමින් පර්යේෂණාත්මක ලිපි කැඳවීම සිදු කර ඒවා කම්කරු විෂය පිළිබඳ හසල දැනුමැති විද්වත් කමිටුවක් විසින් ඇගයීමෙන් අනතුරුව ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. මේ වන විට රටේ පවතින වාතාවරණය හේතුවෙන් මෙවර විද්වත් කතිකාවතක් නොපවත්වා ජර්නලය ප්‍රකාශයට පත් කිරීම පමණක් සිදු කරන ලදී.

ඊ. ජංගම සේවා වැඩසටහන්

"ඔබේ වෘත්තියට අපෙන් අත්වැලක්" ජංගම සේවා වැඩසටහන කම්කරු ජනතාව සහ සේවා යෝජකයන් ඉලක්ක කොට ගෙන හෝමාගම, පාදුක්ක, සීතාවක හා මහරගම ප්‍රදේශ ආවරණය වන පරිදි 2020 පෙබරවාරි 29 හා 2020 මාර්තු 01 දිනයන්වල හෝමාගම ජනාධිපති විද්‍යාලයේ දී පැවැත්විණි. එහිදි සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් ගැටළු විසඳීම, වෘත්තීය පුහුණු අවශ්‍යතා සම්බන්ධ කටයුතු, පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා හා ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දීම, ඵලදායිතා සංකල්පය ප්‍රවර්ධනය කිරීම, ලේ දන්දීමේ වැඩසටහනක් සහ විදේශ රැකියා අවස්ථා හඳුනා ගැනීම ඇතුළු සේවාවන් රැසක් කම්කරු ප්‍රජාව වෙනුවෙන් සිදු කෙරිණි

උ. සුනිසි මෙහෙවර වැඩසටහන

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණ වීමට නම් යහපත් වැඩ පරිසරයක් සහිත රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමඟින් සේවා නියුක්තිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම, සාධාරණත්වය, වෘත්තිමය හා සමාජ ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් 4ක් තුළ ක්‍රියාත්මක වේ

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව
- වැඩබිමෙහි හිමිකම
- සමාජ ආරක්ෂණය
- සමාජ කතිකාවත

මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

- ඵලදායිතා ප්‍රවර්ධනය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 3.5ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2020.12.31 දිනට සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2-1 සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය**

| ආයතනය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 986,285.00 | 986.285.00 | 100% |
| ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 208,100.00 | 208,100.00 | 100% |
| කම්කරු අමාත්‍යාංශය | 2,305,615.00 | 2.305,615.00 | 100% |
| **මුළු එකතුව** | **3,500,000.00** | **3,500,000.00** | **100%** |

### 2.1.3 කම්කරු හා විදේශ සබඳතා

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළ වගකීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

#### ඉටු කරන ලද කාර්යභාරය

අ. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීමේ දී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. 2020 වර්ෂය තුළ රැස්වීම් 8ක් පැවැත්වීම මඟින් පහත ක්‍රියාමාර්ග සිදු කර ඇත

- කම්කරු වන්දි ආඥා පනත යටතේ සේවකයෙකුට මරණයකදී ලබා දෙන වන්දි මුදල වැඩිකිරීම
- තම සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් කම්කරු විනිශ්චය සභා ඉදිරියේ පෙනී සිටීමට වෘත්තීය සමිති නියෝජිතයන්ට අවස්ථාව ලබා දීම
- පස් දින වැඩ සතිය සම්බන්ධ ගැටලු
- කාර්මික ආරවුල් විසඳීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමට කටයුතු කිරීම
- කොවිඩ් - 19 වසංගතය හමුවේ පෞද්ගලික අංශය මුහුණ පා ඇති ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම

ආ. කොවිඩ් - 19 වසංගතය ආරම්භ වීමත් සමඟින් ප්‍රධානතම සමාජ කතිකාවත යාන්ත්‍රණය වන ජාතික කම්කරු උපදේශක සභාවේ අනු කමිටුවක් ලෙස ගරු අමාත්‍යතුමා මුලසුන දරණ **ත්‍රෛපාර්ශවීය කාර්යසාධන බලකායක්** මාර්තු මස 10 වන දින ස්ථාපනය කරන ලදී. කාර්යසාධන බලකායේ කාර්යය වූයේ කොවිඩ් - 19 මඟින් සේවකයන් සහ ආයතන වෙත ඇති වන බලපෑම අවම කිරීම පිණිස පූර්ව ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගැනීමය. ඇඳිරි නීතිය පනවා තිබූ අවස්ථාවන්හි පවා කමිටුව නිරන්තරයෙන් රැස් වූ අතර පාර්ශවකරුවන් අතර වඩා යහපත් අවබෝධයක් ඇති කරලීමට එය සමත් විය. දෙසැම්බර් මස දක්වා කමිටුව රැස්වීම් 20ක් පවත්වන ලදී. විවිධ පාර්ශවකරුවන් අතර විශ්වාසය ගොඩ නැගීමට සහ යම් ගැටළුකාරී තත්ත්වයන් අර්බුද දක්වා උත්සන්න වීමට පෙර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙම කමිටුව බෙහෙවින් ඉවහල් විය. කොවිඩ් - 19 වසංගතය පැතිර යාම හේතුවෙන් වැඩ ලබා දීමට නොහැකි වූ සේවකයන් හට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කාර්යසාධන රැස්වීම්වලදී පහත දැක්වෙන එකඟතාවන්ට එළඹෙන ලදී

- කොවිඩ් - 19 වසංගතයේ බලපෑමට ලක්වන ව්‍යාපාරික ආයතනවල සේවකයින්ගේ රැකියා අහිමි නොකර තබා ගැනීම සඳහා සේවා යෝජකයින් හා සේවකයින් අතර එකඟතාවයන් ඇති කිරීම
- සෞඛ්‍ය ආරක්ෂණ නීතිරීතිවලට අනුකූලව සියලු සේවකයින් එකවර සේවයේ යෙදවීමට නොහැකි අවස්ථාවල සුදුසු ක්‍රමයක් භාවිතා කරමින් සෑම සේවයකයෙකුටම සමානුපාතිකව වැඩ ලැබෙන ආකාරයට සේවායෝජකයින් විසින් සේවකයින්ව මාසිකව සේවයේ යෙදවීම
- වැඩ නොමැතිව නිවසේ රඳවා තැබූ සේවකයින් සඳහා 2020 මැයි සිට සැප්තැම්බර් දක්වා ද, සංචාරක ක්ෂේත්‍රයේ යෙදෙන ව්‍යාපාර හා කොවිඩ් වසංගතයේ බලපෑම හමුවේ මේ වන විටත් සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට නොහැකි අනෙකුත් ක්ෂේත්‍රවල ව්‍යාපාර සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අවසරයට යටත්ව

2020 දෙසැම්බර් දක්වා ද, එම සේවකයා විසින් අවසානයට ලබන ලද මාසයේ මූලික වැටුපෙන් 50%ක් හෝ රු. 14,500/-ක මුදල යන දෙකෙන් වඩා වැඩි මුදලක් සේවකයින්ට ගෙවීම සඳහා සේවායෝජකයින්ව එකඟ කරවා ගැනීම

ඈ. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණ පනත්, ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු ප්‍රවණතාවන් හා අවශ්‍යතාවන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂිත කමිටුවක් වන කම්කරු නීති හා ප්‍රතිපත්තීන් සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශවීය කමිටු රැස්වීම පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම. මෙහිදී පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසිවලට අදාළව දැනට ක්‍රියාත්මක වන අණ පනත්වල විෂමතාවයන් ඉවත් කර ගැනීම සඳහා මෙන්ම දැනට රටේ පවතින අවශ්‍යතාවයට අනුව නම්‍යශිලි සේවා කොන්දේසි හඳුන්වා දීම සඳහා නව සේවා කොන්දේසි ඇතුළත් කර පනතක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී

ඈ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම. 2020 වර්ෂය සඳහා සම්මුතීන් 4ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම සහ ව්‍යවස්ථා අංක 19 යටතේ යැවිය යුතු වාර්තාව සම්පාදනය කිරීම

ඉ. විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි කිරීමට පියවර ගැනීම. 2020 ජනවාරි සිට මාර්තු දක්වා කාල සීමාව තුළ නිලධාරීන් 12ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගි කරවා ඇත. කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ඉතිරි කාලය තුළ විදේශ පුහුණු සිදු නොකරන ලදී

ඊ. EU GSP+ සහනය ලබා ගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP+ බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම සහ සහභාගි වීම

උ. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමාජ ආරක්ෂණ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේ දී ඇති කර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම

ඌ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයෙන් "සුනිසි මෙහෙවර වැඩසටහන" (DWCP) නව මුහුණුවරකින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු සම්පාදනය කිරීම

එ. ළමා ශ්‍රමය පිළිබඳ ජාතික ක්‍රියාකාරී කමිටුවට (NSCCL) අදාළ රැස්වීම් හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම. මෙම කාල පරිච්ඡේදය තුළ රැස්වීම් දෙකක් පවත්වා ඇති අතර එහිදී ළමා ශ්‍රමය පිළිබඳ ජාතික කමිටුවට උපදෙස් හා නිර්දේශ ලබා දීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇත

ඒ. විදේශ කටයුතු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම

ඔ. රජයට පවරාගත් වතු සමාගම්වල සේවකයන්ට අය විය යුතු හිඟ අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාර්තෝෂික මුදල් ගෙවීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තීය සංගම් සාමාජිකයන් සමඟ කාර්තුමය සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම

ඕ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළ සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම

ක. වාර්ෂිකව යැවිය යුතු ශ්‍රම සංඛ්‍යාලේඛන පිළිබඳ ප්‍රශ්නාවලියට පිළිතුරු ජාත්‍යන්තර

කම්කරු සංවිධානය වෙත සැපයීම

ග. තාක්ෂණික සහාය ලබා දීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන් සඳහා වීසා ඉල්ලීම් ලිපි විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම

### 2.1.4 මූල්‍ය කටයුතු

2020 වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**වගුව 2-2 අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය (රු. ,000) | වියදම (රු. ,000) | ඉතිරි ප්‍රතිපාදනය (රු. ,000) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | පුනරාවර්තන | 26,794 | 22,145 | 4,649 | 83 |
| | | මූලධන | 2,900 | 2,866 | 34 | 99 |
| | | **එකතුව** | **29,694** | **25,011** | **4,683** | **84** |
| 1 | 2 | පුනරාවර්තන | 96,070 | 91,654 | 4,416 | 95 |
| | | මූලධන | 6,700 | 6,234 | 466 | 93 |
| | | **එකතුව** | **102,770** | **97,888** | **4,882** | **95** |
| 1 | 7 | පුනරාවර්තන | 469,686 | 436,895 | 32,791 | 93 |
| | | මූලධන | 11,700 | 5,997 | 5,703 | 51 |
| | | **එකතුව** | **481,386** | **442,892** | **34,494** | **92** |
| 2 | 3(2) | පුනරාවර්තන | 5,500 | 5,500 | - | 100 |
| | | මූලධන | 1,600 | 1,600 | - | 100 |
| | | **එකතුව** | **7,100** | **7,100** | **-** | **100** |
| 2 | 3(3) | පුනරාවර්තන | 3,500 | 3,500 | - | 100 |
| | | මූලධන | 600 | 600 | - | 100 |
| | | **එකතුව** | **4,100** | **4,100** | **-** | **100** |
| 2 | 4 | පුනරාවර්තන | 41,750 | 39,101 | 2,649 | 94 |
| | | මූලධන | 700 | 375 | 325 | 54 |
| | | **එකතුව** | **42,450** | **39,476** | **2,974** | **93** |
| 2 | 5 | පුනරාවර්තන | 33,850 | 31,217 | 2,633 | 92 |
| | | මූලධන | 900 | 411 | 489 | 46 |
| | | **එකතුව** | **34,750** | **31,628** | **3,122** | **91** |
| **මුළු එකතුව** | | පුනරාවර්තන | 677,150 | 630,012 | 47,138 | 93 |
| | | මූලධන | 25,100 | 18,084 | 7,016 | 72 |
| | | **එකතුව** | **702,250** | **648,096** | **54,154** | **92** |

### 2.1.5 අභ්‍යන්තර විගණන කටයුතු

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය යන ආයතනයන්හි අදාළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ ද අභ්‍යන්තර විගණන විෂයට අදාළ විෂයපථය වේ.

## ප්‍රධාන කාර්යයන්

අ. ආයතනයන් තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වය සොයා බැලීම

ආ. රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය විසින් සහ මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරනු ලැබ ඇති හා නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා වෙනත් පරිපූරක උපදෙස් පිළිපදිනු ලබන්නේද යන්න සොයා බැලීම

ඇ. කම්කරු අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතට අයත් වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල මෙහෙවර හා අරමුණු, විගණන මූලධර්ම පද්ධතියට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීම

ඈ. අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම්වලට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රියා පටිපාටි, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සම්බන්ධව සහතික කිරීම සඳහා ස්ථාපිත කර ඇති පාලන පද්ධති අගයීමට ලක් කිරීම

ඉ. අමාත්‍යාංශයේ සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ ඇගයීමට ලක් කිරීම

ඊ. වත්කම් ආරක්ෂා කිරීම හා වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම හා සත්‍යාපනය කිරීම

උ. භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශයේ ස්ථාපිත අරමුණුවලට අනුකූලව ලබා ගෙන ඇද්ද යන්න සොයා බැලීම සඳහා ක්‍රියාකාරකම් හෝ වැඩසටහන් ඇගයීමට ලක් කිරීම සහ තොරතුරු පරීක්ෂාව

ඌ. ආයතනයේ එක් එක් අංශ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඇති කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම

එ. විගණන ක්‍රියාවලියෙන් අනතුරුව එහි ප්‍රතිඵල සන්නිවේදනය කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාවලීන් ඉදිරිපත් කිරීම

ඒ. වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම


ඔ. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවිය යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම

ඕ. විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම් කිරීම සහ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

ක. පාලනාධිකාරිය විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂිත රාජකාරි ඉටුකිරීම සහ වාර්තා කිරීම

## ඉටු කරන ලද කාර්යභාරය

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**
**2020.01.01. සිට 2020.12.31 දක්වා**




| | කම්කරු අමාත යාංශය | කම්කරු දොපාර්ත මේන්තුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය |
|---|---|---|---|---|---|---|
| පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 3 | 3 | 3 | 3 | 3 | 3 |
| විගණන විමසුම් සහ වාර්තා ගණන | 6 | 7 | 2 | 0 | 2 | 0 |

**ප්‍රස්තාරය 2-1 අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය**

## 2.2 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ප්‍රගතිය

### 2.2.1 කම්කරු දෙපාර්තමේන්තුව

පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයන්ගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම හා සමාජ ආරක්ෂණය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් කම්කරු විෂයට අදාළ අණ පනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යය සතු යටත් විජිතයක්ව පැවති සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි හා තේ වගාව සඳහා මෙරටට ගෙන්වන ලද ඉන්දීය කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරන ඉන්දියානු ආගමික කම්කරු ආඥා පනත හඳුන්වා දෙන ලදී. එම ආඥා පනත යටතේ පිහිටුවන ලද ඉන්දියානු ආගමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය වේ. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේව්‍ය, සේවක හා රජය යන ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යභාරය ඉටු කරයි.

**දැක්ම**

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල් පවත්නා කාර්මික සාමයක් සහිත රටක්

**මෙහෙවර**

කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අරමුණු**

- අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා ආයතන තුළ ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මඟින් ශ්‍රමිකයාගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම



ඡායාරූපය 2-1 ජාතික කම්කරු උපදේශක සභා රැස්වීම් අවස්ථාවක්

**කාර්යභාරය**

- ආයතනවල සේවා යෝජකයන් හා සේවකයන් අතර කතිකාවත ප්‍රවර්ධනය කිරීම

- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මඟින් කාර්මික ආරවුල් ඇති වීම වැළැක්වීම හා ඇති වූ ආරවුල් නිරවුල් කිරීම

- ඵලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මඟින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම

- සේවක, සේවා යෝජක දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුළින් කාර්මික සාමය තහවුරු කිරීම

- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම

- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය

- කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුළු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම

- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව ශ්‍රමිකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම

- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම

- ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම

**2.2.1.1 ඉටු කරන ලද කාර්යභාරය**

**අ. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම**

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ.

මේ සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් 04 යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

- **සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම**

දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම උදෙසා 2020 වර්ෂයේදී පහත කාර්යයන් ඉටු කරන ලදී

- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සේව්‍ය සේවක දෙපාර්ශවයට කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පහත පරිදි සංවිධානය කොට පැවැත්වීම

| වගුව 2-3 මානව සම්පත් සංවර්ධන අංශය විසින් සිදු කරනු ලැබූ කාර්යයන් - 2020 | | |
|---|---|---|
| | **වැඩසටහන** | **වැඩසටහන් ගණන** |
| 1 | සමාජ කතිකා අංශයෙන් සිදු කළ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහන් | 37 |
| 2 | සමාජ කතිකා අංශයෙන් සිදු කළ අර්ධ රාජ්‍ය ආයතනවල පවත්වන ලද වැඩසටහන් | 06 |
| 3 | ආයතන පරීක්ෂා කිරීම් (Routine) | 424 |
| 4 | ආයතනවල ඉල්ලීම් මත සම්පත්දායකයින් ලබා දී ඇති වැඩසටහන් | 21 |


- සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟලුම් හා වතු අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියක් පැවැත්වීමටත් කටයුතු කරනු ලබයි. 2019 වර්ෂය සඳහා වන මෙම තරඟයේ මූලික කටයුතු සිදු කර තිබූ අතර සම්මාන ප්‍රදානෝත්සවය 2020.01.16 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රදානත්වයෙන් පවත්වන ලදී.

- කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ පැවති තත්වය මත 2020 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කරන වැඩසටහන් සිදු කිරීම සීමා කිරීමට සිදු විය

- **සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සිදු කිරීම**

කාලීන පරීක්ෂණ සිදු කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ වැඩ පියසේදී සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේව්‍ය සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කලාප කම්කරු කාර්යාල 11ක්, ඒ යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40ක් හා උප කම්කරු කාර්යාල 17ක් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ස්ථාපනය කර ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ අංශයන්ද ඇතුළුව 2020.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවය කරන මුළු කම්කරු නිලධරයන් සංඛ්‍යාව 488කි. 2020 වසරේදී කම්කරු නිළධරයන් විසින් සිදු කළ සමස්ත කාලීන පරීක්ෂණ සංඛ්‍යාව 64,708 කි.

**කාලීන පරීක්ෂණ - 2019 වර්ෂයට සපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රගතිය**




**ප්‍රස්තාරය 2-2 කාලීන පරීක්ෂණ - 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රගතිය**

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව අඩු වී ඇත. එයට හේතුව වනුයේ 2020 වර්ෂයේදී පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන් හිදී සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම සහ පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම වේ.

- **ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම**

ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් හා කාර්මික ආරාවුල් ඇති වීමට ඉඩ ඇති අවස්ථා හා වැඩ වර්ජන පිළිබඳ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට, දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල වෙත යොමු කිරීම සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල, කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශ මඟින්ද ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. එම උත්සාහය අසාර්ථක වුවහොත් එම කාර්මික ආරවුල්, විෂයභාර ඇමතිතුමා විසින් බේරුම්කරුවෙකු වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් පහත පරිදි වේ.

**2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්**




**ප්‍රස්තාරය 2-3 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්**

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය තුළ ලැබුණු සහ විසඳූ පැමිණිලි සංඛ්‍යාව සාපේක්ෂව පහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, 2020 වර්ෂය තුළ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2-4 2020 වර්ෂය තුළ කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි**


| කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂය තුළ ලැබුණු පැමිණිලි | | වර්ෂය තුළ ලද පැමිණිලි සංඛ්‍යාවෙන් විසඳූ පැමිණිලි සංඛ්‍යාව | |
|---|---|---|---|
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | එම පැමිණිලි සඳහා අදාළ සේවක සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | එම පැමිණිලි සඳහා අදාළ සේවක සංඛ්‍යාව |
| 2,262 | 8,913 | 1,044 | 4,850 |

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාවේ සුළු වැඩි වීමක් දක්නට ඇත.

**වගුව 2-5 වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2019 වසරට සාපේක්ෂව 2020 වර්ෂය**

| වර්ෂය | සිදුවීම | වතු | ඉදිකිරීම් | නිෂ්පාදන | පතල් කැණීම් | නවාතැන් හා ආහාර සැපයුම් | අර්ධ රාජ්‍ය | වෙනත් සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2019 | වැඩ වර්ජන වාර්තා වීම් | 8 | 1 | 11 | - | - | - | 1 | 21 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 1,952 | 100 | 4,701 | - | - | - | 16 | 6,769 |
| | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 28,218 | 200 | 26,403 | - | - | - | 16 | 54,837 |
| 2020 | වැඩ වර්ජන වාර්තා වීම් | 13 | - | 12 | - | 2 | - | 1 | 28 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 1,936 | - | 4,040 | - | 64 | - | 85 | 6,125 |
| | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 9,375 | - | 12,806 | - | 324 | - | 85 | 22,590 |

කාර්මික ආරාවුල් සමථකරණයේදී සාමූහික ගිවිසුම්වලට එළඹීම මඟින් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාව ද ලැබේ. එසේම, සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ. 2020 වර්ෂය තුළදී ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් 15 ද ඇතුළුව 2020.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 148කි.




**ප්‍රස්තාරය 2-4 සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම - 2020**



ඡායාරූපය 2-2 බේරුම්කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා නවක බේරුම්කරුවන් පත් කිරීම

ප්‍රාදේශීය කම්කරු කාර්යාල මඟින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළද සමථයට පත් කළ නොහැකි ආරාවුල්, බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණයකට යොමු කරනු ලබන අතර 2020 වර්ෂයේ දී අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් 59ක්ද ප්‍රදාන නිකුත් කිරීම් 22ක්ද සිදු කර ඇත.

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය කටයුත්තකි. ඒ අනුව, 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 105කි. 2020.12.31 දිනට ක්‍රියාත්මක වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 1,843කි.

### ආ. විශේෂ විමර්ශන

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව, යම් පැමිණිලි විමර්ශනයක් හෝ යම් ආයතනයක සිදු කරන ලද පරීක්ෂණයක් සිදු වූ ආකාරය පිළිබඳ සෑහීමට පත්නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය කෙරෙනු ලැබේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී කාර්යාලීය හා ස්ථානීය පැමිණිලි පරීක්ෂණ 198ක් සිදු කරන ලද අතර එමඟින් ගණනය කරන ලද සේවක අර්ථසාධක අරමුදල් හිඟ වටිනාකම රු. 5,767,050.00ක් වන අතර ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත දීමනා වටිනාකම රු. 12,055,291.00 වේ. එසේම, අර්ධ රාජ්‍ය ආයතනවලට අදාළ පැමිණිලි පරීක්ෂණ 19ක්ද වර්ෂය තුළදී සිදු කර ඇත.

### ඇ. ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ ක්‍රියාවලියකි. මේ අනුව, 2020 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

| වගුව 2-6 ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2020 | | |
|---|---|---|
| | **වැඩසටහන / ක්‍රියාකාරකම** | **භෞතික ප්‍රගතිය** |
| 1 | කාලය ඉකුත් වීම නිසා නව නියෝජිතයන් පත් කළ පඩි පාලක සභා ගණන | 15 |
| 2 | දින 05 වැඩ සතිය සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 197 |
| 3 | කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා තැනීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ අවම වැටුප් මාසිකව ප්‍රසිද්ධ කිරීම | 10 |
| 4 | සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම | 36 |
| 5 | 2016 අංක 04 දරණ අය වැය සහන දීමනා පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබා දීම | 07 |
| 6 | පඩි පාලක සභා ආඥා පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබාදීම | 24 |
| 7 | සාප්පු හා කාර්යාල පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබාදීම | 14 |
| 8 | පඩි පාලක සභා අඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 23 |
| 9 | පඩි පාලක සභා අඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ දඩ අරමුදල් පිහිටුවීම සහ දඩ අරමුදලින් වියදම් කිරීමට ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 02 |
| 10 | පඩි පාලක සභා සම්බන්ධව විශේෂ නිවාඩු දින හා මැතිවරණ නිවාඩු පුවත්පත් මඟින් දැනුම් දීම | 01 |
| 11 | ශ්‍රම ප්‍රමිති අංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට්, පනත් සංශෝධන සහ රෙගුලාසිවල මෘදු පිටපත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීම | 44 |
| 12 | ආරක්ෂක සේවා ආයතන සඳහා වාර්ෂික බලපත්‍ර අළුත් කිරීමට අදාළ නිෂ්කාශන සහතික නිකුත් කිරීම | 22 |

**ඈ. ශ්‍රමිකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව හා අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම**

- **වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම**
  කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාවන පරිදි සේවා ස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම මෙමඟින් තහවුරු කර ඇත.

- **සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම**

සේවා ස්ථානයක සෞඛ්‍ය ගැටළු / අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා පාරිසරික තත්ත්ව අධීක්ෂණ, ජෛව විද්‍යාත්මක අධීක්ෂණ, ශබ්ද මැනීමේ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2020 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම් හි ප්‍රගතිය පහත පරිදි වේ.

| වගුව 2-7 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් - 2020 | | |
|---|---|---|
| **අ. අ.** | **වැඩසටහන / ක්‍රියාකාරකම** | **සංඛ්‍යාව** |
| 1 | පාරිසරික මිනුම් | 178 |
| 2 | ජෛව විද්‍යාත්මක අධීක්ෂණ | 1,525 |
| 3 | වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 183 |

- **සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**
  සේවා ස්ථානයක සේවකයන්ගේ සෞඛ්‍යමය ආරක්ෂාව පිළිබඳව සේව්‍ය සේවක දෙපාර්ශවයම ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් 137ක් පවත්වා ඇත.

- **වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම**
  වෛද්‍ය හේතු මත සේවක අර්ථසාධක අරමුදලේ අරමුදල් ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල 16ක් පවත්වා තීරණ ලබා දී ඇත.

- **අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම**
  කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන සේවකයන් හට විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය / ශබ්දය මඟින් හෝ වෙනත් කුමන ආකාරයකට ශාරීරික හානියක් හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතින අතර ඒවා අවම කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි.

  ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ඇති අතර ඒවායෙහි සේවයේ නියුතු සුදුසුකම් ලත් ඉංජිනේරුවන් විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්යය ඉටු කරනු ලැබේ.

- **නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම**
  නව කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ අවස්ථාවල දී එම කර්මාන්තශාලා නියමිත ප්‍රමිතීන් අනුගමනය කර තිබේද යන්න පරීක්ෂා කර බලා එසේ නොමැති නම් ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් දීම හා නියමිත ප්‍රමිතීන් හා සම්මතයන් අනුගමනය කර ඇති අවස්ථාවලදී ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. 2020 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සමස්ත කර්මාන්තශාලා සංඛ්‍යාව 31,833කි. මෙම වසර තුළ ලියාපදිංචි කරන ලද නව කර්මාන්තශාලා 738ද එයට ඇතුලත්ය.

- **ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා සහතික කිරීම**
  කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒවා කර්මාන්තශාලා ආඥා පනතට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම හා ඒ බව සහතික කිරීම සිදු කෙරේ. 2020 වර්ෂය තුළදී ගොඩනැගිලි පිඹුරුපත් 106ක් පරීක්ෂා කර සහතික කර ඇත.


**ඡායාරූපය 2-3 සුරක්ෂිතතා අත් පොත් ගරු අමාත්‍යතුමා වෙත ලබා දීම**

- **කර්මාන්තශාලා පරීක්ෂා කිරීම**
  තම කාර්යාල බල ප්‍රදේශය තුළ පවත්නා කර්මාන්තශාලා නිරන්තර පරීක්ෂා කිරීමට ලක් කරන අතර එමඟින් අනතුරු ඇති වීමේ තත්ත්වයන් කල් තබා දැන හඳුනාගෙන අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2020 වසර තුළ කර්මාන්තශාලා 2,130ක ප්‍රමාණයක් පරීක්ෂා කර ඇත.

- **අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය**
  2020 වර්ෂය තුළ මරණීය අනතුරු 71ක් හා මරණීය නොවන අනතුරු 1,116ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, 2020 වර්ෂය තුළදී කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන්ට එරෙහිව නඩු 70ක් දෙපාර්තමේන්තුව විසින් පවරා ඇත.

- **අධිඅන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම**
  කර්මාන්තශාලා ආඥා පනත යටතේ පරීක්ෂාවට භාජනය කර පරීක්ෂණ වාර්තා ලබා ගත යුතු කර්මාන්තශාලාවල භාවිතා කරන හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක, වායු ග්‍රාහක, එසවුම් යන්ත්‍ර, සෝපාන ඇතුළු අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂා කරවීමට කටයුතු කිරීම සිදු කෙරේ. ඒ අනුව, 2020 වර්ෂය තුළදී එවැනි පරීක්ෂණ 9,034ක් සිදු කර ඇත.

- **දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම**
  වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීම් කටයුතුවලදී නීති රීති ක්‍රියාත්මක කිරීම මෙන්ම සේව්‍ය සේවක දෙපාර්ශවයේම දැනුම වර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා 2020 වර්ෂය තුළදී පැවැත්වූ වැඩමුළු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2-8 වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩමුළු - 2020**

| අනු අංකය | අදාළ අංශය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ඉදිකිරීම් | 06 | 850 |
| 02 | ඇඟළුම් | 09 | 600 |
| 03 | වෙනත් | 06 | 350 |
| | **එකතුව** | **21** | **1,800** |

- වෘත්තීය අනතුරු හා ලෙඩ රෝගවලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම සිදු කරයි

- 2020 වර්ෂය තුළදී වාර්තා වූ අනතුරු 237ක් කම්කරු වන්දි කොමසාරිස් වෙත යොමු කර වින්දිතයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට වන්දි ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

- මීට අමතරව වින්දිත පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් 71 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අදාළ තොරතුරු ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කර ඇත

- **ලෝක සුරක්ෂිතතා දින සැමරුම සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය**

සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික සම්මන්ත්‍රණය කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් 2020 වර්ෂයේදී පැවැත්වීමට නොහැකි විය. එම හේතුව නිසාම ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය ද පැවැත්වීමට නොහැකි වූ අතර වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා වන 'අපි යන්නේ කොයි පාරේ' යන වාර්තාමය වැඩසටහන 2020.12.20 දින ප.ව. 7.00 සිට 7.30 ජාතික රූපවාහිනිය

ඔස්සේ විකාශය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. එසේම, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්පොත් 1,900ක් හා අත්පත්‍රිකා හා පෝස්ටර් 19,800ක් මුද්‍රණය කර ඉදිරියේදී බෙදාහැරීමට කටයුතු යොදා ඇත.

**ඉ. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම**

වැඩ බිමෙහි කාන්තා වෘත්තීය හිමිකම් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මඟින් එලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති රීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් වේ.

- **රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

**වගුව 2-9 රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2020**

| අනු.අ. | කාණ්ඩය | සංඛ්‍යාව | ගනු ලැබූ ක්‍රියා මාර්ග |
|---|---|---|---|
| 01 | දෛනික පරීක්ෂණ | 123 | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාලීන පරීක්ෂණ සිදු කිරීම අත් හිටුවා තිබුණි |
| 02 | රාත්‍රී පරීක්ෂණ | 66 | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂයේ පළමු හා සිව්වන කාර්තුවලදී පමණක් සිදු කරන ලදී |
| 03 | ළමා ශ්‍රමය පිළිබඳ පරීක්ෂණ | 132 | පැමිණිලි 104ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. එයින් පැමිණිලි පරීක්ෂණ 06ක දී ළමා ශ්‍රමය යොදා ගැනීම සම්බන්ධව අනාවරණය වී ඇති බැවින් ඒ සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇත |
| 04 | කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ | 23 | පැමිණිලි 06ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී |
| 05 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම | 652 | දිස්ත්‍රික් කාර්යාල මඟින් අනුමැතීන් 631ක් ද උප කාර්යාල මඟින් අනුමැතීන් 21ක් ද වශයෙන් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එසේම, රාත්‍රී වැඩ මුර සඳහා වන ඉල්ලීම් මාර්ගගතව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සේවායෝජකයන්ට අවස්ථාව සලසා දෙන ලදී |
| 06 | අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 58 | ආයතන 290ක් පරීක්ෂා කරන ලද අතර අනතුරුදායක ළමා ශ්‍රමය යොදා ගැනීම සම්බන්ධව වාර්තා නොවීය |
| 07 | කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 124 | ආයතන 607ක් පරීක්ෂා කරන ලදී |

| | | | |
|---|---|---|---|
| 08 | කම්කරු නීතිය පිළිබඳව සිදු කරන ලද දැනුවත් කිරීම් | 02 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි විධායක කාර්ය මණ්ඩලය, කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අවසන් වසර සිසුන්, කාන්තාවන්ට හා ළමයින්ට අදාළ නීතිය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී |

- **අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

  - **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම**

2020 වර්ෂයේ කාන්තා දිනය නිමිති කොටගෙන පෞද්ගලික අංශයේ විවිධ ආයතනයන්හි සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ගේ ප්‍රසූත නිවාඩු ලබා දීම සහ මව් කිරි දීමේ විවේකය නිසි පරිදි ලබා දෙන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සමූහ පරීක්ෂණ මාලාවක් පවත්වන ලදී.

  - **ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම**

ශ්‍රී ලාංකික දරුවන් ළමා ශ්‍රමය සහ අනතුරුදායක ළමා ශ්‍රමයට යොමු වීමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම සිදු කිරීමත්, ළමා ශ්‍රමය තුරන් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමත් අරමුණු කර ගනිමින් 2020 වර්ෂයේ ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම 2020.06.12 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ 10 වන මහළ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

එහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ නිල YouTube චැනලය එළි දැක්වීම සහ සංකේතාත්මකව කම්කරු නීතිය, වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය පිළිබඳ අත්පොත ප්‍රදානය කිරීම සිදු කරන ලදී. එසේම, 2018 සහ 2019 වර්ෂයන්හිදී ප්‍රාදේශීය කම්කරු කාර්යාල වෙත යොමු කරන ලද ළමා ශ්‍රමය පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අප්‍රමාදව හා සාර්ථකව කටයුතු සිදු කරමින් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික වගකීමට සුවිශේෂී දායකත්වයක් දැක් වූ කම්කරු කාර්යාල ලෙස හඳුනා ගත් කළුතර, මහනුවර දකුණ සහ අනුරාධපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ නාඋල උප කම්කරු කාර්යාලය සමරු ඵලක ප්‍රදානය කර අගයන ලදී.

  - **ලෝක ළමා දින සැමරුම**

2020 වර්ෂයේ ලෝක ළමා දිනය සැමරීම සඳහා ධීවර කර්මාන්තය ආශ්‍රිතව සමූහ පරීක්ෂණ මාලාවක් සිදු කරන ලදී. ඒ අනුව, 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දින පහක කාල සීමාවක් තුළදී ජාතික ළමාරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය යන ආයතන ද සමඟ සියලුම බහුදින ධීවර යාත්‍රා, එම යාත්‍රා නැංගුරම්ලා ඇති ධීවර වරායන්හිදී සමූහ පරීක්ෂණයට ලක් කරන ලදී. එසේම, පරීක්ෂණ අතරතුරදී ධීවර ප්‍රජාව සහ අනුබද්ධිත ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ළමා ශ්‍රමය සහ අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳ අත් පත්‍රිකා බෙදා හරින ලද අතර ධීවර වරායන්හි දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීම සඳහා පෝස්ටරයක් ලබා දෙන ලදී.




ඡායාරූපය 2-4 ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධව ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

- **ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව**

2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ප්‍රතිඥා ලබා දී ඇත. ඒ අනුව, ළමා ශ්‍රමය, අනතුරුදායක ළමා ශ්‍රමය දිවයිනෙන් තුරන් කිරීම සඳහා අදාළ සියලු ආයතනයන්හි සාමූහික ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව (NSC) පිහිටුවන ලද්දේ අදාළ පාර්ශවකරුවන් විසින් අදාළ ඉලක්ක සාමූහික ප්‍රයත්නයෙන් සාක්ෂාත් කර ගන්නා බවට සහතික කිරීම සඳහාය.

2020.07.20 දින අදාළ ආයතන නියෝජනය කරමින් නිලධාරීන් 26 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ 04වන මහළ ශ්‍රවණාගාරයේදී ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව පවත්වන ලදී.

එසේම, උක්ත දින පැවති කමිටුවේදී යෝජනා කර ගන්නා ලද පරිදි තාක්ෂණික කමිටුව අදාළ ආයතනවල නිලධාරීන් 11 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2020.12.08 දින කම්කරු දෙපාර්තමේන්තුවේ 04වන මහළ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- **වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මඟින් කාන්තාවන්, තරුණ අය සහ ළමුන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් සිදු කරන ලද කාර්යයන්හිදී දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායකත්වය සපයා ඇත**

පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ වුවද කම්කරු නිලධරයන් රට පුරා පැවති දිස්ත්‍රික් / ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු රැස්වීම් 19ක් සඳහා සහභාගී වූ අතර, එහිදී කමිටු සාමාජිකත්වය "ළමා ශ්‍රමය" පිළිබඳව දැනුවත් කරන ලදී. එසේම, 2021 ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සියලුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරනු ලැබූ අතර 2021 වර්ෂයේ දින දර්ශනයක්ද බෙදා හරින ලදී.

- **අනෙකුත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු**

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශූන්‍යත්වයට පත් කිරීමේ වැඩසටහන - විශේෂ පරීක්ෂා කිරීම් හා වැටලීම් මාලාව

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය සහ අනර්ථකාරී රැකියා අවම කිරීම තුළින් දරු පරපුරට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරිව මුළු දිවයිනම ආවරණය වන පරිදි සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල සම්බන්ධීකරණය කරමින් වැටලීම් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී වර්ෂයේ පළමු කාර්තුව තුළදී වැටලීම් 14ක්ද සිව් වන කාර්තුව තුළ වැටලීම් 44ක්ද සිදු කරන ලදී.

- **පවතින අදාළ නීති පද්ධතිය සංශෝධනය කිරීමේ කටයුතුවල ප්‍රගතිය**

1956 අංක 47 දරණ ස්ත්‍රීන් හා තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ අංක 24 දරණ සංශෝධනය අනුව පනතේ 20 (අ) වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ වයස අවුරුදු 18ට අඩු කිසිවෙකු අනතුරුදායක රැකියාවල හෝ රැකියාවක යෙදවීම තහනම් කොට ඇත. 2018 වර්ෂයේ දී අනතුරුදායක රැකියා ලැයිස්තුව සංශෝධනය කොට වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට හා ආරක්ෂාවට හානිකර රැකියා අවස්ථාවන් හඳුනා ගනිමින් "නව අනතුරුදායක රැකියා රෙගුලාසිය" කෙටුම්පත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර, පළමු කෙටුම්පත සඳහා කම්කරු දෙපාර්තමේන්තු නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට ද දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ළමයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන පනත් 5ක කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## ඊ. ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන ශ්‍රමිකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම

දිවියක් උරුම කර දීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලනය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. 2019.12.31 දිනට මෙම අරමුදලෙහි වටිනාකම රුපියල් මිලියන 2,540,438ක් වන අතර අරමුදලේ සක්‍රිය සාමාජික සංඛ්‍යාව මිලියන 18.9ක් වේ.

- **සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම සේව්‍යයන් අරමුදලේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2020 වර්ෂය තුළ ලියාපදිංචි වූ සේවායෝජක සංඛ්‍යාව 1,453කි. 2020 වර්ෂය තුළ අරමුදල වෙත දායක මුදල් බැර කර ඇති සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව 94,171කි. වර්ෂය තුළ අරමුදලට බැර වූ දායක මුදල රුපියල් මිලියන 125,366.65ක් වේ.

- **සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත මඟින් ආවරණය වන සියලු සේවකයින් වෙත සාමාජික අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම සේවායෝජකගේ වගකීම වන අතර එය අධීක්ෂණය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, 2020 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව 167,352ක් වේ. එසේම, මේ වන විට සක්‍රිය සාමාජික ගිණුම් මිලියන 2.91ක් පවතී.

දායක මුදල් පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ. 2020 වර්ෂයේ දී එවැනි ප්‍රථම නිවේදන 12,232ක් නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 5,065ක මුදලක්ද රතු නිවේදන 9,253ක් නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 3,941ක මුදලක්ද අයකර ගෙන ඇත.

- **සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 35කින් හා උප කම්කරු කාර්යාල 12කින් සහ කලාප කම්කරු කාර්යාල 10කින් සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබාගැනීමේ පහසුකම් සලසා ඇති අතර 2020 වර්ෂය තුළ එසේ ප්‍රතිලාභ ලැබූ සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

**වගුව 2-10 ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2020**

| අ. අ. | කරුණ | 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා තීරණ ලිපි (DL) යැවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත්වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 77,815 | 78,068 |
| 02 | විවාහ හේතු මත සේවයෙන් ඉවත් වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 17,309 | 17,325 |
| 03 | පූර්ණ දුබලතාවයට පත් වීම නිසා සේවයෙන් ඉවත් වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 979 | 992 |
| 04 | මියගිය සාමාජික ප්‍රතිලාභ | 4,137 | 4,457 |
| 05 | 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 18,674 | 19,061 |
| 06 | විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 1,731 | 1.733 |

| | | | |
|---|---|---|---|
| 07 | රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 5,517 | 5,689 |
| 08 | රාජ්‍ය සංස්ථාවක් / මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩු කිරීමට සේවකයන් ඉවත්කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 29 | 27 |

- **අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය**

2020.12.31 දිනට සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 117ක් ලියාපදිංචිව ඇති අතර, සමස්ත සාමාජික සංඛ්‍යාව 186,743කි. එම අරමුදල්වල දායක මුදල් බැර කිරීම, ප්‍රතිලාභ ගෙවීම ඇතුලුව ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් නිසි ලෙස ක්‍රියාත්මක නොවන අරමුදල් කම්කරු කොමසාරිස් ජනරාල් යටතට පවරා ගනු ලැබේ.

**වගුව 2-11 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2020**

| අ. අ. | කරුණ | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 52 |
| 2 | විසඳා ගොනු පියවා ඇති පැමිණිලි සංඛ්‍යාව | 40 |
| 3 | ක්ෂේත්‍ර නිලධරයන් විසින් අධීක්ෂණය කරන ලද පු.අ.අ. සම්බන්ධ වාර්තා සංඛ්‍යාව | 72 |
| 4 | 2020 වර්ෂයේදී අධීක්ෂණය සිදු කොට ඇති ආයතන සංඛ්‍යාව | 72 |

- **සේවක අර්ථසාධක අරමුදල මඟින් සාමාජිකයන් වෙත ලබා දී ඇති ප්‍රතිලාභ**

  - **සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා දීම**
    සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා 75%ක් උපරිමයක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ පහසුකම සලසා ඇත. ඒ අනුව 2020 වර්ෂය තුළ නිවාස ණය අයදුම්පත් 6,591ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනුමැතිය ලබා දී ඇති මුදල රු. බිලියන 3.43කි

  - **සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**
    සේව්‍ය සේවක දෙපාර්ශවය තුළ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව ඇති දැනුවත්භාවය වර්ධනය කිරීම හා ලියාපදිංචිය පුළුල් කිරීමේ අරමුණින් ජංගම සේවා වැඩසටහන් 03ක් රත්ගම, පෝද්දල සහ හෝමාගම යන ප්‍රදේශයන්හිදී පවත්වන ලදී

  - **ප්‍රධාන කාර්යාලය විසින් ලබා දුන් සේවා ප්‍රාදේශීය කාර්යාල දක්වා විමධ්‍යගත කිරීම තුළින් සාමාජිකයන් වෙත පෙරට වැඩි පහසුකම් සලසා ඇත.**

**උ. සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය**

සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේව්‍ය සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය සේවක සහයෝගීතාවය වර්ධනය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

| වගුව 2-12 අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2020 | | | |
|---|---|---|---|
| අ. අ. | අධිකරණය | 2020 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය | 2020 වර්ෂයේදී අවසන් කරන ලද නඩු |
| 1 | ශ්‍රේෂ්ඨාධිකරණය | 114 | 8 |
| 2 | අභියාචනාධිකරණය | 160 | 17 |
| 3 | මහාධිකරණ | 120 | 30 |
| 4 | දිසා අධිකරණ සහ වාණිජ මහාධිකරණ | 216 | 21 |

| වගුව 2-13 සියලුම දිස්ත්‍රික් කාර්යාල මඟින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2020 | | | |
|---|---|---|---|
| අ. අ. | පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | අවසන් නඩු සංඛ්‍යාව |
| 1 | සේවක අර්ථසාධක අරමුදල් පනත | 2,642 | 1,383 |
| 2 | පාරිතෝෂික පනත | 1,047 | 722 |
| 3 | පඩි පාලක සභා ආඥා පනත | 275 | 121 |
| 4 | සාප්පු හා කාර්යාල සේවක පනත | 79 | 12 |
| 5 | කාර්මික ආරවුල් පනත | 26 | 14 |
| 6 | කම්කරු විනිශ්චය සභා නියෝග | 56 | 22 |
| 7 | සේවය අවසන් කිරීමේ පනත | 0 | 1 |
| 8 | ස්ත්‍රීන්, තරුණයන් සහ ළමයින් සේවයේ යෙදවීමේ පනත | 9 | 3 |
| 9 | ප්‍රසූතිකාධාර ආඥා පනත | 0 | 1 |
| 10 | අයවැය සහන දීමනා පනත | 231 | 68 |
| 11 | අනුමත අර්ථසාධක අරමුදල් පනත | 0 | 9 |

## උ෧. පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

- **පරිපාලනය**

දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් මෙහෙයවීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා වාර්ෂිකව සිදු කළ යුතු මානව සම්පත් අවශ්‍යතාව සම්පූර්ණ කිරීම, සේවකයන්ගේ සේවය ස්ථිර කිරීම, කාර්යසාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුළ පැවැත්වීම, ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාවට නැංවීම, විනය පවත්වාගෙන යාම යන කටයුතු සහ දෛනික පාලන කටයුතු 2020 වර්ෂයේදී ද කාර්යක්ෂමව සිදු කරන ලදී. සිරිත් පරිදි සිදු කරන එම කටයුතුවලට අතිරේකව පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2020 වර්ෂයේ දී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදනය සඳහා ස්ලැක් යෙදුම (Slack Application) හඳුන්වා දීම
- කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීම සඳහා දිවයින පුරා සියලු කම්කරු කාර්යාල, දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ සියලු ශාඛාවන්ට සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීම
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා අවශ්‍ය පුද්ගල ආරක්ෂණ උපකරණ නිකුත් කිරීම
- කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ සේවයට වාර්තා කිරීම පිණිස නිලධාරීන්ට සේවා වැඩ මුර ක්‍රමයක් හඳුන්වා දීම

• **ඉදිකිරීම්**

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වෙත පැමිණෙන සේවාලාභීන් හා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත පහසුකම් සැලසීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කෙරේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී පහත කාර්යාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.

**වගුව 2-14 ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය**

| 2020 වසර සඳහා ප්‍රතිපාදනය (රු. මි.) | සැලසුම් කළ ක්‍රියාකාරකම් / ව්‍යාපෘති (ප්‍රධාන) | 2020.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | 2020.12.31 දිනට දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 22 | කුරුණෑගල කම්කරු කාර්යාලය ඉදිකිරීම (ගිනි ආරක්ෂණ පද්ධතිය) | 22 | 20% |
| - | අම්බලන්ගොඩ කම්කරු කාර්යාලය ඉදිකිරීම | - | අදියර II - 95% |
| 53.70 | බදුල්ල කම්කරු කාර්යාලය ඉදිකිරීම | 53.70 | අදියර I - 52% |
| 19.53 | නාඋල කම්කරු කාර්යාලය ඉදිකිරීම | 19.53 | අදියර II - 100% |
| 62 | හැටන් කම්කරු කාර්යාලය ඉදිකිරීම | 62 | අදියර I - 62% |

එසේම, පසුගිය වර්ෂයේදී විවෘත කරන ලද 'මෙහෙවර පියෙස' ගොඩනැගිල්ලෙහි දෙපාර්තමේන්තු අංශයන් ස්ථාපනය කිරීමේ කටයුතු ද 2020 වර්ෂය තුළදී සිදු කරන ලදී.

• **පුස්තකාලය, කෞතුකාගාරය සහ තොරතුරු සේවාව**

සේව්‍ය සේවක ප්‍රජාවගේ අභිවර්ධනයට අදාළව හඳුනාගත් අවශ්‍යතාවයන් හා ගැලපෙන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස් කිරීමටත්, අවශ්‍යතා අනුව එම දැනුම විස්තීරණය කිරීමට මඟ පෑදීමටත්, දෙපාර්තමේන්තු නිලධරයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව දැනුම වර්ධනය කිරීමටත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පුස්තකාලයක් පවත්වාගෙන යනු ලැබේ.

ලිඛිත, මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්ගෙන් සමන්විත පොත් 180,000කට අධික සංඛ්‍යාවක් ඇති මෙම පුස්තකාලය, කම්කරු විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දිවයිනේ ඇති එකම පුස්තකාලය වේ. පුස්තකාලය විසින් පොත් බැහැරදීමේ සේවාව, විමර්ශන සේවාව, ඡායා පිටපත් සේවාව, පුවත්පත් ලිපි එකතුව, පටුන පිටු සේවාව සහ අන්තර් පුස්තකාල පිරුළු සේවාව යන සේවා සපයනු ලැබේ.

2020 වර්ෂයේ දී පුස්තකාලය උදෙසා ග්‍රන්ථ 30ක් ද විදේශීය සඟරා 13ක් මිලදී ගන්නා ලද අතර සමාජිකයන් සඳහා පොත් බැහැර දීම් 2,870ක් සිදු කර ඇත. බාහිර පාඨකයන් 507ක් සඳහා ද විමර්ශන සේවා පහසුකම සපයා ඇත.

කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණ පනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් කෞතුකාගාරයක් ද පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය ආරම්භයේ සිට අද දක්වා විකාශනය වූ අයුරු එම කෞතුකාගාරය මඟින් මැනවින් පිළිබිඹු කරයි.

## එ. මූල්‍ය කළමනාකරණය

2020 වාර්ෂික අයවැය මඟින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව හා ඵලදායීව අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියා කර ඇත.

ඒ අනුව, 2020 වර්ෂයේදී වාර්ෂික අයවැය මඟින් වෙන්කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් 94.6%ක ප්‍රතිශතයක්ද ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් 93.14%ක ප්‍රතිශතයක්ද මේ සඳහා යොදා ගනිමින් මූල්‍ය කලමනාකරණ ඉලක්ක සපුරා ඇත.

| වගුව 2-15 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු) | 2,051,750,000 |
| | වියදම (රු) | 1,941,023,284 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු) | 1,053,800,000 |
| | වියදම (රු) | 981,560,511 |

**ඒ. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය**

- **දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් කරා මෙහෙයවීම**

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම, ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම, කම්කරු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම සැලසුම්, පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්යභාරය වේ.

දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාලවල කාර්යයන් අධීක්ෂණය හා එමඟින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර ප්‍රගතිය පවත්වා ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානව සම්පත් සංවර්ධන කාර්යභාරය වේ.

මෙම අංශයට අනුබද්ධිතව සංඛ්‍යාලේඛන අංශයක් ද කටයුතු කරනු ලබන අතර ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණ පනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සඳහා එම සංඛ්‍යාලේඛන අංශය සංවිධානය වී ඇත.

- **දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාල අධීක්ෂණය**

මේ සඳහා 2018 සහ 2019 වර්ෂයන්හි දී සකස් කරන ලද ක්‍රමවේදය 2020 වර්ෂයේදීද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ප්‍රධාන වශයෙන් පහත අංශ යටතේ දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලයන්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

- කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සහ අධිකරණ කටයුතු
- හිඟ සේවක අර්ථසාධක අරමුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු
- දෙපාර්තමේන්තුව වෙත ලැබෙන කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම පිළිබද පැමිණිලි කාර්යක්ෂමව විසඳීමේ කටයුතු
- කාර්යාලයන්හි පරිපාලන කටයුතු

ඒ අනුව, ඉහත අංශ යටතේ ප්‍රගතිය මැනීම සඳහා, 2020 වර්ෂයේදී ළඟා විය යුතු ඉලක්ක සකස් කරන ලද අතර එම ඉලක්ක ළඟා කර ගත යුතු ආකාරය සහ ඉලක්ක කරා ළඟා විය යුතු කාලය පිළිබඳව කලාප භාර සියලුම නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු කැඳවා උපදෙස් ලබා දෙන ලදී. එසේම, තම කලාපය තුළ ඇති සියලු දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලයන් අදාළ ඉලක්කයන් කරා මෙහෙයවීමේ වගකීම කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු වෙත පවරන ලදී.


2020 වර්ෂය අග භාගය වන විට ළඟා කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

- **කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු**

ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සැලසුම් කිරීම හා අනුමැතිය ලබා ගැනීම, ඒ සඳහා ආයතන තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ආයතන හා එම ආයතන සහකාර කම්කරු කොමසාරිස් විසින් ලබා දීම, ක්ෂේත්‍ර පරීක්ෂණවල ගුණාත්මකභාවය වර්ග කිරීම, කම්කරු නිලධරයන් විසින් වාර්තා නියමිත දිනයන්ට ලබා දීම හා එම වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ද අධීක්ෂණය කරන ලද අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

2016 සිට 2019 දක්වා වූ පසුගිය වර්ෂ හතර තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ක්‍රමිකව වැඩි වී ඇති නමුත් 2020 වර්ෂයේ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන්හිදී සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම සහ පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ පරීක්ෂණ සංඛ්‍යාව පෙර වර්ෂයන්ට සාපේක්ෂව අඩු අගයක් ගෙන ඇත.


**පසුගිය වසර පහ තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව**




**ප්‍රස්තාරය 2-5 පසුගිය වර්ෂ පහ තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව**

පරීක්ෂණ සංඛ්‍යාව අඩු වූ නමුත්, කම්කරු නිලධරයන් විසින් ලබා දී ඇති පරීක්ෂණ වාර්තාවන්හි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේදී, අධීක්ෂණ ක්‍රමවේදය ආරම්භ කළ 2018 වසරට සාපේක්ෂව 2020 වර්ෂයේ වාර්තාවන්හි ගුණාත්මකභාවයේ කැපී පෙනෙන වර්ධනයක් ඇත. ඒ අනුව, ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු A සහ B වාර්තා 2-7 ප්‍රස්තාරය පරිදි 36% සිට 79% දක්වා සාධනීය ලෙස වර්ධනය වී ඇත.

**2018 සිට 2020 දක්වා වූ වර්ෂයන්හි සිදු කරන ලද කම්කරු පරීක්ෂණයන්හි ගුණාත්මකභාවය සන්සන්දනාත්මකව**





**ප්‍රස්තාරය 2-6 කම්කරු පරීක්ෂණයන්හි ගුණාත්මකභාවය - 2018, 2019 සහ 2020 වර්ෂ**

- **හිඟ සේවක අර්ථසාධක අරමුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු**

හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමට නිවේදන යොමු කිරීමට ගතවන කාල සීමා සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ පද්ධතිය ආශ්‍රයෙන් ලබාගෙන විශ්ලේෂණය කිරීමෙන් එක් එක් නිලධාරියා හා කාර්යාලය මට්ටමෙන්, ප්‍රමාදයන්ට හේතු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලදී.

එසේම, හිඟ ගණනය කිරීම් සිදුකර ඇතත් මෙතෙක් නිවේදන යොමුකර නොමැතිවීමට හේතු පරීක්ෂා කර එම හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

එසේම, ප්‍රතිලාභ ගෙවීම සඳහා භාර ගෙන ඇති ගොනු ප්‍රමාණය සහ ඊට ගතවී ඇති කාලය මාසිකව විශ්ලේෂණය කඩිනමින් ප්‍රතිලාභ ගෙවීමට නොහැකි වීමට හේතු හඳුනාගෙන, කාර්යක්ෂමව ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලියක් ඇති කිරීමටත් කටයුතු කරන ලදී.




**ප්‍රස්තාරය 2-7 සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගත වූ කාලය - 2017 සිට 2020 වර්ෂය දක්වා**

ඒ අනුව, 2017 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය අවසාන වන විට දින 07ක් තුළ ප්‍රතිලාභ ගෙවූ ප්‍රතිශතය 21% සිට 47% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ප්‍රතිලාභ ගෙවීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වී ඇත.

- **පෙත්සම් කටයුතු**

ඒ ඒ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය සහ විසඳීමේ කටයුතු ප්‍රමාද වී ඇති ගොනු ප්‍රමාණයන් හඳුනාගෙන ඒවා සඳහා වහාම පියවර ගැනීම සඳහා අදාළ උපදෙස් හා නිර්දේශ ලබාදෙන ලදී.

එසේම, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා කලාප මට්ටමින් නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු විසින් සිය කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එසේම, ප්‍රාදේශීය කම්කරු කාර්යාල භාර නිලධරයන්ගේ 2020 වර්ෂයේ පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම SLACK වැඩසටහන භාවිතයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එසේම, ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ද රැස්වීමක් පවත්වා දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු පිළිබඳව නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

- **මානව සම්පත් සංවර්ධනය**

දෙපාර්තමේන්තු නිලධරයන් වෙත තම කාර්යභාරය පිළිබඳව පවත්නා දැනුම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමට ඇති අවබෝධය වර්ධනය කරමින් දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම උදෙසා නිලධරයන්ගේ ධාරිතා සංවර්ධනය අත්‍යවශ්‍ය ක්‍රියාකාරකමක් වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් පුහුණුව ලබා දීමේ දී නිලධරයන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව අදාළ පුහුණුව ලබා දීම මඟින් ද බාහිර අධ්‍යාපන ආයතන විසින්

පවත්වන පාඨමාලා සඳහා සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මඟින් මෙන්ම විදේශ පුහුණුවීම් සඳහා යොමු කිරීමට අවස්ථා ලද විට ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සම්බන්ධීකරණය සිදු කිරීම මඟින් මෙම පුහුණු කාර්යයන් සිදු කරනු ලැබේ.

**වගුව 2-16 දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2020**

| අ. අ. | වැඩසටහන | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නවක සංවර්ධන නිලධරයන් සහ කළමනාකරණ සහකාර නිලධරයන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 02 | 97 |
| 2 | සේවක අර්ථසාධක අරමුදල් ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩසටහන් | 02 | 68 |
| 3 | බේරුම්කරුවන් සඳහා පුහුණු වැඩමුළුව | 01 | 78 |
| 4 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ මාර්ගගත (Online) පුහුණු වැඩමුළු | 02 | 40 |
| | **එකතුව** | **07** | **283** |

**වගුව 2-17 බාහිර පුහුණු ආයතනයන්හි පුහුණු සඳහා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත ප්‍රතිපාදන ලබා දීම - 2020**

| අ. අ. | වැඩසටහන | ප්‍රතිපාදන ලබා දුන් නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පශ්චාත් උපාධි | 12 |
| 2 | සහතික පත්‍ර පාඨමාලා සහ වැඩමුළු | 10 |
| | **එකතුව** | **22** |

**වගුව 2-18 ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2020.12.31 දිනට සමස්ත වියදම**

| වැය ශීර්ෂය | 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2020.12.31 දිනට වියදම (රු) | 2020.12.31 දිනට ශේෂය (රු) | වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| 221-01-01-2401 | 100,000.00 | 92,725.00 | 7,956.00 | 92.73% |
| 221-02-02-2401 | 200,000.00 | 200,000.00 | 0.00 | 100.00% |
| 221-02-03-2401 | 200,000.00 | 200,000.00 | 0.00 | 100.00% |
| 221-02-04-2401 | 500,000.00 | 492,394.00 | 7,606.00 | 98.48% |
| **එකතුව** | **1,000,000.00** | **985,119.00** | **15,562.00** | **98.51%** |

- **සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම**

සේවාලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම අරමුණු කර ගනිමින් තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවාවන් ලබාදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කර ඇත. මේ වන විට දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් පරිගණක දත්ත පද්ධතිය සමඟ සම්බන්ධ කර ක්‍රියාත්මකව පවතී. එසේම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ, කම්කරු පැමිණිලි සහ නඩු පිළිබඳ දත්ත රැස්කිරීම, ඒ මඟින් ආයතන පරීක්ෂණවල ක්‍රියාකාරී මට්ටම අධ්‍යයනය හා සිදුකළ යුතු වැඩි දියුණු කිරීම් හා කළමනාකරණ තීරණ ගැනීම සඳහා සකස් කරන ලද LISA (Labour Inspection System Application) දත්ත පද්ධතිය 2015 වසරේ සිට ක්‍රියාත්මකව පවතින අතර තව දුරටත් වැඩි දියුණු කිරීම් කළ යුතුව පවතී.

එසේම, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා ස්ලැක් යෙදවුම (Slack Application) 2020 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද අතර මෙමඟින් අභ්‍යන්තර සන්නිවේදන කටයුතු ක්ෂණිකව හා කඩදාසි භාවිතය අවම කරමින් සිදු කිරීමට හැකියාව ලැබී ඇති අතර නිළධරයන් විසින් නිවසේ සිට රාජකාරි ඉටු කරන අවස්ථාවන්හිදී එම කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීමටද හැකියාව ලැබී ඇත.

මේ හැරුණු කොට මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත්, ආකෘති හා කම්කරු අණ පනත්, සේවායෝජකයින් විසින් අවධානය යොමු කළ යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර නිරතුරුව යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, 2020 වසරේදී වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා පහත පරිදි වේ.

**වගුව 2-19 වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2020**

| අ.අ. | යෙදවුම | සේවාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|
| 01 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | බාගත කරගැනීමට හැකිවන පරිදි තොරතුරු පළ කිරීම<br>• සියලු ආකෘති පත්‍ර (ආරක්ෂක සේවා සඳහා නිෂ්කාශන සහතිකය ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රය ආදී)<br>• සංඛ්‍යාලේඛන තොරතුරු (කම්කරු සංඛ්‍යාති, වාර්ෂික රක්ෂා සමීක්ෂණ සංඛ්‍යා, වාර්ෂික වාර්තා, කොවිඩ් - 19 සමීක්ෂණ වාර්තාව 2020 - මැයි ආදී) | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 02 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | වෙබ් අඩවියෙහි ඇතුලත් කර පවතින තොරතුරු යාවත්කාලීන කිරීම<br>• ප්‍රධාන කාර්යාලයේ අංශ මඟින් සපයන සේවා<br>• සියලු කම්කරු කාර්යාලයන්හි ඇමතුම් තොරතුරු | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 03 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | තොරතුරු පළ කිරීම<br>• මාධ්‍ය නිවේදන<br>• විදේශ ශිෂ්‍යත්ව<br>• ලංසු කැඳවීම්<br>• පුහුණු වැඩසටහන්<br>• බඳවාගැනීමේ පරිපාටි<br>• කම්කරු අණපනත් හා අති විශේෂ ගැසට් පත්‍ර<br>• දෙපාර්තමේන්තු චක්‍රලේඛ<br>• දෙපාර්තමේන්තු නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල<br>• සක්‍රිය වෘත්තීය සමිති ලේඛනය<br>• කර්මාන්තශාලා ආඥා පනත යටතේ බලය ලත් පුද්ගලයන් ලෙස පොදුවේ ක්‍රියාත්මක වන කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ඒ වෙනුවෙන් නිකුත් කරන ලද සහතිකය දරණ පුද්ගලයින්ගේ ලැයිස්තුව | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |

| | | | |
|---|---|---|---|
| 04 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | කාර්ය මණ්ඩල දැන්වීම් පළ කිරීම<br>• විවෘත හා සීමිත විභාග තොරතුරු හා ප්‍රතිඵල<br>• කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දැන්වීම් සහ අයදුම් පත්‍ර<br>• ස්ථාන මාරුවීම් තොරතුරු | දෙපාර්තමේන්තු නිලධරයින් |
| 05 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | සේවක අර්ථසාධක අරමුදලේ සජීවී ප්‍රතිලාභ ගෙවීමට අදාළව අයදුම්පත්‍ර භාරදීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ වේලාවක් වෙන්කර ගැනීමට අවස්ථාව ලබා දීම | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 06 | දෙපාර්තමේන්තු වෙබ් අඩවිය | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අයදුම් පත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීමට අවස්ථාව ලබා දීම | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 07 | Slack යෙදවුම | කොවිඩ් - 19 තත්ත්වය නිසා නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පණිවිඩ හුවමාරු මාධ්‍යයක් ලෙසින් Slack යෙදවුම භාවිතා කිරීම | දෙපාර්තමේන්තු නිලධරයින් |
| 08 | Meet වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම | කොවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් නිලධරයන් නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය සාකච්ඡාමය කටයුතු සඳහා පහසුකම් සැලසීම. (වර්ෂය තුළදී වීඩියෝ සම්මන්ත්‍රණ 15ක් සිදු කර ඇත) | දෙපාර්තමේන්තු නිලධරයින් |
| 09 | දෙපාර්තමේන්තු නිල YouTube චැනලය | දෙපාර්තමේන්තු නිල YouTube චැනලයෙහි කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කම්කරු නීති හා අණපනත් පිළිබඳව, දෙපාර්තමේන්තුව සපයනු ලබන සේවාවන් පිළිබඳව, එම සේවාවන් ලබා ගත හැකි කාර්යාල, අවශ්‍ය ලිපි ලේඛන Download කිරීමට අදාළ Link ලේඛන නිවැරදිව සම්පූර්ණ කිරීමට අදාළ උපදෙස්, කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිතව පිහිටුවා ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කෙරෙන වීඩියෝ 18ක් අන්තර්ගත කර ඇත | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |

- **සංඛ්‍යාලේඛන කටයුතු**

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණ පනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය යටතේ ඇති සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී පහත කාර්යයන් සිදු කරන ලදී.

- කම්කරු සංඛ්‍යාති 2018 (වාර්ෂික වාර්තාව) සකස් කර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කමිටු අනුමැතියට ඉදිරිපත් කිරීම

- කම්කරු සංඛ්‍යාති 2019 (වාර්ෂික වාර්තාව) වගු සකස් කර අවසන් කිරීම

- වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2020 සඳහා අදාළ ආයතන වෙත උපලේඛන තැපැල් කර තොරතුරු රැස්කිරීම

- සේවක සඟරාව සඳහා අවශ්‍ය දත්ත ලබා දීම

- සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම සඳහා නිර්මාණය කර ඇති දත්ත පද්ධතිය වෙත දත්ත ඇතුලත් කිරීම

- අදාළ කාල සීමාවන් සඳහා පඩිපාලක සභා අනුව මාසිකව වැටුප් දර්ශකාංක සකස් කර එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම

### ඔ. අභ්‍යන්තර විගණනය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කළ යුතු වේ. ඒ අනුව, එම කටයුතු සම්පත්වල ඉහළ උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේ ද යන්න අධීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වේ. ඒ අනුව, 2020 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- 2020 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් වර්ෂයට අදාළව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ අංශ ද ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන පරීක්ෂණ 07ක් සිදු කරන ලදී

- රජයේ විගණන අංශය මඟින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරීක්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් 12ක් සඳහා පිළිතුරු සපයන ලදී

- වර්ෂය තුළ කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් 03ක් පවත්වන ලදී



ඡායාරූපය 2-5 ළමා ශ්‍රමය පිටු දැකීමට බාලදක්ෂිකාවන්ගේ සහාය ලබා ගැනීම

### 2.2.2 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

#### 2.2.2.1 හැඳින්වීම

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2017 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. මෙම ආයතනය ත්‍රෛපාර්ශවීය හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. කම්කරු අණපනත් නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් වූ ඵලදායී ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙම ආයතනය මඟින් සිදු කරනු ලබයි.

**දැක්ම**
ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සහ සංහිඳියාව


**මෙහෙවර**
අධ්‍යාපනය, පර්යේෂණ සහ පුහුණුව තුළින් ඵලදායී කම්කරු සබඳතා වර්ධනය කිරීම පවත්වා ගෙන යාම පිණිස ත්‍රෛපාර්ශවීය නියෝජනයට පහසුකම් සැපයීම

#### 2.2.2.2 ඉටු කරන ලද කාර්යභාරය

**අ. පුහුණු කටයුතු**


ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් සේවකයින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප පුළුල් කිරීම උදෙසා කම්කරු නීතිය හා කාර්මික සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය යන ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කරයි. මීට අමතරව ශ්‍රම අධ්‍යයනයට අදාළව කෙටිකාලීන පාඨමාලා හා සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වේ.

එමෙන්ම, කම්කරු නීති හා කාර්මික සබඳතා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ 5) ලබා ගැනීම සඳහා ක්‍රියාකාරී විශ්ලේෂණ වැඩමුළු (Functional Analysis Workshops) 09ක් විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමැති සම්පත්දායකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. එමෙන්ම මෙම වර්ෂය තුළදී කම්කරු නීති හා කාර්මික සබඳතා ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ මොඩියුල යාවත්කාලීන කරන ලදී. කොවිඩ් වසංගතයට සමගාමීව සියලුම පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමයට පැවැත්වීම සඳහා කටයුතු සම්පාදනය කළ අතර එමඟින් අඛණ්ඩ ආදායමක් ආයතනයට ලබා ගැනීමට හැකි විය.




**ප්‍රස්තාරය 2-8 ජා. ශ්‍ර. අ. ආයතනයේ පුහුණු කටයුතුවල දළ ආදායම**

**සිදු කරන ලද වැඩසටහන් අනුව පුහුණු වැඩසටහන්වල දළ ආදායම (රුපියල්)**





**ප්‍රස්තාරය 2-9 ජා. ශ්‍ර. අ. ආයතනය විසින් සිදු කරන ලද වැඩසටහන් අනුව පුහුණු වැඩසටහන්වල දළ ආදායම**

### ආ. විභාග කටයුතු

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, රජයට අනුබද්ධිත සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්ට හා පෞද්ගලික අංශයේ ආයතනයන් සඳහා ද ආයතනික අවශ්‍යතාව මත බඳවා ගැනීම් හා කඩඉම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීමේ විභාග පැවැත්වීමේ කාර්යභාරය 2011 වසරේ සිට සිදු කරයි. 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද විවිධ ආයතන වෙනුවෙන් විභාග 21ක් පවත්වා ඇත. මෙම විභාගවල රහස්‍යභාවය ආරක්ෂාකර ගනිමින් සේවාලාභීන්ට කඩිනම් සේවයක් ලබා දීමටත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ක්‍රියා කරයි. 2020.01.01 දින සිට 2020.12.31 දක්වා කාලය තුළ විභාග 21ක් පවත්වා ඇති අතර උපයා ඇති මුළු මුදල රු. මිලියන 3.03කි.

**2020 වර්ෂයේ විභාග කටයුතුවල දළ ආදායම (රුපියල්)**




**ප්‍රස්තාරය 2-10 විභාග කටයුතුවල දළ ආදායම**

### ඇ. පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති කටයුතු

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පර්යේෂණ කටයුතු සඳහා වෙනම අංශයක් ස්ථාපිත කිරීම 2020 ජූලි මස සිදු කරන ලදී.

- **පර්යේෂණ සම්මන්ත්‍රණය**

2020 වර්ෂයේ දී පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු සැලසුම් කර තිබූ අතර පර්යේෂණ සාරාංශ (Abstracts) කැඳවා සමාලෝචනය කර තෝරාගත් පර්යේෂකයන් වෙතින් සම්පූර්ණ පර්යේෂණ වාර්තා කැඳවා ඇත. 2020 වර්ෂයට අදාළ පර්යේෂණ සම්මන්ත්‍රණය වන "Women at Work" පර්යේෂණ සම්මන්ත්‍රණයේ ඉදිරිපත් කිරීම් 2021 මාර්තු 15 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එහිදී අවසානයට තේරී පත් වී තිබූ පර්යේෂණ ලිපි 10ක පර්යේෂකයින් සඳහා මෙම ඉදිරිපත් කිරීමේ අදියර ක්‍රියාත්මක වන අතර, 50කුගේ පමණ සහභාගීත්වයෙන් යුතුව Zoom තාක්ෂණය භාවිතයෙන් මෙම කාර්යය සිදු කිරීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණ ලිපි පොතක් ලෙසත්, ඊ - පොතක් ලෙසත් ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කරමින් පවතී.

- **පුවත් ප්‍රකාශනය** (News Bulletin)

ආයතනයේ ව්‍යාපාර ප්‍රවර්ධනය අරමුණු කොටගෙන මෙම පුවත් ප්‍රකාශය සකස් කරනු ලබයි. මේ තුළින් ඉදිරි වැඩසටහන් පිළිබඳ රාජ්‍ය අර්ධ, රාජ්‍ය හා පුද්ගලික අංශ දැනුවත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙය වසරකට ඊ-පුවත් ප්‍රකාශන 2ක් ලෙස ආයතනයේ වෙබ් අඩවියේ ප්‍රකාශනය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

2020 වසරේ ඩිප්ලෝමා පාඨමාලා නිම කළ සිසුන්ගේ ක්‍රියාකාරී ඉගෙනුම් ව්‍යාපෘතිය (Action Learning Project) ඇසුරෙන් සකස් කිරීමට නියමිත පර්යේෂණ වාර්තාව සඳහා දැනට වැඩිම ලකුණු ලබාගත් සිසුන් ගේ ක්‍රියාකාරී ඉගෙනුම් ව්‍යාපෘති තෝරාගෙන ඇත. ඊට අදාළ පර්යේෂණ ලිපි ලිවීම මේ වන විට සිදුවෙමින් පවතී. තෝරාගනු ලබන ලිපි ආයතනයේ වෙබ් අඩවියේ පළ කිරීමට අපේක්ෂා කෙරේ.



ඡායාරූපය 2-6 පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම

### 2.2.3 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

#### 2.2.3.1 හැඳින්වීම

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීම සඳහා පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

**දැක්ම**

සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුහසාධනය ලබාදීම

**මෙහෙවර**

සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබලගැන්වීම

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්**

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- පරීක්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය
- ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන

#### 2.2.3.2 ඉටු කරන ලද කාර්යභාරය

**අ. 2021.01.01 - 2021.12.31 දින දක්වා ප්‍රධාන වැඩසටහන් හා ඒවායේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**වගුව 2-20 ආයතනයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| අ. අ. | පාඨමාලාව | පැවැත්වූ පාඨමාලා ගණන | සහභාගි වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 02 | 105 | 10.43 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | 65 | 3.02 |
| 03 | ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වූ දින හයක වැඩමුළුව - ඇක්සස් ඉංජිනේරු ආයතනයේ සේවකයින් සඳහා | 01 | 62 | 0.93 |
| 04 | Confine Space එක්දින වැඩමුළුව | 01 | 15 | 0.07 |
| 05 | Safe Handling Hazard Materials එක්දින වැඩමුළුව | 01 | 15 | 0.06 |
| 06 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව * | 01 | 25 | - |
| 07 | Route Cause Analysis එක්දින වැඩසටහන | 01 | 26 | 0.13 |

* - හොල්සිම් සංස්ථා ආයතනය සහ ඇක්සස් ඉංජිනේරු (Access Engineering) යන ආයතනයන් සමඟ සහයෝගීත්වයෙන් දිවයිනේ සාමාන්‍ය පෙළ සමත් සිසුන් 25 දෙනෙකු තෝරා ගෙන ඔවුන් සඳහා මුදල් අයකිරීමකින් තොරව පාඨමාලාවක් සිදු කරන ලදී

පහත වැඩසටහන් 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුනද කොවිඩ් - 19 තත්වය හමුවේ වැඩමුළු පැවැත්වීමට සෞඛ්‍ය අංශවල අවසරය ලැබී නැත.

- ඇඟලුම් ක්ෂේත්‍රය උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබද දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව
- අභ්‍යන්තර වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබද එක් දින වැඩමුළුව
- ISO 14001 ප්‍රමිති පිළිබඳ එක් දින වැඩමුළුව
- සුපරීක්ෂකවරුන් සඳහා වූ එක්දින සුරක්ෂිතතා වැඩමුළුව
- රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ එක් දින වැඩමුළුව
- විදුලි ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දෙදින වැඩමුළුව
- වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් - මාධ්‍යවේදීන්, පාසල් සිසුන් හා වෘත්තීය සමිති සඳහා
- TVEC ආයතනය සඳහා වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මඟින් වැඩ පරිසරය පිළිබඳ මිනුම් හා වාර්තා ලබා දීම සිදුකරනු ලැබේ. එහි දී වැඩ පරිසරයේ ශබ්ද පරීක්ෂාව, ආලෝක තත්ත්වයන්, උෂ්ණත්ව පරීක්ෂාව, දූවිලි අංශු පරීක්ෂාව හා විෂ වායු පරීක්ෂාව සිදු කරනු ලබයි. 2020 වර්ෂයේ දී සිදුකරන ලද පාරිසරික සමීක්ෂණ ප්‍රමාණය පහත පරිදි දැක්විය හැකිය.

**වගුව 2-21 සිදු කරන ලද පාරිසරික සමීක්ෂණ ප්‍රමාණය**

| අනු අංකය | පාරිසරික සමීක්ෂණය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ශබ්දය | 1,591 |
| 2 | ආලෝකය | 2,160 |
| 3 | උෂ්ණත්වය | 1,458 |
| 4 | දුවිල්ල | 1,219 |
| 5 | වාතය (Emission) | 270 |

ආයතනය මෙම ක්‍රියාකාරකම් තුළින් 2020 වර්ෂය තුළ රු. මි. 12.76ක ආදායමක් උපයා ඇති අතර ආයතන 189ක සේවකයින් 103,850ක් ප්‍රතිලාභ ලබා ඇත.

**ආ. වෘත්තීය සුරක්ෂිතතාව නැංවීම සඳහා සුළු කර්මාන්තවල නියුතු ව්‍යාපාරිකයන් ආශ්‍රිත වැඩසටහන**

මෙම වැඩසටහන විශේෂ වැඩසටහනක් ලෙස ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය අධාර සහිතව 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ ආරම්භ කරන ලදී. සුළු කර්මාන්තවල නියුතු ව්‍යවසායකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට හා කොවිඩ් - 19 තත්ත්වය හමුවේ ඔවුන් මුහුණ දී ඇති ආරක්ෂාව සම්බන්ධ ගැටළුකාරී තත්ත්වයන්ට විසඳුම් ලබා දීම හා එම තත්ත්වය යටතේ ඔවුන්ගේ ව්‍යාපාර වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූල්‍යමය අවශ්‍යතාවයන් සොයා බැලීම මෙමඟින් සිදු කරන ලදී.

පළමු අදියර ලෙස කළුතර දිස්ත්‍රික්කයේ පානදුර, බුලත්සිංහල, කළුතර, අලුත්ගම යන නගර ආශ්‍රිතව සුළු කර්මාන්තවල නියුතු ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර ස්ථානවලට ගොස් දැනුවත් කිරීම හා දත්ත රැස් කිරීම සිදු කරන ලදී. සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා අවශ්‍ය විෂබීජ නාශක දියර, අත් සේදුම්කාරක, අත්වැසුම්, මුව ආවරණ, මුහුණු ආවරණ, අත් සෝදන භාජන කට්ටල ආදිය ද කොවිඩ් - 19 වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා පිළිපැදිය යුතු උපදෙස් පත්‍රිකා ද ඒ සම්බන්ධ පෝස්ටර්

ආදිය ද ලබා දෙන ලදී. එසේම, අන්තර්ජාලය (Zoom app) මඟින් හා විද්‍යුත් තැපෑල (Gmail) හා දුරකථන මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

**ඇ. කොවිඩ් - 19 තත්ත්වය හමුවේ සේවා සැපයීම**

- පාසල් සිසුන් හට කොවිඩ් - 19 තත්ත්වය හමුවේ එයින් ආරක්ෂා වීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වන ලදී. මෙහිදි නිවසේ දී මෙන්ම පාසලේ දී කොවිඩ් - 19 තත්ත්වයෙන් ආරක්ෂා විම සම්බන්ධව ඔවුන්ව දැනුවත් කිරීම මෙන්ම සහභාගි වූ සිසුන් හට මුව ආවරණ හා විෂබීජ නාශක ලබා දිම ද සිදු කරන ලදී

- කොවිඩ් - 19 තත්ත්වය හමුවේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යායුතු ආරක්ෂණ පිළිවෙත් සම්බන්ධව දැනුවත් කරමින් මාර්ගෝපදේශ නිකුත් කර ඇත. සියලුම කර්මාන්ත ශාලාවල ඉල්ලීම මත මාර්ගෝපදේශය සිංහල භාෂාවෙන් මුද්‍රණය කර ලබා දී ඇත. සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා පිළිපැදිය යුතු උපදෙස් පත්‍රිකා ද ඒ සම්බන්ධ පෝස්ටර් ආදිය ද ලබා දෙන ලදී

- කර්මාන්තවල නියුතු සේවකයන් හා පාලන අධිකාරිවරුන් සහභාගි කර ගනිමින් අන්තර්ජාලය (zoom app) මඟින් කොවිඩ් - 19 ආරක්ෂා විම සඳහා දැනුවත් කිරිම සිදු කරන ලදී. විද්‍යුත් තැපෑල (email) හා දුරකථන මාර්ගයෙන් ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්බන්ධ කර ගන්නා ලදී

- රටේ පවතින වසංගත තත්ත්වය යටතේ ජනතාව මුදවා ගැනීම සඳහා ඉදිරි පෙළ ක්‍රියාන්විතවල රාජකාරි කරන රණවිරුවන් හට කොවිඩ් - 19 ආරක්ෂා විම සඳහා කඳවුරු භූමියේ සෞඛ්‍ය ආරක්ෂිතව හැසිරිය යුතු ආකාරය ඇතුළත් උපදෙස් පත්‍රිකා ලබා දී ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරිම




ඡායාරූපය 2-7 හෝමාගම මූලික රෝහල සඳහා පෞද්ගලික ආරක්ෂණ උපාංග පරිත්‍යාග කිරීම

### 2.2.4 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

#### 2.2.4.1 හැඳින්වීම

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබා දීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43කින් සමන්විත වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**දැක්ම**

ආපදාවකට හෝ මරණයකට හෝ පත්වන සේවකයින් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි අයකර දීම මඟින් සේවක තෘප්තිය ඇති කිරීම

**මෙහෙවර**

රැකියාවේ යෙදී සිටීම හේතු කොට ගෙන ඇති වූ අනතුරු මරණ හෝ රෝග පීඩා සම්බන්ධයෙන් සේවකයින්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට නියමිත වන්දි මුදල අයකර දීමට කටයුතු කිරීම සඳහා උසාවි ක්‍රියාමාර්ග ගැනීම සහ උපදෙස් දීම

**කාර්යභාරය**

- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2005 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබා දිය හැකි උපරිම වන්දි මුදල රු. 550,000/- කි)

- බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත් වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු

- සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම

- එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු


- සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම

- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම




ඡායාරූපය 2-8 අනුබද්ධිත ආයතනවල නිලධාරීන් සමඟ සාකච්ඡාව

## වාර්තා වූ මාරක අනතුරු සංඛ්‍යාව




**ප්‍රස්තාරය 2-11 වාර්තා වූ මාරක අනතුරු සංඛ්‍යාව**

## වාර්තා වූ මාරක නොවන අනතුරු සංඛ්‍යාව




**ප්‍රස්තාරය 2-12 වාර්තා වූ මාරක නොවන අනතුරු සංඛ්‍යාව**

### 2.2.4.2 ඉටු කරන ලද කාර්යභාරය

**අ. වන්දි ප්‍රදානය කිරීමේ කටයුතුවල ප්‍රගතිය**

**වගුව 2-22 කම්කරු වන්දි ගෙවීමේ ප්‍රගතිය**

| අ. අ. | කාර්යය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | කටයුතු අවසන් කරන ලද මාරක හා මාරක නොවන නඩු ගොනු සංඛ්‍යාව | 298 |
| 2 | ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව (මාරක නොවන අනතුරුවලදී සේව්‍ය සේවක එකඟතාවයෙන් ගෙවන වන්දි මුදල් සම්බන්ධව) | 87 |

| | | |
|---|---|---|
| 3 | මාරක හා මාරක නොවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් (රු. මි.) | 151.7 |
| 4 | බාලවයස්කාර යැපෙන්නන්ගේ ඉතිරි කිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන් (රු. මි.) | 17.2 |
| 5 | බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 80 |
| 6 | බාලවයස්කරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 77 |
| 7 | නිදහස් කළ බාලවයස්කාර ගිණුම්වලින් ගෙවූ මුදල් ප්‍රමාණය (රු. මි.) | 10.4 |

### ආ. මූල්‍ය ප්‍රගතිය

**වගුව 2-23 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | මුළු ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 33,850,000.00 | 31,216,502.00 | 92.2% |
| ප්‍රාග්ධන වියදම | 900,000.00 | 411,447.00 | 45.7% |
| **මුළු වියදම** | **34,750,000.00** | **31,627,949.00** | **91.0%** |



ඡායාරූපය 2-9 අනතුරට පත් කම්කරුවන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම (ශ්‍රම වාසනා අරමුදලේ අනුග්‍රහයෙන්)

### 2.2.5 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

#### 2.2.5.1 හැඳින්වීම

වර්තමානයේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත අතර, 1966 වසරේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ ඵලදායිතාව ඉහළ නැංවීම උදෙසා විවිධ ක්‍රියාමාර්ග දියත් කරන ලදී. 1994 වසරේ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදායිතාව පිළිබඳ වේගවත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය.

**දැක්ම**

ඵලදායිතා ප්‍රවර්ධනය කිරීමෙහි ලා විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීමෙන් ජාත්‍යන්තර තරඟයට මුහුණ දීම සඳහා අවශ්‍ය වන්නා වූ ශක්තිය ලබා දීම සහ ජාතික සංවර්ධනයට දායක වීම තුළින් ජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලබා දීම


**ප්‍රධාන කාර්යයන්**

- රාජ්‍ය, අධ්‍යාපන, සේවා, ප්‍රජා, සුළු පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා විෂයයන්ට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආයතනවල ඵලදායිතාව වැඩි කිරීම සම්බන්ධයෙන් උපදේශන සේවාවන් ලබා දීම
- ආසියානු ඵලදායිතා සංගමය හා සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- "5S" සහතිකකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ජාතික ඵලදායිතා තරඟාවලිය හා සම්මාන උළෙල පැවැත්වීම

#### 2.2.5.2 ඉටු කරන ලද කාර්යභාරය

**අ. මූල්‍ය ප්‍රගතිය**


**පුනරාවර්තන වියදම**




**ප්‍රස්තාරය 2-13 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වියදම් ප්‍රගතිය**

2020 වසරේ පැවති කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්වය මත සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදවලට අනුගත වීමට සිදු වූ හෙයින්, විෂයානුබද්ධ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ යම් ගැටළුකාරී තත්වයක් ඇති විය. සංචරණ සීමාවන් ක්‍රියාත්මක වීම, පුද්ගල එක්රැස්වීම් සීමා කිරීම, වැනි කරුණු මත ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සීමා කිරීම සහ ප්‍රවර්ධන වැඩසටහන්, පුහුණු වැඩසටහන්, හා උපදේශන වැඩසටහන් වැනි දෑ සැලසුම් ගත පරිදි ඉටුකිරීමේ ප්‍රායෝගික ගැටළු ඇති විය. එබැවින් 51.3% ක ප්‍රාග්ධන වියදම් ප්‍රගතියක් 2020 වසරේ වාර්තා විය.

**ප්‍රාග්ධන වියදම**




**ප්‍රස්තාරය 2-14 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රාග්ධන වියදම් ප්‍රගතිය**

**ආ. විශේෂ වැඩසටහන්**

- **අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව, සේවාවන් ගුණාත්මකව හා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා පහත සඳහන් ආයතනයන්හි ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහිදී සේවාලාභීන් ආයතන පරිශ්‍රය තුළ රැඳී සිටීමේ කාලය අවම කිරීම

සඳහා සුදුසු ක්‍රමවේද සැකසීමත්, ඒ තුළින් ආයතනික කාර්යක්ෂමතාවය සහ සඵලතාවය ඉහළ නැංවීමත් සතුටුදායක හා කාර්යක්ෂම පාරිභෝගික සේවා ක්‍රියාවලි වර්ධනය කිරීම සඳහා වර්තමානයේ භාවිතා වන පාරිභෝගික සේවා ක්‍රියාවලි විශ්ලේෂණය කිරීම, පාරිභෝගික හා සේවක තෘප්තිය පිළිබඳ සංගණනයක් සිදු කිරීම, ඉහළ කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා සිදුකිරීම හා ක්‍රියාවලි සංශෝධන ඇතුළත් වාර්තාවක් ඉහළ කළමනාකාරීත්වය වෙත යොමු කිරීම තුළින් අදාළ වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තිඹිරිගස්යාය
- ජාතික රෝහලේ බාහිර රෝගී අංශය
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**ඇ. විශේෂ ව්‍යාපෘති**

- **මුද්‍රණ ආයතන තුළ හරිත ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම**

ආසියානු ඵලදායිතා සංගමයේ සහයෝගීතාව තුළින් මුද්‍රණ ආයතන තුළ හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීමේ විශේෂ ව්‍යාපෘතියක්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ මැදිහත්වීම තුළින් විජය නිව්ස් පේපර්ස් සහ රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව සඳහා ක්‍රියාත්මක කරන ලදී. කාර්යක්ෂම සම්පත් භාවිතය, කාබන් විමෝචනය හා අපද්‍රව්‍ය ජනනය අවම කිරීම සහ ආයතනයේ සමස්ත ඵලාදායිතාවය වර්ධනය කිරීම යන අරමුණු සපුරා ගැනීම උදෙසා ද්‍රව්‍යමය පිරිවැය ගිණුම්කරණය (Material Flow Cost Accounting) භාවිතයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

- **ලංකා බැංකු ශාඛා සඳහා වැඩසටහන් පැවැත්වීම**

දිවයිනේ සියලුම ලංකා බැංකු ශාඛා ඵලදායිතා සංකල්ප කෙරෙහි අනුගත කිරීම සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මූලික පිරිවැයක් රහිතව මෙම කාර්යයන් සිදුකර ඇති අතර, කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවන් තුළින් පාරිභෝගික සත්කාර සේවාවන් වර්ධනය කිරීම මෙමඟින් සිදුවේ. 2021 වසරේ දී මෙහි ඉදිරි කටයුතු සිදු වනු ඇත.

- **දිස්ත්‍රික් කම්කරු කාර්යාල සඳහා වැඩසටහන් පැවැත්වීම**

දිවයිනේ සියලුම දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල



ඡායාරූපය 2-10 පිරිවෙන් ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් ගුණාත්මක හා ඵලදායි සේවාවන් ලබා දීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල 34ක ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දෛනිකව විශාල සේවාලාභීන් සංඛ්‍යාවක් මෙම කාර්යාල වෙත පැමිණෙන අතර, සිදුකරන ලද විගණන මඟින් පවතින ක්‍රියාවලි හා ක්‍රමවේදයන්හි වැඩි දියුණු කිරීම් සිදුකරන ලදී.

- **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා වැඩසටහන් පැවැත්වීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පාලනය වන දිවයින පුරා පිහිටි ඩිපෝ සහ රියදුරු පාසල් පංචවිධ සංකල්පයට අනුව සකස් කිරීම සඳහා විශේෂිත වැඩසටහන් මාලාවක් 2020 වසර තුළ ක්‍රියාත්මක විය. ඵලදායි හා කාර්යක්ෂම වැඩ පරිසරයක් තුළින් ආයතනික සේවාවන්හි ගුණාත්මකභාවය හා සඵලතාවය වර්ධනය කරීම මෙහි මුඛ්‍ය අරමුණ විය.

- "5S" **විගණන වැඩසටහන**

ආයතනවල “5S” ප්‍රමිතියක් ඇති කිරීම මඟින් විධිමත් පරිසරයක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව “5S” විගණන වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක වේ. 2020 වසර තුළදී රු. 386,411ක වියදමක් දරා ආයතන 61ක “5S” විගණන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර 2021 වසරේදී ද මෙම වැඩසටහන ක්‍රියාත්මක වනු ඇත.

- **ඵලදායිතාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

කුරුණෑගල, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියාව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල සේවයෙහි නියුතු රාජ්‍ය නිලධාරීන්ගේ ඵලදායිතා දැනුම වර්ධනය තුළින් ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර සාර්ථකව අවසන් කර ඇති අතර, මේ සඳහා නිලධාරීන් 250 දෙනෙකු සහභාගි වී ඇත. එමෙන්ම, සේවා අංශය සඳහා ද 38 දෙනෙකුගේ සහභාගිත්වය තුළින් ඵලදායිතාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය අනුව පවත්වා ඇති අතර එම වැඩසටහන ද සාර්ථකව නිම කර ඇත.

- **පිරිවෙන් කළමනාකරණ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය හා ඒකාබද්ධව පිරිවෙන් ගුණාත්මක දර්ශකය හඳුනා ගනිමින් පිරිවෙන් ඵලදායිතා ශ්‍රේණිගත කිරීමේ ජාතික වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය, මාතලේ, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුර, මහනුවර සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක තුළ පවතින පිරිවෙන් 166ක් ආශ්‍රිතව විගණන වැඩසටහන් අවසන් කර ඇත.

**වගුව 2-24 පිරිවෙන් කළමනාකරණ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

| අ. අ. | දිස්ත්‍රික්කය | විගණන වැඩසටහන් අවසන් කළ පිරිවෙන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය | 07 |
| 2 | අම්පාර | 23 |
| 3 | මාතලේ | 23 |
| 4 | පොළොන්නරුව | 15 |
| 5 | මහනුවර | 48 |
| 6 | අනුරාධපුර | 49 |
| 7 | මඩකලපුව | 01 |
| | **එකතුව** | **166** |

- **ඵල සපිරි පිරිවෙන් වැඩසටහන**

පිරිවෙන් අධ්‍යාපන පරමාර්ථ සාධනය කරගැනීම සඳහා නූතන ඵලදායිතා සංකල්ප, පිරිවෙන් පද්ධතියට හඳුනා ගැනීම යන අරමුණ පෙරදැරිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඵල සපිරි පිරිවෙන් සංකල්පයට අනුව පිරිවෙන් බලගැන්වීමේදී බස්නාහිර, වයඹ, මධ්‍යම, උතුරුමැද, නැගෙනහිර, ඌව, පළාත්වලට අයත් දිස්ත්‍රික්ක 19ක පිහිටි

පිරිවෙන් 679ක මෙම වැඩසටහන 2020 වසර තුළදී ක්‍රියාත්මක කර ඇත.

- **සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන**

දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331ක් ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් සුළු පරිමාණ ව්‍යවසායකයින් 20 දෙනෙකු බැගින් ව්‍යවසායකයින් 6,620 දෙනෙකු තෝරා, ඵලදායිතා සංකල්ප තුළින් ඔවුන්ගේ සේවා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම 'සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන' යටතේ සිදු වේ.

2020 වසරේ දී ව්‍යවසායකයින් හඳුනා ගැනීම, ව්‍යාපාර ස්වභාවය අනුව වර්ගීකරණය හා ලියාපදිංචිය යන කාර්යයන් සිදුකරන ලද අතර, 2020-09-15 දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් 27 දෙනෙකු සඳහා අදාළ දැනුවත් කිරීමේ වැඩසටහනක් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙහි ඉදිරි කටයුතු 2021 වසර තුළදී සිදුවනු ඇත.

**ඈ. රාජ්‍ය අංශයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

රාජ්‍ය අංශය යටතේ ගුණාත්මක සේවාවන් හා කාර්යක්ෂම වැඩ පරිසරයක් පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය දැනුවත් කිරීම් හා මාර්ගෝපදේශ සිදු කර ඵලදායිතාවය ඉහළ නැංවීමේ ක්‍රමවේද හා 5S පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පහත සඳහන් ආයතනයන් තුළ සිදු කරමින් පවතී.

- අග්‍රාමාත්‍ය කාර්යාලය
- දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය
- කම්කරු අමාත්‍යාංශය
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
- ආරක්ෂක අමාත්‍යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- දුම්රිය දෙපාර්තමේන්තුව
- කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
- මුලික රෝහල, වතුපිටිවල
- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආරක්ෂක අංශය
- ජාතික තරුණ සේවා සභාව
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව, වයඹ පළාත් සභාව

**ඉ. අධ්‍යාපන අංශයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

අධ්‍යාපන අංශය යටතේ පහත සඳහන් ආයතනයන් තුළ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් සිදු කරමින් පවතී.

- උසස් අධ්‍යාපන ආයතන - රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය
- කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය
- වෘත්තීය පුහුණු අධිකාරිය
- තාක්ෂණික විද්‍යාල
- තෝරාගත් පාසල් හා පෙර පාසල්
- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු ආයතනය
- වෘත්තීය පුහුණු අධිකාරිය හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, නාරාහේන්පිට
- ගුරු පුහුණු මධ්‍යස්ථාන මීගමුව, බෝලවලාන, නාරාහේන්පිට සහ කැලණිය

**ඊ. සේවා අංශයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

පහත සඳහන් ආයතනයන් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- කඩවත නිකාඩෝ ආයතනය
- ලංකා විදුලිබල මණ්ඩලය, බටහිර කලාපය
- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
- මාර්ගස්ථ මගී ප්‍රවාහන කොමිසම
- මාර්ග සංවර්ධන අධිකාරිය
- මධ්‍යම පරිසර අධිකාරිය
- ජාතික ළමා රක්ෂණ අධිකාරිය
- කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
- ජාතික ලොතරැයි මණ්ඩලය

- සිරස Stein Studio
- ශ්‍රම වාසනා අරමුදල
- ජාතික විද්‍යා පදනම
- සවික්මා ඔටෝමේෂන් පුද්ගලික සමාගම, කහතුඩුව
- රදීජා හෝල්ඩින්ග්ස්, නුගේගොඩ

**උ. ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා ඉලක්ක අගයන් ලබාදීම මඟින් ආයතන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත වී සිටින ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක අගයන් ලබා දීම තුළින් ආයතන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම සිදු වනු ඇත. නව්‍යකරණය, කාර්යක්ෂමතාව හා ඵලදායි වැඩ පරිසරයක් තුළින් ප්‍රජා සේවාවන් කාර්යක්ෂම කිරීම, මෙහි මූලික අරමුණ වේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත ඵලදායිතා සංවර්ධන නිලධාරීන් විසින් පහත සඳහන් ආයතනවලින් එක බැගින් තෝරා ගෙන වැඩසටහන් පැවැත්වීමට ඉලක්ක ලබා දී ඇත.

- රෝහල්
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල
- කලාප අධ්‍යාපන කාර්යාල
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- අධිකරණ / පොලිස් ස්ථාන
- පෞද්ගලික අංශයේ ආයතන

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා ලබා දී ඇති ඉලක්ක පහත පරිදි වේ.

**වගුව 2-25 ප්‍රාදේශීය මට්ටමින් ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා ලබා දී ඇති ඉලක්ක**

| අ. අ. | ආයතන වර්ගය | ඉලක්ක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | රාජ්‍ය ආයතන | 02 |
| 2 | පිරිවෙන් | 01 |
| 3 | පෙර පාසැල් | 02 |



ඡායාරූපය 2-11 අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා වැඩසටහන් පැවැත්වීම

## 2.3 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී පරිසරයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය අත්පත් කර ගැනීමට හැකි වන පරිදි පිළිගත් ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් නෛතික ප්‍රතිපාදන සම්පාදනය කර දීම අප අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවත්නා අණ පනත්, නීති රීති වර්තමාන හා අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම මෙන්ම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද අප අමාත්‍යාංශය බැඳී සිටියි. එබැවින්, මෙම ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී පහත කරුණු පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ.

- අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව අන්තර්ගත කරුණු
- 2020.10.06 දිනැති අංක 2196/27 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් සහ සුවිශේෂී ප්‍රමුඛතා
- අමාත්‍යාංශයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු
- කම්කරු ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන්වල ඇතුලත් කරුණු

2020 වර්ෂයේ තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ වුවද රට තුළ කාර්මික සාමය පවත්වා ගෙන යමින් කම්කරු ජනතාව වෙනුවෙන් විශේෂ ජයග්‍රහණ රැසක් අත්පත් කර දීමට අප අමාත්‍යාංශයට හැකි වීම පිළිබඳ ප්‍රකාශ කරනුයේ ගෞරව පූර්වකවය. එසේ අත්පත් කරගත් ජයග්‍රහණ හා ඉදිරි ඉලක්ක පාඨකයින්ගේ අවධානයට පහතින් සංක්ෂිප්තව දක්වා ඇත.

**කොවිඩ් - 19 වසංගත තත්ත්වයේ අහිසි බලපෑම් වළක්වා ගැනීමට පියවර ගැනීම**

- **සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ හා සමාජ දුරස්ථභාවය ආරක්ෂා කිරීමට සිදුවීම හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ සේවකයින්ගේ රැකියා අහිමි වීම වැළැක්වීම හා අවම වශයෙන් රු. 14,500/- හෝ ඊට වැඩි වැටුපක් ගෙවීම සහතික කිරීම තුළින් ශ්‍රමික ආරක්ෂාව තහවුරු කිරීම**

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ කරන කම්කරු ජනතාවට ගැටළු රාශියකට මුහුණ දීමට සිදු විණි. එම තත්ත්වය හමුවේ සුවහසක් කම්කරු ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කිරීම හා තහවුරු කිරීම සඳහා ප්‍රධානතම සමාජ කතිකාවත යාන්ත්‍රණය වන ජාතික කම්කරු උපදේශක සභාවේ අනුකම්ටුවක් ලෙස "ත්‍රෛපාර්ශවීය කාර්යසාධන බලකායක්" ස්ථාපිත කරන ලදී. එමඟින් පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතතාව මෙන්ම වසංගත තත්ත්වය හේතුවෙන් සේවකයන් සහ ආයතන වෙත ඇති වන බලපෑම අවම කිරීම සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලදී. මේ අයුරින් ආරක්ෂිත මාර්ගෝපදේශ හා සමාජ දුරස්ථභාවය පවත්වාගෙන යාමට සිදු වීම හේතුවෙන් සේවකයින්ට සේවයට වාර්තා කිරීමට අපහසු තත්ත්වයක් යටතේ ජාතික නිෂ්පාදිතය ස්ථාවරව පවත්වා ගැනීම මෙන්ම සේවකයින්ගේ රැකියා ආරක්ෂා කර ගැනීම අතිදුෂ්කර කරුණක් විය. ඇඳිරි නීතිය පනවා තිබූ අවස්ථාවන්හි පවා මෙම කාර්යසාධන බලකාය නිරන්තරයෙන් රැස් වී පාර්ශවකරුවන් අතර වඩා යහපත් අවබෝධයකින් යුතුව මුහුණ පෑමට සිදු වූ අභියෝගයන්ට සාර්ථක විසඳුම් ඇති කරලීමට සමත් විය.

විවිධ පාර්ශවකරුවන් අතර විශ්වාසය ගොඩ නැගීමට සහ යම් ගැටළුකාරී තත්ත්වයන් අර්බුද දක්වා උත්සන්න වීමට පෙර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙම කාර්යසාධන බලකාය බෙහෙවින් ඉවහල් විය. කොවිඩ් - 19 වසංගතය පැතිර යාම හේතුවෙන් වැඩ ලබා දීමට නොහැකි වූ සේවකයන් හට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කාර්යසාධන රැස්වීම්වලදී පහත දැක්වෙන එකඟතාවන්ට එළඹෙන ලදී.

- කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ නවත්වනු ලැබූ

ආයතනවල සේවකයන්ගේ රැකියා අහිමි වීම වළක්වා ගැනීම සඳහා සේවා යෝජකයන් හා සේවකයන් අතර එකඟතාවයක් ඇති කිරීම

- සෞඛ්‍ය ආරක්ෂිත මාර්ගෝපදේශ සහ සමාජ දුරස්ථභාවය පිළිබඳ අවශ්‍යතා හේතුවෙන් සියලු සේවකයන් එකවර සේවයට කැඳවීමට නොහැකි අවස්ථාවන්හි දී, සියලු සේවකයන්ට සමානුපාතිකව වැඩ ලැබෙන බව සහතික කිරීම පිණිස වැඩ වාර ක්‍රමවේදයක් හෝ වෙනත් සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

- වැඩ නොමැතිව නිවසේ රඳවා තැබූ සේවකයන් සඳහා 2020 මැයි සිට සැප්තැම්බර් දක්වා ද, සංචාරක ක්ෂේත්‍රයේ යෙදෙන ව්‍යාපාර හා කොවිඩ් - 19 වසංගතයේ බලපෑම හමුවේ මේ වන විටත් සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට නොහැකි ක්ෂේත්‍රවල ව්‍යාපාර සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අවසරයට යටත්ව 2020 දෙසැම්බර් දක්වා ද එම සේවකයා විසින් අවසානයට ලබන ලද මාසයේ මූලික වැටුපෙන් 50%ක් හෝ රු. 14,500/- යන දෙකෙන් වඩා වැඩි මුදල ගෙවීමට සේවායෝජකයින්ව එකඟ කරවා ගැනීම. මීට අදාළව සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල් බැර කිරීමට ද නියමයන් පනවන ලදී

- **කොවිඩ් - 19 වසංගතයේ දැඩි බලපෑමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් රැක ගැනීම**

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ඉතාම පීඩාවට පත් වූ කණ්ඩායම වූයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ කර්මාන්තකරුවන්ය. එම ව්‍යවසායකයින් ආරක්ෂා කර ගැනීම සහ ඔවුන්ගේ අනාගත දියුණුව වෙනුවෙන් වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ අවබෝධය ඔවුන් වෙත ලබා දීම සඳහා ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක අවරණය වන පරිදි වැඩමුළු සංවිධානය කරන ලදී. එමෙන්ම, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ මෙරට රාජ්‍ය නොවන ආයතන සමඟ එක් වෙමින් ඔවුන්ගේ එම කර්මාන්ත අඛණ්ඩව පවත්වා ගැනීම වෙනුවෙන් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේදී මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා ඉවත් කර ගැනීම උදෙසා බැංකු පද්ධතිය හරහා කර්මාන්තකරුවන්ට අඩු පොලියක් යටතේ ලබා දුන් ණය මුදල් ඇතුළු ලබා දුන් සහන මෙම කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා ද ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.

- **අනාගතයේදී ඇති විය හැකි මෙවැනි වසංගත තත්ත්වයන්හිදී ජාතික නිෂ්පාදිතය ප්‍රශස්තව පවත්වා ගැනීමට පූර්ව සූදානම් වීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම**

2020 අප්‍රේල් සහ මැයි කාලය තුළ කම්කරු දෙපාර්තමේන්තුව විසින් "කොවිඩ් - 19 සහ ඉන් ඔබ්බට: ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපෑම" නමින් මාර්ගගත සමීක්ෂණයක් පවත්වනු ලැබීය. එමෙන්ම, "කොවිඩ් - 19 : සේවක ගැටළු සහ ප්‍රතිචාර" නමින් පර්යේෂණ පත්‍රිකා කැඳවා ජර්නලයක් මුද්‍රණය කරන ලදී. මෙම කාර්යයන්හි අරමුණ වූයේ කොවිඩ් - 19 හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලික අංශයේ ආයතන පිළිබඳ තොරතුරු රැස් කිරීම වන අතර එම තොරතුරු රජය විසින් සඵල, ඉලක්කගත සහ මනාව සැලසුම් කළ ප්‍රතිපත්ති ප්‍රතිචාර සැපයීමට යොදා ගනු ඇත. පුද්ගලික අංශයේ විධිමත් ක්ෂේත්‍ර ආයතන 2,764ක් මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සමීක්ෂණයට ප්‍රතිචාර දක්වනු ලැබීය. මෙහි දෙවනි අදියර 2021 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතය.

**දැනට පවතින ජාතික අවම වේතනය වන රු. 10,000/-ක මුදල රු. 12,500/- දක්වා රු. 2,500/- කින් ඉහළ නැංවීම**

ජාතික අවම වේතනය සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට

අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ඇතුළු සියලු නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එය පාර්ලිමේන්තුවේ ද සම්මත වීමෙන් පසු සේවකයකු සේවයේ යොදවා ගැනීමේදී මසකට රු. 12,500/-ක අවම වැටුපක් සහ අයවැය සහන දීමනාව ලෙස රු. 3,500/-ක් ලෙස එකතුව රු. 16,000/-ක අවම වැටුපක් ගෙවීමට හාම්පුතුන් මේ අනුව නීතියෙන්ම බැඳී සිටී.

**වතු සේවක ප්‍රජාවගේ අවම දෛනික වැටුප රු. 1,000/- දක්වා ඉහළ නැංවීම**

වතු සේවක ප්‍රජාවගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා තේ හා රබර් කර්මාන්තයන්හි නියුතු සේවකයිගේ අවම දෛනික වේතනය රු. 1,000/- දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සිදු කර ඇත.

**කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේදී ගෙවනු ලබන උපරිම වන්දි මුදල රු. 2,500,000/- දක්වා ඉහළ නැංවීම**

අසාධාරණ ලෙස කම්කරුවන් සේවයෙන් ඉවත් කිරීමේ දී සහ ආයතන වසා දැමීම හේතුවෙන් කම්කරුවන්ගේ රැකියාව අහිමි වන අවස්ථාවල දී සේවකයින්ට හිමි වන උපරිම වන්දි මුදල රු. 1,250,000/-කට සීමා වී පැවතීම සැලකිල්ලට ගනිමින් සේවකයන්ට ගෙවිය යුතු උපරිම වන්දි මුදල රු. 1,250,000/- සිට රු. 2,500,000/- දක්වා ඉහළ නැංවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පළ කරමින් නීති ගත කර ඇත.

**සේවකයින්ට වන්දි ලබා දීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම**

කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ කාර්මික ආරවුල් පනත යන පනත් යටතේ ලබාදෙන ප්‍රදානයන් සහ තීන්දුවලට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් අයදුම්පත් ගොනු කිරීමේදී ඇප මුදලක් තැන්පත් කළ යුතු පරිදි නීති සංශෝධනය කිරීම.

ඉහතින් සඳහන් කළ පනත් යටතේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගයට එරෙහිව හෝ එකී නියෝගයන් බලාත්මක කරවා ගැනීම සඳහා වන මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දුවකට එරෙහිව ද කාර්මික බේරුම්කරණ ප්‍රදානයකට හෝ කාර්මික අධිකරණ ප්‍රදානයකට එරෙහිව හෝ සේවායෝජකයින් විසින් අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වීමේ දී, ඇප මුදලක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව පමණක් එම අධිකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට හැකි වන පරිදි, කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා එම සංශෝධන පනත් කෙටුම්පත් දෙක පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

**රට තුළ ළමා ශ්‍රමය තුරන් කිරීම**

අනර්ථකාරී ලෙස ළමා ශ්‍රමය යොදා ගැනීම ද ඇතුළුව සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම් තුරන් කිරීමට ශ්‍රී ලංකාව මේ වන විට පියවරයන් රැසක් ගෙන ඇත. ළමා ශ්‍රමයෙන් තොර ශ්‍රී ලංකාවක් කරා ළඟා වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ (Roadmap) සකස් කර, ළමා ශ්‍රමය බහුලව පවතින ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමටත්, ඒ සඳහා වෙන් වෙන් වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගනු ලැබේ.

- **රැකියාවන්හි යොදවා ගැනීමේ අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා වැඩි කිරීම**

  ශ්‍රී ලාංකික දරුවන් අවම වශයෙන් වයස අවුරුදු 16ක් දක්වා අනිවාර්යයෙන්ම අධ්‍යාපනය ලැබිය යුතු බව නීතියෙන් නියම කරන ලද අයිතිවාසිකමකි. එසේ වුවද, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ වයස අවු. 14ට වැඩි ළමුන් සේවයේ යොදවා ගැනීමට හැකියාවක් නෛතිකවම පැවතුන අතර එම තත්වය වෙනස් කරමින් වයස අවු. 16ට අඩු ළමයින් සේවයේ යොදවා ගැනීමට නොහැකිවන ලෙස ශ්‍රී ලංකාවේ කම්කරු නීතිවල ළමා ශ්‍රමය යොදා ගැනීම සම්බන්ධ නෛතික ප්‍රතිපාදන සංශෝධනය කරන ලදී.

- **ධීවර ක්ෂේත්‍රය ළමා ශ්‍රමයෙන් සහමුලින්ම තොර කිරීම**

  ධීවර අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති අනෙකුත් ආයතන සම්බන්ධ කර

ගනිමින් ළමා ශ්‍රමය පිටු දැකීම සඳහා වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇති අතර එමගින්, ධීවර ක්ෂේත්‍රය, ළමා ශ්‍රමයෙන් තොර ක්ෂේත්‍රයක් කිරීම සඳහා මූලික පියවර මේ වන විට ආරම්භ කර ඇත.

- **ළමා ශ්‍රමයට එරෙහි පැමිණිලි කඩිනමින් විසඳීම**

  ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ "1929" ළමා උපකාරක සේවා (Hotline) දුරකථන අංකය ඔස්සේ ළමුන් සේවයේ යොදවා ගැනීම පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීම සහ වාර්තාකරණයත්, ළමා ශ්‍රමය තහවුරු වන අවස්ථාවන්හිදී අවශ්‍ය නෛතික පියවර ගැනීම කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත.

- **ළමුන් අන්තරායකර රැකියාවල යෙදවීමෙන් ආරක්ෂා කිරීම**

  ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ අන්තරායකර රැකියා නියෝග පැනවීම. අවුරුදු 18ට අඩු තැනැත්තන් අන්තරායකර සේවයෙහි යෙදවිය නොහැකිවන අයුරින් අන්තරායකර රැකියා ලැයිස්තුවක් සකස් කෙරේ. මෙමගින් ළමයින් සේවයෙහි යෙදවිය නොහැකි අන්තරායකර රැකියා 71ක ලැයිස්තුවක් ඉදිරිපත් කරන අතර ඒ තුළ සර්කස් හෝ ජිම්නාස්ටික් ක්‍රියාකාරකම්වලට සම්බන්ධව හෝ වෙනත් අන්තරාදායක රඟපෑම්වලට අදාළව, සත්ව ඝාතකාගාරවල සේවය සඳහා, විකිරණශීලී ද්‍රව්‍ය භාවිතා කරන රැකියාවල යෙදීම සඳහා, සමාජ ශාලාවල මත්පැන්හල්වල, කැසිනෝ ආයතන තුළ සේවයේ යෙදීම සඳහා සහ පුපුරණ ද්‍රව්‍ය හෝ ගිනි අවි නිෂ්පාදනය, ප්‍රවාහනය, විකිණීම ඇතුළු රැකියාවන්හි යෙදවීම තහනම් කිරීමට යෝජිතය. එමගින්, වයස අවුරුදු 16 - 18 අතර තරුණ තරුණියන්ගේ ආරක්ෂාව තහවුරු කෙරේ. එම නියෝග කඩිනමින් ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත.

**සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරකදී ගෙවන වන්දි මුදල ඉහළ නැංවීම**

සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරක් හේතුවෙන් ශාරීරික හානි, බෙලහීනතාවයට පත්වන හෝ ජීවිතක්ෂයට පත්වන පුද්ගලයන්ට කම්කරු වන්දි ආඥාපනත යටතේ ලබාදෙන වන්දි මුදල රු. 550,000/- සිට රු. ලක්ෂ 20 දක්වා වැඩි කිරීම.

සේවකයන්ට රැකියාවේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරු හේතුවෙන් සිදුවන ශාරීරික හානි හෝ බෙලහීනත්වයට පත්වීම හෝ ජීවිතක්ෂයට පත්වන අවස්ථාවලදී කම්කරු වන්දි ආඥාපනත යටතේ ඉල්ලීමක් කරන සේවකයකුට / යැපෙන්නන්ට සේවකයාගේ මාසික වැටුප පදනම් කරගෙන රු. 550,000/-ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට සේව්‍යයා වෙත නියම කර තිබුණි. මෙම මුදල ප්‍රමාණවත් නොවන බැවින් උපරිම වන්දි මුදල රු. 2,000,000/- දක්වා ඉහළ නැංවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර වන්දි මුදල ගෙවීම සඳහා සේව්‍යයන් විසින් කම්කරු වන්දි රක්ෂණ යෝජනා ක්‍රමයකට දායක විය යුතු බවට වූ ප්‍රතිපාදනයක් ඇතුලත් කරමින් 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.

**වගුව 2-26 පැවති සහ යෝජිත උපරිම වන්දි සීමාවන්**

| අ. අ. | අනතුර | පැවති උපරිම සීමාව (රු.) | යෝජිත උපරිම සීමාව (රු.) |
|---|---|---|---|
| 1 | සේවක මරණයකදී | 550,000/- | 2,000,000/- |
| 2 | නිත්‍ය පූර්ණ බෙලහීනතාවයකදී ගෙවන වන්දිය | 550,000/- | 2,000,000/- |
| 3 | තාවකාලික බෙලහීනතාවයකදී ගෙවන වන්දිය | 5,500/- | 47,500/- |

**කම්කරු වන්දි ලබා දීම හා ඒ සම්බන්ධයෙන් වූ ආරවුල් නිරවුල් කිරීමේ කාර්යය කඩිනම් කිරීම සඳහා කම්කරු වන්දි කොමසාරිස් සහ කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබාදීම**

රැකියාවේදී සිදුවන අනතුරු හේතුවෙන් ශාරීරික හානිවලට හෝ නිත්‍ය බෙලහීනත්වයට පත්වන සේවකයන්ට හා ජීවිතක්ෂයට පත්වන සේවකයන්ගේ උරුමකරුවන්ට වන්දි අයකර දීම කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. වන්දි මුදල අයකර දීමට වර්තමානයේ දී දීර්ඝ කාලයක් ගතවන බැවින් කම්කරු වන්දි ආඥා පනත සංශෝධනය කර එක් බල සීමාවන්හි පිහිටි කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ට කම්කරු වන්දි නඩු විමසා තීන්දුවක් ලබා දීමේ සමගාමී අධිකරණ බලය ලබා දීමට අපේක්ෂා කරන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඒ සඳහා සංශෝධිත පනත් කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත දන්වා යවා ඇත. මීට අමතරව වන්දි අය කර දිය හැකි වෘත්තීය රෝග ලැයිස්තුව ද මේ සමඟම සංශෝධනය කර වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට ද පියවර ගෙන ඇත.

**වෘත්තීය සුරක්ෂිතතාව, සේවක සෞඛ්‍ය හා සුභසාධනය පිළිබඳව නව පනතක් හඳුන්වා දීම**

සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මූලික නෛතික ප්‍රතිපාදන පවතිනුයේ මීට වසර 79කට පෙර පනවන ලද කර්මාන්තශාලා ආඥා පනත තුළ පමණි. නූතන තාක්ෂණයේ දියුණුවත් සමඟ නිෂ්පාදන ක්‍රියාවලීන් වෙනස් වීම, රසායනික ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම වැනි හේතු මත සේවකයින්ට, ප්‍රජාවට හා පරිසරයට සිදුවන හානි හා බලපෑම වැළැක්වීම සඳහා වෘත්තීය සෞඛ්‍ය, සුරක්ෂිතතාව හා සුභසාධනය තහවුරු කිරීමට දැනට පවත්නා නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව හඳුනාගෙන ඇත. එබැවින් සේවකයන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය සහ සුභසාධනය තහවුරු කිරීම සඳහා ද සේවා ස්ථානවල දී පැන නඟින ක්‍රියාකාරකම් තුළින් පුද්ගලයින්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය සුරක්ෂිත කිරීම උදෙසා ද ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් සැකසීම උනන්දු කිරීම උදෙසා ද ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් ශ්‍රී ලංකාවේ ජාතික නිර්ණායකයන් ලෙස නියම කිරීමට ද, නව පරිචයන්ට අනුකූලව මාර්ගෝපදේශ හා මඟ පෙන්වීම ලබා දීම සඳහා වෘත්තීය සුරක්ෂිතතා පනතක් අලුතින් හඳුන්වා දීමට අවශ්‍ය පනතේ දළ කෙටුම්පත් දැනටමත් සකසා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

**ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් සමාගම වසා දැමීම හේතුවෙන් සේවකයින්ට ගෙවිය යුතුව තිබූ වන්දි ගෙවීම**

1972 වර්ෂයේ දී අරඹන ලද ශ්‍රී ලංකා ට්‍රැක්ටර් නීතිගත සංස්ථාව 1994 වර්ෂයේ දී ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් යනුවෙන් පෞද්ගලීකරණය කිරීමත් සමගම පාඩු ලැබීම හේතුවෙන්, එම සමාගම 2002 වර්ෂයේ දී එහි සේවකයින් 87 දෙනෙකු ඉවත් කරන ලෙස කම්කරු දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීම මත ඔවුනට හිමි වන්දි මුදල්, පාරිතෝෂික දීමනා හා හිඟ වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. 29,321,619/- මුදලක් ලබා දීමෙන් අනතුරුව ඔවුන් සේවයෙන් ඉවත් කර ඇත. ඉතිරි සේවකයින් සඳහා වන්දි ලබා දීමක් සිදුව නැත.

දීර්ඝ කාලයක් ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කිරීමෙන් පසුව සේවය අහිමි වී ඇති සේවකයින් තමන් පත්ව ඇති අසරණ තත්ත්වය මත මානසික හා කායික රෝගීභාවයට ලක්ව කිහිප දෙනෙකු මිය ගොස් ඇති බව හා අනෙකුත් සේවකයින් වයස්ගත තත්ත්වයේ පසු වන බව සඳහන් කරමින් 2002 වර්ෂයේ සිට වසර ගණනාවක් පුරා තමන් මුහුණ දීමට සිදුවූ දැඩි ආර්ථික දුෂ්කරතාවන් හා අපසුතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින් ඔවුන්ට හිමි වන්දි මුදල් ලබා දෙන ලෙස කම්කරු අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව වෙත දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, තවදුරටත් වත්මන් ගරු කම්කරු අමාත්‍යතුමාගේ මැදිහත් වීම මත ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන කම්කරු දෙපාර්තමේන්තුව වෙත මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර කම්කරු

අමාත්‍යාංශය විසින් ගනු ලැබීය. ඒ අනුව, සේවකයින් 128 දෙනෙකු සඳහා ගෙවිය යුතු හිඟ පාරිතෝෂික, වැටුප් හා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා රු. 22,006,083.42 අයවැය ප්‍රතිපාදන කම්කරු දෙපාර්තමේන්තුව වෙත වෙන් කර ගැනීමට හැකි වූ අතර ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් වසර 18කට අධික කාලයක් තිස්සේ ගෙවීමට නොහැකි වූ වන්දි මුදල් ගෙවීමට හැකියාව උදාවිය.

**කම්කරු නඩු විමසීම කඩිනම් කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ හා කම්කරු විනිශ්චය සභා වෙත සමගාමී අධිකරණ බලයක් ලබා දීමට නව විශේෂ විධිවිධාන පනතක් ගෙන ඒම**

දැනට කම්කරු විනිශ්චය සභා ඉදිරියේ විභාග වනුයේ කාර්මික ආරවුල් පනත ප්‍රකාරව පවරන ලද නඩු පමණක් වන අතර අනෙකුත් සියලුම කම්කරු නීති හා ආඥා පනත් සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කරනුයේ මහේස්ත්‍රාත් අධිකරණ මඟිනි. මහේස්ත්‍රාත් අධිකරණවල පවත්නා අනෙකුත් අපරාධ නඩු සම්බන්ධ කටයුතු අතරතුරදී කම්කරු නඩුකර විසඳා අවසන් කිරීම ප්‍රායෝගිකව අසීරු කරුණක් වන බැවින් කම්කරු නඩු සඳහා දීර්ඝ දින ලබා දීමේ ප්‍රවණතාවක් දක්නට ඇත. ඒ අනුව, දැනට 16,000කට අධික නඩු ප්‍රමාණයක් එලෙස මහේස්ත්‍රාත් අධිකරණවල එක් රැස්ව පවතී. මෙම නඩු ප්‍රමාදය හේතුවෙන් සේවකයන්ට හිමි විය යුතු පාරිතෝෂික, සේවක අර්ථසාධක හා හිඟ වැටුප් වැනි ව්‍යවස්ථාපිත හිමිකම් අයකර දීම සඳහා වසර 5 - 6ක දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවේ. සේවකයන්ට සිදුවන මෙම අගතිදායක තත්වය අවම කර කම්කරු නඩු කාර්යක්ෂමව විසඳා අවසන් කිරීමේ බලය දිවයින පුරා පිහිටි කම්කරු විනිශ්චය සභා වෙත පැවරීමට ගරු කම්කරු අමාත්‍යතුමා විසින් කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර කම්කරු නඩු විභාග කිරීම සඳහා දිවයින පුරා මහේස්ත්‍රාත් අධිකරණවලට සහ කම්කරු විනිශ්චය සභාවලට සමගාමී අධිකරණ බලය පැවරෙන පරිදි කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරමින් පවතී.

**විනය පරීක්ෂණ හෝ වැඩ තහනමට ලක් වන පෞද්ගලික අංශයේ සේවකයන් පිළිබඳ ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට හැකි වන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම**

සේවකයෙකුගේ වැඩ තහනම් කරනු ලබන අවස්ථාවක දී එම චෝදනාවන් පිළිබඳ විධිමත් විනය පරීක්ෂණයක් සිදු කර අවසන් තීන්දුවක් ලබා දිය යුතු කාල සීමාවක් පිළිබඳව කම්කරු නීතිවල නිශ්චිතව සඳහන්ව නොමැත. ඒ හේතුවෙන් ඇතැම් අවස්ථාවලදී වැඩ තහනමට ලක් වන සේවකයින්ට විවිධ ආර්ථික හා සමාජීය දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදු වන බව වාර්තා වී ඇත. එබැවින්, සේවකයෙකුගේ වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවක දී, එදින සිට මාස 06ක් ඇතුළත විනය පරීක්ෂණයක් පවත්වා අවසන් විනය නියෝගයක් ලබා දීමට හා අදාළ චෝදනාව මූල්‍ය වංචාවක් නොවන්නේ නම් වැඩ තහනමට ලක් වූ කාලය තුළ සේවකයාට අඩ වැටුප් ලබා ගැනීමට හැකි වන පරිදි විධිවිධාන ඇතුළත් කරමින් කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය.

**කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු විනිශ්චය සභාවල පවරන නඩු සඳහා නීතිඥ නොවන කම්කරු නියෝජිතයන්ට පෙනී සිටීමට හැකිවන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය**

කම්කරු විනිශ්චය සභා ඉදිරියේ නීතිඥයන් නොවන නියෝජිතයන්ට සේවකයන් වෙනුවෙන් පෙනී සිටීමට මුල් කාලයේදී හැකියාව තිබුණත් වර්තමානයේ දී කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් විසින් ඊට අවසර නොදෙන තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. කාර්මික ආරවුල් පනත යටතේ පවරන නඩු සඳහා නීතිඥ නොවන නියෝජිතයන්ට පෙනී සිටීමට හැකි වන පරිදි කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර අදාළ පනත් සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.

**යම් සේවකයකු සේවයට බඳවා ගෙන දින 30ක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට අදාළව සේවක අර්ථසාධක**

### අරමුදල් පනත සංශෝධනය කිරීම

සේවකයකු සේවයට බඳවා ගෙන දින 30ක් ඇතුළත සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයට අදාළ කම්කරු කාර්යාලයේ ලියාපදිංචිය සඳහා සේවායෝජකයා විසින් විස්තර යැවීම අනිවාර්ය කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනතේ නියෝග සංශෝධනය කිරීමට අපේක්ෂිතය. වර්තමානයේ පවත්නා නෛතික ප්‍රතිපාදන අනුව එලෙස අනිවාර්යයෙන්ම සේවක විස්තර ලබා දීමට සේවායෝජක බැඳී සිටියත් යම් නිශ්චිත කාල රාමුවක් තුළ එම විස්තර ලබා දිය යුතු බවට සඳහනක් නැත. මේ හේතුවෙන් බොහෝ සේවායෝජකයන් තම සේවකයන්ගේ සේවක අර්ථසාධක දායක මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බැර කළ ද සේවකයන්ගේ විස්තර ඇතුළත් ABH ආකෘති සම්පූර්ණ කර කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම අතපසු කිරීම හේතුවෙන් සේවකයන් ප්‍රතිලාභ ඉල්ලුම් කරන අවස්ථාවේ දී විවිධ අපහසුතාවයන්ට ලක්වේ. එහෙයින්, ලියාපදිංචිය ප්‍රමාද කිරීම වළක්වා ගැනීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි නියෝග සංශෝධනයට අවශ්‍ය කටයුතු කරමින් පවතී. මෙය සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රතිපත්තිමය තීරණයක් ඉටු කිරීමක් ද වේ.

### සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට තම මාසික දායක මුදල් ගිණුම්ගත වීම පිළිබඳව ක්ෂණිකව දැනුම් දීම සඳහා ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් ක්‍රියාත්මක කිරීම

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයන්ගේ මාසික දායක මුදල් සේව්‍යයා විසින් ගෙවනු ලැබ ඇත්ද එම මුදල තම ගිණුමට ප්‍රේෂණය කිරීම හෝ නොකිරීම පිළිබඳව සාමාජිකයාට දැන ගැනීමට හැකියාවක් දැනට නොමැති අතර අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ මඟින් ගිණුමේ ශේෂය පමණක් සාමාජිකයාට දැනුම් දීම දැනට සිදු කෙරේ. ඉතා කෙටි කාලයක් තුළ අරමුදල් ගිණුම්ගත වීමේ තොරතුරු සාමාජිකයාට දැන ගැනීමට නොහැකිවීම හේතුවෙන් ගැටළු රාශියක් මතු වී ඇත. මාසිකව තම ගිණුමේ තොරතුරු සේවකයන්ට දැනුම් දීමට ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාවක් හඳුන්වා දීම තුළින් ගෙවීම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවල ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව අවධානයට යොමු කර කඩිනම් පියවර ගැනීමට සේවකයාට මෙමඟින් හැකිවනු ඇත. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර සේවක අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි සංශෝධනය තුළින් මෙම නව ප්‍රතිපාදන හඳුන්වා දීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

### විදේශ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම සඳහා පහසු කරවන පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම

ශ්‍රී ලාංකික සේව්‍යයෙකු යටතේ වෙනත් රටවල සේවය කරන සේවකයන් එරට සමාජ ආරක්ෂණ අරමුදලට ගෙවන දායක මුදල් ආපසු මව්රටට පැමිණීමේ දී රැගෙන ඒමට හැකි වන පරිදි අදාළ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමට අමතරව අදාළ රටවල් සමඟ සමාජ ආරක්ෂණ ගිවිසුම් අත්සන් කිරීමට අපේක්ෂා කෙරේ. එලෙස ගිවිසුම් අත්සන් කරන ලද රටවලට ශ්‍රී ලාංකික සේව්‍යයකු යටතේ සේවයට යන ශ්‍රී ලාංකික සේවකයින් සඳහා නොකඩවා ශ්‍රී ලංකාවේ සේවක අර්ථසාධක අරමුදලට දායකත්ව මුදල් ගෙවීමටත් අදාළ රටේ සේවායෝජකයකු යටතේ ශ්‍රී ලංකාවේ සේවයට පැමිණෙන විදේශික සේවකයන් සඳහා තම රටේ සමාජ ආරක්ෂණ අරමුදලට දායකත්ව මුදල් ගෙවීමටත් එකඟ වීම සිදු වේ.

### සේවකයන් අවම විශ්‍රාම ගැන්වීමේ වසය අවුරුදු 60 දක්වා ඉහළ නැංවීමට "අවම විශ්‍රාම වයස නියම කිරීමේ පනත" ලෙස නව පනතක් ගෙන ඒම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ සේවා තත්වයන් හා සේවා කොන්දේසි, සමාජ ආරක්ෂණය හා කාර්මික සම්බන්ධතා පිළිබඳව ශ්‍රී ලංකාවේ පවත්නා කම්කරු නීති අතර සේවකයින් විශ්‍රාම ගැන්වීමට අදාළ වයසක් නියම කෙරෙන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයක් දැනට දක්නට නොමැත. දැනට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ විශ්‍රාම වයස සේවක - සේව්‍ය දෙපාර්ශවය අතර ඇති කරගන්නා

සේවා ගිවිසුමේ හෝ සාමුහික ගිවිසුමේ සඳහන් කොන්දේසි අනුව තීරණය කරනු ලබයි. රාජ්‍ය අංශයේ සේවකයින්ට වයස අවු. 60 දක්වා සේවය කිරීමට හැකි වුවත්, බොහෝ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන සේවකයින් වයස අවු. 55 සම්පූර්ණ වීමේ දී හෝ ඊට අඩු වයසක දී විශ්‍රාම ගන්වනු ලබයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පුද්ගලයකුගේ සාමාන්‍ය ආයු අපේක්ෂාව අවු. 75ක් පමණ වන බැවින් ඊට අනුරූපීව පෞද්ගලික අංශයේ සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස යාවත්කාලීන කිරීම සඳහා අවම විශ්‍රාම වයස අවු. 60ක් ලෙස නීතිගත කිරීමට අමාත්‍ය මණ්ඩලයේ මූලික එකඟතාව හිමි වී ඇති අතර මේ සඳහා පනතක් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇත. මෙය සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ අයවැය යෝජනාවල ඇතුලත් ප්‍රතිපත්තිමය තීරණයක් ඉටු කිරිමක් ද වේ.

**ලෝකයේ නව ප්‍රවණතා සමඟ සේවකයාගේ වෘත්තීය ස්ථාවරත්වය**

නව තාක්ෂණික සහ විද්‍යාත්මක සොයා ගැනීම් අනුව, පවතින ව්‍යාපාරික ක්ෂේත්‍රයන් තුළ රැකියාවන්හි ස්වභාවය, වැඩ කළ යුතු කාලසීමාව, අවශ්‍ය සේවක සංඛ්‍යාව යන අංශයන්හි සිදු වන වෙනස්කම් සහ ඇතිවන රැකියාවන් හා ඒවායේ සේවකයන් හට මුහුණ දීමට සිදු තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කරමින් ඒ පිළිබඳව පර්යේෂණ පැවැත්වීම මඟින් ලබා ගන්නා තොරතුරු විශ්ලේෂණය කර සේවකයින්ගේ යහපත උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණවලට එළඹෙමින් සේවකයාගේ යහපත, ආරක්ෂාව සහ පහසුව පිළිබඳව අවශ්‍ය පසුබිම සැකසීමට කටයුතු කෙරේ.

එමෙන්ම, කොවිඩ් තත්ත්වය යටතේ නිෂ්පාදන ආයතන සහ සේවකයින් මුහුණ දුන් ගැටළු හා ඒවාට පිළියම් සොයාගත් ආකාරය පිළිබඳව කරන ලද පර්යේෂණවලින් හෙළිවන නව සොයාගැනීම් පිළිබඳව තොරතුරු රැස් කිරීම සඳහා පර්යේෂණ පත්‍රිකා 2020 වර්ෂයේ දී කැඳවන ලද අතර "කොවිඩ් - 19 : සේවක ගැටළු සහ ප්‍රතිචාර" (Covid - 19 : Labour Issues and Responses) හිසින් යුතුව ජර්නලක් වශයෙන් මුද්‍රණයේ පවතී. මෙබඳු ජාතික ව්‍යසන හමුවේ නිෂ්පාදන ආයතන පවත්වා ගෙන යාමේදී අවශ්‍ය මඟපෙන්වීම් කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයේ දී දත්ත මූලාශ්‍රයක් වශයෙන් භාවිතා කිරීමට මෙම තොරතුරු යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**කම්කරු සුභසාධනය සහ ප්‍රජා ඵලදායිතාවය**

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව "ඵලදායි පවුල" යන තේමාව මුල් කර ගෙන කම්කරු ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම සඳහා පහත පැතිකඩයන් ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ආර්ථික
- පිළිවෙල සහ සමාජීය තත්වය
- අධ්‍යාපනය
- සෞඛ්‍ය හා ආරක්ෂාව
- සංස්කෘතික සහ අධ්‍යාත්මික ගුණ වගාව

එසේම, කම්කරුවන් වෙත සෘජුව සේවා සපයන ආයතනයන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාවලි සරල කිරීමට සහ ඵලදායීතාවය ඉහළ නැංවීමට විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

**සේවා සැපයීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම**

- **පරිගණකගත පද්ධති මඟින් සේවාවන් ක්ෂණිකව සැපයීම**

සේවක අර්ථසාධක අරමුදල් කටයුතු සඳහා පරිගණකගත ක්‍රම භාවිතා කළ ද එය ප්‍රතිලාභ අයදුම් කිරීමේ සිට ප්‍රතිලාභ ගෙවීම දක්වා සියලු කටයුතු අන්තර්ජාලය හරහා සිදු කිරීමට පහසුකම් සැලසීම දක්වා වර්ධනය කර ගත යුතු වේ. එසේම, අප්‍රමාදීව සේවා ලබා දිය යුතු අනෙකුත් කාර්යයන් සහ සේවාලාභීන්ට සියලුම සේවාවන් එකම ස්ථානයකින් / කවුළුවකින් ලබා දීමට හැකිවන පරිදි ජාලගත පරිගණක පද්ධතියක් මඟින් ක්ෂණිකව සේවා ලබා දීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති ආරම්භ කර ඇත.

- **ශ්‍රමිකයාගේ පහසුව සලසන කම්කරු කාර්යාල ජාලය පුළුල් කිරීම**

දැනට පහසුකම් සහිත කාර්යාල නොමැති දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල වන හැටන්, බදුල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කම්කරු කාර්යාල රු. මි. 600ක වියදමින් ඉදි

කරමින් පවතින අතර අම්බලන්ගොඩ සහ දඹුල්ල උප කම්කරු කාර්යාලය රු. මි. 156ක වියදමින් ඉදි කොට ස්ථාපිත කරන ලදී.

**කාන්තා සේවා නියුක්තිය දිරිගැන්වීම**

ශ්‍රී ලංකාවේ ජනගහණ අනුපාතය අනුව 51%ක් පමණ කාන්තාවන්ගෙන් සමන්විත වන අතර ඉන් 34%ක පමණ පිරිසක් ශ්‍රම වෙළඳපළට දායකත්වය සපයයි. සාප්පු හා කාර්යාලයීය සේවක පනතේ වර්තමාන ප්‍රතිපාදන අනුව, සාප්පු හා කාර්යාලවල කාන්තාවන් සේවයේ නියුක්ත කරවීමට විශේෂ අවසරය ලබා දුන් ආයතනවල හැර සේවයෙහි යෙදවිය හැකි වන්නේ රාත්‍රී 8 දක්වා පමණි. වර්තමානයේ තොරතුරු තාක්ෂණය පදනම් කරගෙන දැනුම් ක්‍රියාවලිය බැහැරින් සපයා ගැනීමේ (Knowledge Process Outsourcing) හා ව්‍යාපාර ක්‍රියාවලිය පිටතින් සපයා ගැනීමේ (Business Process Outsourcing) ව්‍යාපාර සඳහා වෙනත් රටවල පිහිටි ව්‍යාපාර ආයතන සඳහා ගිණුම් පරිපාලනය හා තාක්ෂණික කටයුතු සපයන පසු කාර්යාල (Back Office) රැකියා රාශියක් ශ්‍රී ලංකාවේ බිහිවෙමින් පවතී. මෙම රැකියාවල නියුක්ත සේවකයන්ට වෙනත් රටවල කාල වේලාවන් සමඟ සැසඳෙන ආකාරයට සේවය කිරීමට සිදුවන බැවින් කාන්තාවන්ට රාත්‍රී සේවයේ නියුක්ත වීමට අවකාශය සැලසෙන පරිදි සාප්පු හා කාර්යාලයීය සේවක පනතේ නෛතික ප්‍රතිපාදන සංශෝධනය කර කාන්තාවන් සඳහා රැකියා අවස්ථාවන් පුළුල් කිරීමට අපේක්ෂිතය. මෙය සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්තිමය කරුණක් ඉටු කිරීමක් ද වේ.

කාන්තාවන් රැකියාව හේතුවෙන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම පිණිස "Women at Work" තේමාව යටතේ වන විද්වත් කතිකාව සඳහා 2020 වසරේ දී පර්යේෂණ පත්‍රිකා කැඳවන ලද අතර විද්වත් කතිකාව මාර්ගගත ක්‍රමය ඔස්සේ 2021 වර්ෂයේ දී සිදු කිරීමට නියමිතය.

ස්වයං රැකියාවල නිරතවන කාන්තාවන්ට ඵලදායිතා මාර්ගෝපදේශනය ලබා දීමත්, කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමත් ඒ තුළින් ජාතික ඵලදායිතාව සහ දළ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රජා ඵලදායිතා වැඩසටහන් යටතේ නියමු වැඩසටහනක් ආරම්භ කිරීම.



**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**
ලේකම්
කම්කරු අමාත්‍යාංශය



# තුන්වන පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන
සමස්ත මූල්‍ය කාර්යසාධනය

# සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**ඒසීඒ-එෆ්**

| අයවැය 2020 | | සටහන | තතය 2020 (රු.) | 2019 (රු.) | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 597,229,588 | 296,458,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 145,447,356 | 247,750,937 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 10,393,617 | 12,290,943 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 28,682,525 | 6,527,260 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **781,753,086** | **563,027,140** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **781,753,086** | **563,027,140** | |
| | | | | | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | |
| 472,840,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 448,056,510 | 80,864,955 | ඒසීඒ-2(ii) |
| 149,210,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 127,232,243 | 89,772,765 | ඒසීඒ-2(ii) |
| 55,050,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 54,723,510 | 37,237,277 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | | | ඒසීඒ-2(ii) |
| 50,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | 74,841 | ඒසීඒ-2(ii) |
| **677,150,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **630,012,263** | **207,949,838** | |
| | | | | | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,650,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,007,462 | 664,006 | ඒසීඒ-2(ii) |
| 2,950,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 2,078,047 | 91,029,172 | ඒසීඒ-2(ii) |
| 2,200,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 2,200,000 | 4,657,937 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 11,500,000 | හැකියා වර්ධනය | 14 | 6,023,249 | 867,218 | ඒසීඒ-2(ii) |
| 4,800,000 | වෙනත් මූලධන වියදම් | 15 | 4,465,785 | 13,860,467 | |
| **25,100,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **17,774,542** | **111,078,800** | |

| | | | |
|---|---|---|---|
| **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | **156,322,821** | **260,155,253** | |
| **තැන්පතු ගෙවීම්** | **151,093,603** | **243,426,324** | ඒසීඒ-4 |
| **අත්තිකාරම් ගෙවීම්** | **5,229,218** | **16,728,929** | ඒසීඒ-5 |
| **ආදායමෙන් ආපසු ගෙවීම්** | | | |
| **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | **804,109,627** | **579,183,891** | |
| | | | |
| - **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)** | **(22,356,541)** | **(16,156,752)** | |

## 3.2 2020.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

| | | තතය | |
|---|---|---|---|
| | **සටහන** | **2020 (රු.)** | **2019 (රු.)** |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 582,687,237 | 575,898,787 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5 | 55,524,372 | 60,688,772 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | |
| මුළු වත්කම් | | 638,211,609 | 636,587,559 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 38,779,611 | 38,349,015 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 582,687,237 | 575,898,787 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 16,474,737 | 22,120,984 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 270,024 | 218,773 |
| **මුළු වගකීම්** | | **638,211,609** | **636,587,559** |

පිටු අංක 7 සිට 57 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 58 සිට 70 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

..............................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
දිනය : 2021.06.30

**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**
**ලේකම්**
**කම්කරු අමාත්‍යාංශය**
**7 වන මහල, "මෙහෙවර පියෙස"**
**නාරාහේන්පිට**
**කොළඹ - 05**

..............................................
ගණන්දීමේ නිලධාරි
දිනය : 2021.06.30

ජේ. ඒ. ඩී. එස්. නිශාමිණි
ප්‍රධාන ගණකාධිකාරි
කම්කරු අමාත්‍යාංශය,
6 වන මහල, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට,
කොළඹ 05.

## 3.3 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

| | තතය | |
|---|---|---|
| | 2020 (රු.) | 2019 (රු.) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | 28,682,525 | 6,527,260 |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් | 628,523,532 | 296,458,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **657,206,057** | **302,985,260** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 612,095,558 | 189,683,214 |
| සහනාධාර සහ මාරුකිරීම් | 11,200,000 | 20,667,239 |
| වෙනත් වැය ශීර්ෂ | 2,134,705 | |
| භාණ්ඩාගාරයට ආපසු යැවීම් | 31,293,944 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **656,724,207** | **210,350,453** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **481,850** | **92,634,807** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | 7,517,242 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **7,517,242** | **-** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 6,788,450 | 90,893,985 |
| අත්තිකාරම් ගෙවීම් | 6,856,889 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **13,645,339** | **90,893,985** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(6,128,097)** | **(90,893,985)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(5,646,247)** | **1,740,822** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| තැන්පතු ආපසු ලැබීම් | 145,447,356 | |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **145,447,356** | **-** |

| | | |
|---|---|---|
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් | 151,093,603 | 1,740,822 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **151,093,603** | **1,740,822** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෟ)-(එ)** | **(5,646,247)** | **(1,740,822)** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ) - (ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහි දී වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. අවසන් ගිණුමෙහි ඇති සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් සහ අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති අතර ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**වගුව 3-1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය** — රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| හිස් වාර්තාවකි | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වගුව 3-2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය** — රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 677,150 | 677,150 | 630,012 | 93 |
| ප්‍රාග්ධන | 25,100 | 25,100 | 17,775 | 71 |

## 3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගුව 3-3 වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 01 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2019 වර්ෂයේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 800 | 800 | 740 | 93 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වගුව 3-4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 26,824 | 26,824 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 555,864 | 555,864 | | |



ඡායාරූපය 3-1 නිපුණ විදේශ රැකියා බලකායක් ඇති කිරීම සඳහා මූලික සාකච්ඡා

## 3.9 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | LEW/A/MOL/2/2020/6 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 ජූනි 30දින |

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

කම්කරු අමාත්‍යාංශය

**කම්කරු අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කම්කරු අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පහත සඳහන් අවස්ථාවේ හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ පූර්ව වර්ෂයේ අවසාන ශේෂ මෙම වර්ෂයේ සැසඳුම් ලෙස ඉදිරිපත් කිරීමේදී පූර්ව වර්ෂයේ පැවති ශේෂවලට,ජාතික එළදායිතා ලේකම් කාර්යාලයෙන් වර්ෂය තුළදී පවරා ගන්නා ලද ශේෂ එකතු කර තිබූ නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය හා කාර්යසාධන වාර්තාවට අනුව අමාත්‍යාංශය සඳහා ශීර්ෂ අංක 193 හා 054 යටතේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම රු.597,229,588 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත අනුව එම ලැබීම්වලින් කම්කරු අමාත්‍යාංශයට අදාල ලැබීම් රු.598,054,000 ක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ අනුව මූල්‍ය කාර්යසාධන වාර්තාව හා භාණ්ඩාගාර මුද්‍රිත අතර අග්‍රිම ලැබීම්වල රු.824,412 ක වෙනසක් නිරීක්ෂණය විය.2019 වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශය නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් පියවා නොතිබූ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු අග්‍රිම ශේෂය රු. 693,138 ක් වර්ෂය තුලදී පියවීම හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කල අග්‍රිම වටිනාකමක රු.131,273 ක් වැඩියෙන් දැක්වීම මෙම වෙනස සඳහා හේතු වී තිබුණි.

(ආ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් සැසඳීමේදී පිළිවෙලින් රු.174,605 ක් හා රු.324,726 ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) අත්තිකාරම් බී ගිණුම

(i) 2020 නොවැම්බර් 30 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2020 හි 14 ඡේදය අනුව යම් අමාත්‍යාංශයකට අදාල කාර්යන්ගෙන් කොටසක් පමණක් වෙනත් අමාත්‍යාංශ වෙත පවරන අවස්ථාවලදී හුවමාරු වන කාර්ය මණ්ඩලය සලකා බලා ණය ශේෂයන් මාරු කිරීමට කටයුතු කල යුතුය.ඒ අනුව 2020 සැප්තැම්බර් 01 දින කම්කරු අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබූ එලදායිතා ලේකම් කාර්යාලයේ අත්තිකාරම් බී ගිණුමේ ආරම්භක ශේෂය වූ රු. 40, 851,695 ක් අත්තිකාරම් ගෙවීම් යටතේ මූල්‍ය කාර්යසාධන වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. එසේ වුවද ඒ.සී.ඒ -5 ප්‍රකාශයේ මෙම ගෙවීම් ඇතුලත් කර තිබූ අතර, එප් අනුව ඒ.සී.ඒ -5 ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අතර රු.40 851 695 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) භාණ්ඩාගාර අවසාන මුද්‍රිත ප්‍රකාශ හා සැසඳීමේදී ගිණුම් ප්‍රකාශනවල හා ඒ.සී.ඒ -5 වාර්තාවේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් රු.2,980,639 බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික එලදායිතා ලේකම් කාර්යාලයට අදාලව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් කම්කරු අමාත්‍යාංශය වෙත 2020 සැප්තැම්බර් මස පවරා දුන් මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.55,305,211 ක් වුවත් ලෙජර ගිණුමේ ශේෂය වූ රු.84,266,530 ක් අමාත්‍යාංශය විසින් පවරා ගැනීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් රු.28,961,319 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ඒ.සී.ඒ-6 ආකෘතියේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA-80) අතර මූල්‍ය නොවන වත්කම්වල වෙනස රු.28,961,319 විය යුතු වුවද එම වෙනස රු.18,973,067 ක්

ලෙස දැක්වුණි.මේ සඳහා හේතු විගණනයට අනාවරණය නොවුණි.තවද මූල්‍ය නොවන වත්කම්වල අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.18,973,067 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් යටතේ දේපල පිරියත හා උපකරණ සංචිතයද එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඒසීඒ-2(i) ආකෘතිය ප්‍රකාරව වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් වල වටිනාකමට වඩා රු.50,930 ක් අඩුවෙන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) දක්වා තිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 6 හා 7(v) ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධනය යටතේ දක්වා තිබූ ශුද්ධ වත්කම් ශේෂය ලබාගත යුත්තේ අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම් වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙනි. ඒ අනුව අමාත්‍යාංශයේ අත්තිකාරම් වටිනාකමින් තැන්පත් ගිණුම්වල වටිනාකම අඩු කල පසු වටිනාකම රු.39,049,635 ක් (55,524,372 – 16,474,737) ශුද්ධ වත්කම් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.38,779,611 ක් වූ අතර ඒ අනුව වෙනස රු.270,024 ක් විය. එම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම්වල අගය රු.270,024 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

### 1.6.2.2 මූල්‍ය වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ මුදල් හා මුදල් සමාන දෑ වල අගය ලෙස ඒසීඒ-3 ප්‍රකාශයේ සඳහන් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව නොපියවූ අග්‍රිම ශේෂය දැක්විය යුතු වුවත් භාණ්ඩාගාර සටහන් අනුව දැක්වෙන රු.270,024 ක ශේෂය මූල්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි. කෙටුම්පත් වාර්තාව සඳහා ලේකම්වරයා විසින් ලබා දී තිබූ පිළිතුර අනුව අග්‍රිම ශේෂය අමාත්‍යාංශය විසින් විදේශ රැකියා අමාත්‍යාංශය වෙත පියවිය යුතු ශේෂයක් වේ.

### 1.6.3 අග්‍රිම ගිණුමේ ශේෂය

ඒ.සී.ඒ-3 ප්‍රකාශය අනුව විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද ශුද්ධ අග්‍රිම ප්‍රමාණය රු.61,630,129 ක් වුවද එම නිවැරදි ශේෂය 61,498,856 ක් වූයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද අග්‍රිම රු.131,274 ක් වැඩියෙන් දක්වා තිබුණි.තවද ඒ.සී.ඒ-3 ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය යටතේ උප අග්‍රිම ශේෂය යටතේ

කම්කරු අමාත්‍යාංශයට අදාල ශේෂය ලෙස රු.270,024 ක් දක්වා තිබූ නමුත් නිවැරදි ගණනය කිරීම් අනුව එම ශේෂය රු.138,750 ක් විය යුතු බව නිරීක්ෂණය විය.

**1.6.4** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**1.6.4.1**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර ලැබීම්

වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය වූ රු.628,654,806 ක් අග්‍රිම ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවත් අග්‍රිම ලැබීම් ලෙස රු.628,523,532 ක් දක්වා තිබුණි. මේ අනුව රු.131,274 ක් අඩුවෙන් අග්‍රිම ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්ථන වියදම්

වර්ෂය සඳහා ශීර්ෂ අංක 054 හා 193 යටතේ අමාත්‍යාංශය විසින් දරන ලද පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම් හා සහනාධාර සහ මාරුකිරීම් ලෙස රු.623,295,556 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් ශේෂ පිරික්සුම හා ඒසීඒ-2(ii) වියදම් ප්‍රකාශ අනුව එම වියදම රු.621,217,511ක් විය. ඒ අනුව ශේෂ පිරික්සුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අතර පුද්ගල පඩිනඩි, මෙහෙයුම් වියදම් හා සහනාධාර සහ මාරුකිරීම්වල රු.2,078,045 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.6.4.2** ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වියදම්

භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කරගැනීම් සඳහා වර්ෂය තුලදී වැයකරන ලද මුදල් රු.6,788,450 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ තුළ වන්දි කොමසාරිස් කාර්යාලයෙන් මාරු කරන ලද වත්කම් අගය රු.5,429,776 ක්ද ඇතුලත් කර තිබුණි. කෙසේ වුවද ශීර්ෂ අංක 054 හා 193 ශේෂ පිරික්සුම් අනුව එම වියදම රු.2,078,047 ක් විය. ඒ අනුව රු.4,710,403 ක වෙනසක් නිරීක්ෂණය විය

පිටුව 7 | 13

**1.6.5** 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

2020 අගෝස්තු 8 දින අතිගරු ජනාධිපතිතුමා විසින් අතිවිශේෂ ගැසට්පත්‍රයේ පල කිරීමෙන් පසු ශීර්ෂ 193 කම්කරු අමාත්‍යාංශය ආරම්භ විය. ඉහත සඳහන් උපදෙස් පරිදි 2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවති ශීර්ෂ අංක 054 අමාත්‍යාංශයේ වැය විෂයන් 89 ක් යටතේ වැය කර තිබුණු එකතුව රු.මිලියන 388.8 ක වියදම ශීර්ෂ අංක 193 අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

අමාත්‍යාංශය සඳහා භාණ්ඩාගාරයේ අග්‍රිම ලැබීම් හා පියවීම එවකට තිබුණු අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම් අංකය යටතේ සිදුකර තිබුණි. එම අග්‍රිම ගිණුම් අංකය යටතේ භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.මිලියන 628.5 ක් ලෙස භාණ්ඩාගාර අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණත්, මෙම අමාත්‍යාංශයේ (ශීර්ෂ අංක 193) කටයුතු 2020 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වූ බැවින් එදින සිට වර්ෂ අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලෙස රු.මිලියන 241.7 ක් ලැබී තිබුණු අතර, ඉන් රු. මිලියන 30.6 ක් 2020 දෙසැම්බර් 31 දිනට මුදලින් භාණ්ඩාගාරයට පියවා තිබුණි.

**1.6.6** විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

ගිණුම් ප්‍රකාශනවල ඇතුලත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ අනෙකුත් ආයතනවලින් මාරුකල රු.5,429,776 ක් වූ වත්කම් වටිනාකම සනාථ කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක් සඳහා වෙන්කර තිබූ රු.13,850,000 ක ප්‍රතිපාදනයෙන් රු.6,875,341 ක් එනම් 49.6% ඉතිරිකර තිබුණි. එය එම වැය විෂයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 22 ක් සඳහා වෙන්කර තිබූ රු.134,724,000 ක ප්‍රතිපාදනයෙන් රු.24,921,437 ක් එනම් සියයට 18.5 ක් විය.එම ඉතිරිය වැය විෂයන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 100 දක්වා පරාසයක් තුල පැවතුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2020 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ බැරකම් ලේඛණය, මූල්‍ය ප්‍රකාශවල බැරකම් ශේෂයන් හා 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට වාර්තා කරන ලද බැරකම් පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැරකම් භාණ්ඩාගාර සටහන්වල (SA-92) දක්වා තිබූ බැරකම්වලට වඩා රු.969,410 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා නොකල කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2021 වර්ෂය තුලදී නිරවුල් නොකල යුතු වුවත් භාණ්ඩාගාරයේ වාර්තා නොවූ, අවස්ථා 17 කට අදාලව රු.706,983 ක් වූ බැරකම් 2021 වර්ෂය තුලදී නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ සටහන් වී තිබුණු රු.91,501 ක් වටිනා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) මු.රෙ. 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන නොමැති නම් කිසිම වියදමකට හෝ බැරකමකට නොබැඳිය යුතු අතර ඒ වෙනුවෙන් වූ වියදම ප්‍රතිපාදනය නොඉක්මවිය යුතුය. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ඉක්මවා රු.533,965 ක් වටිනා බැරකම්වලට එළඹ තිබුණි.

(ඈ) 2020 වර්ෂයට බැඳීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුලත් නොකරන ලද රු.117,719 ක් වූ බැරකම් 2021 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

2008 පෙබරවාරි 06 දිනැති අංක 2008/05 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කලයුතු වුවත් 2020 වර්ෂයට අදාලව අමාත්‍යාංශය විසින් චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර නොතිබුණි.

2.4 අවිධිමත් ගණුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබූ පිරිවැය රු.1,625,781 ක් වූ Sony PXW- Z150 වර්ගයේ කැමරාව සඳහා නියමිත සංස්කරණ මෘදුකාංගය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මිලදී ගෙන නොතිබුණි.

(ආ) පිරිවැය රු.535,695 ක් වූ Sony HXR NX 5P වර්ගයේ වීඩියෝ කැමරාවක් අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට ප්‍රසම්පාදන අනුමැතියද රහිතව සිංගප්පූරුවේ පිහිටි මව් සමාගම වෙත යවා තිබුණි. පසුව එම ඇස්තමේන්තු වටිනාකමට ප්‍රසම්පාදන අනුමැතිය නොලැබීම හේතුවෙන් කැමරාව නැවත මෙරටට ගෙන්වා තිබුණි. මේ සඳහා රු.15,000 ක ප්‍රවාහන ගාස්තු ගෙවීමට සිදුවී තිබූ අතර මෙම වීඩියෝ කැමරාවේ අලුත්වැඩියා කටයුතු සඳහා සිංගප්පූරුවේ මව් සමාගමෙන් එවන ලද රු.261,000 ක (කැමරාවේ වර්තමාන මිලෙන් සියයට 48 ක් පමණ වන) ඇස්තමේන්තුව 2019 දෙසැම්බර් 02 දින ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර තිබුණු අතර මෙම කැමරාව 2021 මාර්තු 30 දින වන විටද අමාත්‍යාංශය වෙත ගෙන්වාගෙන නොතිබුණි.

2.5 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක නොවන අනතුරු හා මාරක අනතුරු හේතුවෙන් සේවායෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකරගත් වන්දි මුදල්වලින් 2020 දෙසැම්බර් 31 වන විට රු.6,837,248 ක ශේෂයක් නිරවුල් නොකර පැවතුණි. සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ නිවැරදි තොරතුරු නොමැතිවීම, ප්‍රතිලාභීන්ගේ වන්දි මුදල් ගෙවීමට අදාල

ලියකියවිලිවල අඩුපාඩු හා ඒවා කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම යනාදී හේතු නිසා මෙම වන්දි මුදල් ගෙවීමට නොහැකිව පැවතුණු අතර එහි ප්‍රමාද කාලය මාස 05 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) වන්දි මුදල් නොගෙවීම නිසා වරෙන්තු වශයෙන් පවතින උසාවි 08 කට අදාල නඩු ගොනු 48 ක් පැවති අතර අනතුර වාර්තා වූ දින සිට 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 04 ත් අවුරුදු 24 ත් අතර කාල පරාසයක පැවති අයකරගත යුතු වන්දි මුදල රු.12,988,494 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වන්දි මුදල් තැන්පත් කලද නියම යැපෙන්නන් සොයාගැනීමට නොහැකිවීම නිසා වන්දි මුදල් බෙදා නොදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නාමින් වෙන් වෙන් වශයෙන් ගිණුම් පවත්වා තිබූ අතර ඒවායෙහි තැන්පත් කර තිබූ මුදල 2020 දෙසැම්බර් 31 දිනට රු.2,023,095 ක් බව අනාවරණය විය.

(ඈ) රැකියාවේ නියුතුව සිටියදී සිදුවූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වයස් පූර්ණත්වයට පත් වූ පසු එම මුදල් ඔවුන් වෙත ලබාදීම සිදුකල යුතු වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට වයස පූර්ණත්වයට පත්ව ප්‍රතිලාභ නිදහස් නොකරන ලද ගිණුම් 534 ක් පැවති අතර එම වන්දි මුදල්වල වටිනාකම රු.20,861,229 ක් විය. ඒ තුල රු.11,782,761 ක් වූ 2016 වර්ෂයට පූර්ණත්වයට පත් ගිණුම් 459 ක්ද රු.8,563,187 ක් වූ 2020 වර්ෂය තුළ පූර්ණත්වයට පත් ගිණුම් 66 ක්ද විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

2019 හා 2020 වර්ෂයන් තුලදී සිදුවූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 වන විටත් මුදල් රෙගුලාසි අංක 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 අයවැය යෝජනා යටතේ පූලි වර්ජකයන්ට සහන සැලසීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අගෝස්තු 18 දින ජාතික අයවැය අධ්‍යක්ෂකගේ අංක BD/GPS/JS/2/14-2015 දරන ලිපිය මගින් ලබාදී තිබූ උපදෙස්වලට අනුව කටයුතු කරමින් අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් සකස් කර නොතිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම, ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම, පිළිගත නොහැකි දිවුරුම් ප්‍රකාශ සමඟ අයදුම්පත් නිර්දේශ කිරීම වැනි කටයුතු සිදුකර තිබුණි. 2020 දෙසැම්බර් මාසය වන තෙක් මෙම ක්‍රියාවලිය විධිමත්ව සිදු කර නොතිබුණි. අයදුම්පත් නිර්දේශ කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් එකම පුද්ගලයාගේ අයදුම්පත් දෙවරක් නිර්දේශ කිරීම නිසා පුද්ගලයින් 4 දෙනෙකු සඳහා රු.1,000,000 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය.

(ආ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තරඟාවලි 3ක් සඳහා රු. මිලියන 59.1 ක් වැය කරමින් ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයේ ප්‍රධාන අරමුණක් වන ඵලදායීතා තරඟාවලිය හා සම්මාන උළෙල පැවැත්වීම හා ආයතන තෝරාගෙන සම්මාන ලබාදීම සිදුකලද සම්මාන ලබන ආයතනවල එම තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව පසු විපරම් කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයට අනුබද්ධිත සියලු ආයතන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් එක් කාල සීමාවකදී එක් දිස්ත්‍රික්කයක සිදුකිරීම තුලින් සේවා සේවක ප්‍රජාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් අරමුණු කරගෙන ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. පසුගිය වසර 05 ක තොරතුරු විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූ පරිදි බදුල්ල දිස්ත්‍රික්කයේ 04 ක් රත්නපුර දිස්ත්‍රික්කයේ 03 ක් හා කොළඹ දිස්ත්‍රික්කයේ 01 ක් වශයෙන් ජංගම සේවා 8 ක් පමණක් පවත්වා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 15 | 08 |
| (ii) තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 75 | 47 | 28 |
| (iv) ප්‍රාථමික මට්ටම | 34 | 27 | 07 |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 01 | 01 |
| එකතුව | 138 | 93 | 45 |

ටී.ජී.අයි. පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට





# සිව්වන පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

# කාර්යසාධන දර්ශක

වගුව 4-1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 01 | ශ්‍රමික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අළුතින් පනවන ලද / සංශෝධනය කරන ලද නීති සංඛ්‍යාව * | 01 | 03 | 08 |
| 02 | අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා කිරීම් සංඛ්‍යාව | 100% | | |
| 03 | කාර්මික සාමය වර්ධනය සඳහා එළඹි ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව * | 06 | | |
| 04 | වර්ෂය තුළ සිදු කළ සමස්ත කම්කරු පරීක්ෂණයන්ගෙන් ගුණාත්මකභාවයෙන් ඉහළ (A සහ B) කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය | | 79% | |
| 05 | ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවෙන් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | 57%** |
| 06 | ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලිවලින් පරීක්ෂණ සිදු කර අවසන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | | 79% | |
| 07 | සමාජ කතිකාව උදෙසා පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව ඉලක්කයෙහි ප්‍රතිශතයක් ලෙස | | | 70% |
| 08 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ දින 14ක් තුළ ගෙවීම් ප්‍රතිශතය | | | 68% |
| 09 | සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව වෙනුවෙන් බිහි කළ සුරක්ෂිතතා නිලධරයන් සංඛ්‍යාව | | 78% | |
| 10 | කම්කරු නීති පිළිබඳ ශ්‍රම බලකාය දැනුවත් කිරීම වෙනුවෙන් පවත්වන ලද පාඨමාලාවන් සංඛ්‍යාව | 100% | | |
| 11 | වෘත්තීය අනතුරු (මාරක හා මාරක නොවන) සම්බන්ධයෙන් අවසන් කළ යුතු නඩු සංඛ්‍යාවෙන් අවසන් කරන ලද සංඛ්‍යාව | | | 61% |
| 12 | ඵලදායිතා සංකල්ප පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබා දුන් සංඛ්‍යාව | 95% | | |

**සටහන**

*- අවශ්‍යතා ඇති වන පරිදි එම ක්‍රියාකාරකම් සිදු කරන බැවින් අවසන් නිමැවුම නිශ්චිත නැත. එබැවින් ප්‍රතිශත වශයෙන් ඉදිරිපත් කළ නොහැක

** - වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන්හිදී සම්පූර්ණයෙන්ම නවතා තිබීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීමට සිදු වීම හේතුවෙන් ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව සිදු කිරීම අපහසු විය



# පස්වන පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

# 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

වගුව 5-1 අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ | 1.1.1 | ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහණයේ අනුපාතය | පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පැවති මාසික අවම වැටුප වන රු 10,000.00ක මුදල රු. 2,500.00කින් වැඩි කිරීම සඳහා ජාතික අවම වේතන පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම |
| | | 1.3 | පහළ මට්ටමේ අය ද ඇතුළත්ව සියලුම පුද්ගලයන් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවධානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම | 1.3.1 | සමාජ ආරක්ෂණ තල / ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහණයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ළමුන්, රැකියා වියුක්ත පුද්ගලයන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන්, ගර්භණී කාන්තාවන්, ළදරුවන්, රැකියා ආශ්‍රිත අනතුරුවලට ගොදුරු වුවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම්හි ප්‍රමාණය | සේවක අර්ථසාධක අරමුදල මගින් ආවරණය සැපයෙන පුද්ගලයන් සංඛ්‍යාව මිලියන 2.91 කි (සක්‍රීය සාමාජික සංඛ්‍යාව) |
| 05 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 | ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | 2020 වර්ෂයේ කාන්තා දිනය නිමිති කොටගෙන පෞද්ගලික අංශයේ විවිධ ආයතනයන්හි සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ගේ ප්‍රසූත නිවාඩු ලබා දීම සහ මව් කිරි දීමේ විවේකය නිසි පරිදි ලබා දෙන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සමූහ පරීක්ෂණ මාලාවක් පවත්වන ලදී<br>කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය වෙත ලැබුණු පැමිණිලි 23ක් සම්බන්ධයෙන් අදාළ කටයුතු කිරීම සහ පරීක්ෂණ 06ක් අවසන් කිරීම<br>ආයතන 607ක් ආවරණය වන පරිදි කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණසිදු කිරීම.<br>කම්කරු දෙපාර්තමේන්තුව විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි විධායක කාර්ය මණ්ඩලය, කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අවසන් වසර සිසුන්, කාන්තාවන්ට හා ළමයින්ට අදාළ නීතිය පිළිබඳව දැනුවත් කිරීම් වැඩසටහන් 02ක් සිදු කිරීම |
| | | 5.2 | මානව කූට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 | පසුගිය මාස 12ක කාලය තුළදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි / සිටින, වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය | |
| | | 5.ඇ | ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම, ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ.1 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.5 | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ |
| | | | | 8.5.2 | ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | |
| | | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1 | ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | ළමා ක්‍රියාකාරකම් වාර්තාව (Child Activity Survey - 2016) අනුව මෙරට ළමා ශ්‍රමය 1% වන අතර ශුන්‍ය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී |
| | | 8.8 | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වූවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | රැකියාව සම්බන්ධ මාරක හා මාරක නොවන අනතුරු සිදු වීම වාර්තා වුවත් එය ස්ත්‍රී පුරුෂභාවය අනුව සහ සංක්‍රමණික තත්වය අනුව වාර්තා තබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී |
| | | | | 8.8.2 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස පවතින අතර, ඒ අනුව, 2020.12.31 දිනට මෙරට ලියාපදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව 1,843කි එසේම, සාමූහික කේවල් කිරීමේ (C98) හා රැස්වීමේ නිදහස (C87) සඳහා වූ සම්මුතීන්වලට අදාළ වාර්ෂික වර්තා නියමිත දිනට පෙර ILO වෙත යැවීමට කටයුතු කර ඇත. එම වාර්තාවල සඳහන් වූ කරුණුවල අඩුපාඩු ඉතා අවම බව ILO විද්වත් කමිටුවේ නිරීක්ෂණ තුළ සඳහන්ව ඇත. |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම තුළින් වඩා හොඳ සංවර්ධන මට්ටමක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. තිරසර සංවර්ධන සභාව විසින් ශ්‍රී ලංකාවට අදාළ වන පරිදි දර්ශක හා එම දර්ශකවලට අදාළව පාදක දත්ත හා එම දර්ශක අතරින් එක් එක් අමාත්‍යාංශය විසින් අත්පත් කර ගත යුතු ඉලක්ක හඳුන්වා දිය යුතු වේ. මේ සම්බන්ධව එම සභාව විසින් තිරසර සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සහ උපමාර්ග කෙටුම්පත් කර අප අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව නිරීක්ෂණ ලබා ගෙන ඇත. අනතුරුව එම සභාව විසින් අවසන් කෙටුම්පත පිළියෙල කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත ලබා දිය යුතු වේ. එම කාර්යය නිම වන තුරු අප විසින් අප විෂයපථයට අදාළව තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ වන ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ. හඳුනාගත් දර්ශක ඉහත සඳහන් වේ.

තිරසර සංවර්ධන අරමුණු අතුරින් 8 වන අරමුණ වන තිරසර හා සංයුක්ත ආර්ථික වර්ධනය, සැමට පූර්ණ හා ඵලදායී රැකියා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය (Promote sustained inclusive and sustainable economic growth, full and productive employment and decent work for all) සාක්ෂාත් කර ගැනීම මෙම අමාත්‍යාංශයේ දායකත්වය සැපයිය යුතු ප්‍රධාන තිරසර සංවර්ධන අරමුණු වන වේ. එසේම, ක්‍රියාකාරී සැලැස්මෙහි සෑම ක්‍රියාකාරකමකටම අදාළව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබේ. විශේෂයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන සියලුම කාර්යයන්, මෙම අමාත්‍යාංශයට අදාළ ප්‍රධාන තිරසර සංවර්ධන අරමුණු වන අරමුණු අංක 08 : සුනිසි වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම සහතික කිරීම සඳහා අදාළ වේ.

සියලු තොරතුරු ස්ත්‍රී පුරුෂභාවය අනුව බෙදා වෙන් කළ යුතු වුවත්, අපගේ මෙතෙක් අනුමනය කළ ක්‍රියාපිළිවෙල තුළ එසේ වාර්තා වීමක් නොමැති අතර ඉදිරියේ දී ඒ සඳහා පියවර ගත යුතු වේ. එසේම, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් පිළිබඳව ද තොරතුරු රැස් කළ යුතු වේ.

2020 වර්ෂයේදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂය තුළ සිදු කිරීමට ඉලක්කගත ක්‍රියාකාරකම් බොහොමයක අදාළ ඉලක්ක කරා ළඟා වීම අපහසු විය



ඡායාරූපය 5-1 ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිත හමුව



# සයවන පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**වගුව 6-1 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංයුතිය**

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතිය මට්ටම | | ද්විතිය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය |
| 01 | අමාත්‍යාංශ කාර්යාලය | 23 | 15 | 04 | 03 | 75 | 46 | 35 | 27 | 137 | 91 | 34% |
| 02 | කමකරු දෙපාර්තමේන්තුව | 211 | 131 | 668 | 494 | 1,756 | 1,483 | 489 | 436 | 3,124 | 2,544 | 19% |
| 03 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 13 | 04 | 18 | 07 | 05 | 02 | 45 | 16 | 64% |
| 04 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 07 | 02 | 03 | 02 | 10 | 08 | 05 | 05 | 25 | 17 | 32% |
| 05 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 05 | 02 | 02 | 01 | 31 | 27 | 05 | 03 | 43 | 33 | 23% |
| 06 | ජාතික එළදායිතා ලේකම් කාර්යාලය | 17 | 08 | 04 | 03 | 792 | 655 | 19 | 11 | 832 | 677 | 19% |
| | එකතුව | 272 | 161 | 694 | 507 | 2,682 | 2,226 | 558 | 484 | 4,206 | 3,378 | 20% |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හිඟය පහත පරිදි වේ.

| | |
|---|---|
| • ජ්‍යෙෂ්ඨ මට්ටම | 111 |
| • තෘතීය මට්ටම | 187 |
| • ද්විතීය මට්ටම | 456 |
| • ප්‍රාථමික මට්ටම | 74 |
| **එකතුව** | **828** |

මෙම මානව සම්පත් හිඟය හේතුවෙන් නිලධාරීන්ට තමාට නියමිත රාජකාරිවලට අමතරව පුරප්පාඩු තනතුරුවල ද රාජකාරි ඉටු කිරීමට සිදුවේ. විශේෂයෙන් විධායක නිලධාරි හිඟය ආයතනික ධුරාවලිය තුළ තීරණ ගැනීම, මූල්‍ය බලතල ආදී වගකීම් භාර ගැනීම මෙන්ම මඟ පෙන්වීම් පහසු කිරීම හා විධිමත් කිරීම වැනි අවස්ථාවලදී ප්‍රායෝගික ගැටළු උද්ගත වේ. ඒ හේතුවෙන් නිලධාරීන් කායිකව හා මානසිකව පීඩාවට පත් වන අතර නිලධාරීන්ගේ ප්‍රශස්ත කාර්යක්ෂමතාවය සහතිකව අපේක්ෂා කළ නොහැකි වනු ඇත. මේ තත්වය අමාත්‍යාංශයේ සමස්ත ඵලදායිතාවයට අහිතකර බලපෑමක් එල්ල කරනු ලබන බැවින් අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාවය පහත යෑමේ සම්භාවිතාවක් පවතින බව නිරීක්ෂණය වේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### 6.3.1 දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

**වගුව 6-2 දේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වය**

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | නිමැවුම ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| | **අමාත්‍යාංශ කාර්යාලය** | | | | |
| 01 | රජයේ නිලධාරීන්ගේ නිවාඩු විධිවිධාන | 1 | පැය 06 | 8,500.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 02 | රියදුරන්ගේ කුසලතා සංවර්ධනය | 8 | පැය 12 | 40,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 03 | රාජ්‍ය අංශය සඳහා මානව සම්පත් කළමනාකරණය | 3 | පැය 06 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 04 | දෙමළ භාෂා (විශේෂ කථන පුහුණු පාඨමාලාව) | 1 | පැය 50 | 9,775.00 | දෙමළ භාෂා කථන පුහුණුව |
| 05 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 1 | පැය 06 | 4,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 06 | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | 3 | පැය 04 | 12,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන | 4 | පැය 12 | - | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 08 | වෘත්තීය ජාලගතකරණ වැඩසටහන | 1 | පැය 12 | 31,000.00 | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම විෂයානුකූල කටයුතු සිදු කිරීම |
| 09 | සේවාරම්භක පුහුණුව | 10 | පැය 16 | 19,240.00 | අමාත්‍යාංශය හැඳින්වීම, ආයතන සංග්‍රහය, කාර්යාල ක්‍රම, ලිපි ගොනු කළමනාකරණය, කාර්යාලය තුළ ඵලදායිතාව ඉහළ නැංවීම |
| | **කම්කරු දෙපාර්තමේන්තුව** | | | | |
| 10 | නවක සං.නි. සහ රා.කළ.ස. නිළධරයන් සඳහා පුහුණු වැඩසටහන | 97 | දින 05 | 103,800.00 | නවක නිලධරයන් සඳහා පුහුණුව ලබා දීම |
| 11 | ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් බේරුම්කරුවන් සඳහා පැවති වැඩමුළුව | 78 | දින 01 | 72,870.00 | බේරුම්කරුවන්ගේ භූමිකාව පිළිබඳව දැනුම වර්ධනය වීම |
| 12 | "Access Control System" වැඩමුළුව | 01 | දින 01 | 6,000.00 | නිලධරයන්ගේ දැනුම වර්ධනය වීම |
| 13 | රජයේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා අන්තර්ජාල සාක්ෂරතාව හා සමාජ මාධ්‍ය භාවිතය | 02 | දින 01 | 4,000.00 | නිලධරයන්ගේ දැනුම වර්ධනය වීම |
| 14 | රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් සකස් කිරීම | 02 | දින 01 | 8,000.00 | දෙපාර්තමේන්තු නිලධරයන්ගේ වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කිරීම |
| 15 | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 03 | දින 03 | 30,000.00 | විගණන විමසුම් සඳහා විධිමත් පරිදි පිළිතුරු යැවීමේ කටයුතු පිළිබඳව නිලධරයන්ගේ දැනුම වර්ධනය වීම |
| 16 | රාජ්‍ය සේවයේ බඳවාගැනීම් හා සම්බන්ධ රාජකාරි | 01 | දින 02 | 8,000.00 | බඳවාගැනීම් හා සම්බන්ධ රාජකාරි පිළිබඳව නිලධරයන්ගේ දැනුම වර්ධනය වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 02 | 8,000.00 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව සිදුකිරීම පිළිබඳව නිලධරයන්ගේ දැනුම වර්ධනය වීම |
| 18 | සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධි | 01 | | දේශීය | සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය |
| 19 | නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 01 | | දේශීය | නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය |
| 20 | සංවර්ධන අධ්‍යයනය පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | | දේශීය | සංවර්ධන අධ්‍යයනය පශ්චාත් උපාධි පාඨමාලාව |
| 21 | මානව සම්පත් කළමනාකරණය | 01 | | දේශීය | මානව සම්පත් කළමනාකරණය |
| 22 | රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය | 07 | | දේශීය | රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය |
| 23 | කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | 01 | | දේශීය | කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය |
| 24 | සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පවත්වන ලද නිලධාරි පුහුණු වැඩසටහන් | 68 | | දේශීය | සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ දැනුම වර්ධනය |
| 25 | ආරවුල් බේරුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව (Online) | 40 | දින 10 | දේශීය | ආරවුල් බේරුම්කරණය පිළිබඳ දැනුම වර්ධනය |
| | **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | | | | |
| 27 | කම්කරු නීති හා කාර්මික සබඳතා | 02 | මාස 12 | 96,000 | නිලධරයන්ගේ කම්කරු නීති හා කාර්මික සබඳතා පිළිබඳ දැනුම වර්ධනය |
| 28 | කර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 01 | දින 02 | 8,000 | නිලධරයන්ගේ කර්යාල කළමනාකරණය හා මුදල් රෙතුලාසි දැනුම වර්ධනය |
| 29 | විගණන විමසුම් සඳහා පිළිතුරු | 02 | දින 03 | 20,000 | නිලධරයන්ගේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව වර්ධනය |
| 30 | ලිපිගොනුකරණය | 04 | දින 01 | - | නිලධරයන්ගේ ලිපිගොනුකරණය පිළිබඳ දැනුම වර්ධනය |

### 6.3.2 විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

වගුව 6-3 විදේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වය

| | වැඩසටහනේ නම | පුහුණු කරනලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | |
| 1 | ආසියානු ඵලදායිතා සංවිධානයේ ප්‍රතීතන සහතික මණ්ඩල සඳහා නායකත්ව ඇගයුම් පුහුණු පාඨමාලාව | 01 | දින 07 | | ✓ | ආසියානු ඵලදායිතා සංවිධානයේ ප්‍රතීතන සහතික කිරීමේ පද්ධතිය පිළිබඳ දැනුම |
| 2 | ලෝක ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුනිසි වැඩ පරිසරයක් උදෙසා වන ගෝලීය සංවාද සංසදය | 02 | දින 03 | ✓ | | ලෝක ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුනිසි වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීමේ ලා වර්තමානයේ මතුවන ගැටළු පිළිබඳ දැනුම |
| 3 | ගෝලීය සැපයුම් දාමයන්හී සුනිසි වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම උදෙසා කාර්මික රැස්වීම් | 01 | දින 04 | ✓ | | ගෝලීය සැපයුම් දාමයන්හී සුනිසි වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වන පාලනයෙහි වැදගත් අභියෝගයන් සහ අසාර්ථක වීම් පිළිබඳ දැනුම සහ සුනිසි වැඩ පරිසරයක් ප්‍රවර්ධනය සඳහා වන මූලාරම්භයන් පිළිබඳ දැනුම |
| 4 | ආසියාවේ කම්කරු සංක්‍රමණය පිළබඳ ADBI-OECD-ILO 10 වන වට මේස සාකච්ඡාව | 01 | දින 02 | ✓ | | ආසියානු සංක්‍රමණයන්ගේ වර්තමාන ආසන්නතම ප්‍රවණතා අවසන් ආර්ථිකයන්හි කම්කරු වෙළඳපළ සහ අවස්ථාවන් වෙනස් කිරීම හරහා බැර ප්‍රවාහයන් සම්බන්ධ කරන ආකාරය පිළිබඳ දැනුම |
| 5 | සංක්‍රමණ සහ සංවර්ධන සමුළු ගෝලීය සංසදය -2019 | 01 | දින 05 | | ✓ | මානව සංක්‍රමණ පවත්වා ගැනීමේ හිමිකම්, රාජ්‍ය නියෝජිතායතන සවිමත් කිරීම, සහ හවුල්කාරීත්වයන් සහ සාමූහික කාර්යයන් තුළින් ඉහළ සංවර්ධනයක් සඳහා වන ප්‍රවේශයන් ගැන දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | සංවිධාන විශිෂ්ඨත්වය සඳහා උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය | 01 | දින 06 | | ✓ | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම |
| 7 | ජාත්‍යන්තර සේවා යෝජක සහ සේවාදායක ජාලය හරහා බිම් මට්ටමේ කාර්යයන්ට උපකාරී වීම පිණිස වන ජාත්‍යන්තර ත්‍රෛපාර්ශවික රැස්වීම | 01 | දින 02 | | ✓ | තායිලන්තය, නේපාලය, බංග්ලාදේශය, ලාඕසය, වියට්නාමය, ශ්‍රී ලංකාව, සහ කම්පුචියාව තුළ JILAF ව්‍යාපෘතින්හි සාර්ථකත්වයන් පිළිබඳ අත්දැකීම් හුවමාරුව සහ කලාපයෙහි අනාගත බෙදාගැනීම පිළිබඳ අභියෝග යන් ගැන සාකච්ඡා පැවැත්වීම |
| 8 | පරිසර විගණනය | 01 | දින 25 | | ✓ | පරිසර විගණනය පිළිබඳ දැනුම |
| 9 | නව වැඩ රටාවන් අංකිතකරණය පිළිබඳ ISSA කාර්මික සම්මන්ත්‍රණය: වෘත්තීය අවදානම් ලියාපදිංචිය සහ වැඩසටහන ගැන අවධාරණය සහිතව | 02 | දින 03 | ✓ | | වැඩ පරිසරයෙහි සිදු වන හානි, ඒවා වැළැක්වීම, රැස්කිරීම් දායකත්වයන් සහ අනුගත වීම පිළිබඳ දැනුම |

### 6.3.3 අමාත්‍යාංශයේ කාර්යසාධනයට පුහුණු වැඩසටහන්වල දායකත්වය

අමාත්‍යාංශයේ නිළධාරීන් වෙත ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයක් වේ. නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය ඉන් ප්‍රධානය. සීමිත ප්‍රතිපාදන සහ සම්පත් සමග කටයුතු කරමින් නව මාධ්‍ය හා තාක්ෂණය තම රාජකාරි වෘත්තිය සංවර්ධනය සඳහා භාවිතා කිරීමට නිළධාරීන් පෙළඹවීම තුළින් ඔවුන්ගේ රාජකාරි ඵලදායිතාව ඉහළ නැංවීමට මෙම පුහුණු වැඩසටහන් ඉතා උපකාරී වේ. තවද ආකල්පමය වශයෙන් නිළධාරීන් සංවර්ධනය කිරීම තුළින් හා නිළධාරීන්ගේ භාෂා නිපුණතාවය ඉහළ නැංවීම තුළින් මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීමට නිළධාරීන්ට හැකි වන අතර එය ඵලදායී ආයතනික අන්තර් සම්බන්ධතා ගොඩනැගීමට ද ඉවහල් වේ. ක්‍රමානුකූල මනා අධ්‍යයනයකින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා සඳහා අදාළ නිළධාරීන් නිසි පරිදි යොමු කිරීමෙන් රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල පළපුරුදු තෘප්තිමත් නිළධාරී කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන්වලට යොමු කිරීමේ පොදු අරමුණ වේ.

නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම පහත ප්‍රධාන සංරචකයන් යටතේ සිදු කර ඇත.

- සේවාරම්භක පුහුණු
- නායකත්වය හා ආකල්ප සංවර්ධන පුහුණු
- විෂයානුබද්ධ පුහුණු

අදාළ සංරචක යටතේ නිලධාරීන් වෙත සිදු කරන ලද පුහුණුවීම් පිළිබඳ තොරතුරු ඉහතින් දක්වා ඇති අතර රට තුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ අපේක්ෂිත පරිදි පුහුණු පාඨමාලා සිදු කර ගත නොහැකි විය.






# සත්වන පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

# අනුකූලතා වාර්තාව

වගුව 7-1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | **අනුකූල වේ** | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | |
|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු. රෙ. 135)** | **අනුකූල වේ** |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| **5** | **විගණන විමසුම්** | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | |
| 6.1 | මු. රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2016-9 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු. රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | • රථයේ අලුත්වැඩියාවට අදාළව දේශීය නියෝජිත ආයතනයෙන් ඇස්තමේන්තු ලබා ගැනීම<br>• රථය අපහරණය කිරීම සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ලිඛිතව දැන්වීම<br>• කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙතින් ලැබීමට නියමිත උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම | රථ අපහරණය කිරීමට කඩිනමින් ඉදිරි කටයුතු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |

| | | | |
|---|---|---|---|
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල නොවේ | අමාත්‍යංශය සතුව කල්බදු වාහන නොමැත |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නැත |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | |
| 11.1 | සලසා තිබෙන ප්‍රතිපාදන ඒවායේ සීමාවන්ට ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | |
| 11.2 | මු. රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | |
| 12.1 | සීමවන්ට අනුකූල වීම | අනුකූල වේ | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| **14** | **අග්‍රිම ගිණුම** | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | |

| | | | |
|---|---|---|---|
| 14.3 | මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | |
| **15** | **ආදායම් ගිණුම** | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | |
| 15.3 | මු. රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **16** | **මානව සම්පත කළමනාකරණය** | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | |

| | | | |
|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | සමස්ත කාර්යමණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | |

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
2021 ජූනි
කම්කරු අමාත්‍යාංශය
7 මහල, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට
කොළඹ 05
දුරකථනය: 0112 581 991

**චිත්‍ර නිර්මාණය**
ලතිකා හපුආරච්චි මිය
සහකාර අධ්‍යක්ෂ, පරිසර අමාත්‍යාංශය
බී එල් රෝහණ ජයවීර මයා
කළමනාකරණ සේවා නිලධාරී, කම්කරු අමාත්‍යාංශය

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම - 0112 815 816